# 2

# ජාතික නිෂ්පාදිතය සහ වියදම

## 2.1 සමස්ත නිරීක්ෂණ

ශ්‍රී ලංකා ආර්ථිකය 2012 වසරේ දී වාර්තා කළ සියයට 6.3 ක වර්ධනයට සාපේක්ෂව **2013 වසරේ දී සියයට 7.3 ක වර්ධනයක් අත්කර ගනිමින් ඉහළ වර්ධන මාවතකට නැවත අවතීර්ණ විය.** දේශීය වශයෙන් මෙන්ම විදේශීය වශයෙන් ද දක්නට ලැබුණු අභියෝගාත්මක වාතාවරණය මධ්‍යයේ ශ්‍රී ලංකාව මෙම වර්ධනය අත්කර ගන්නා ලදී. 2012 වසර ආරම්භයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව හඳුන්වා දුන් ස්ථායීකරණ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග 2012 වසරේ දෙසැම්බර් මාසයේ සිට ලිහිල් කිරීම තුළින් ආර්ථික වර්ධනය සඳහා වඩාත් යහපත් වාතාවරණයක් සකස් කළ ද මුදල් ප්‍රතිපත්තියේ බලපෑම ආර්ථිකයට සම්ප්‍රේෂණය වීමට කල්ගත වීම හේතුවෙන් ලිහිල් මුදල් ප්‍රතිපත්තියේ පූර්ණ බලපෑම 2013 වසර තුළ දී මුළුමනින්ම අත්දැකීමට නොහැකි විය. එසේම, උද්ධමනය සහ පොලී අනුපාතික පහළ මට්ටමක පැවැතීම මෙන්ම විනිමය අනුපාතිකය ස්ථාවර මට්ටමක පැවැතීම හේතුවෙන් රට තුළ පැවැති ස්ථාවර සාර්ව ආර්ථික වාතාවරණය ආර්ථික වර්ධනය කෙරෙහි ධනාත්මක ලෙස බලපාන ලදී. තවද, පැවැති යහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් විශේෂයෙන්ම, විදුලිබල උත්පාදනය සඳහා ඉහළ එකතු කළ වටිනාකමකින් යුතු ජල විදුලිබල උත්පාදනය සැලකිය යුතු ලෙස ඉහළ යාම ද මෙම වර්ධනය සඳහා හේතු විය. ඒ අතර, රජයේ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාම ද ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් වීම සඳහා දායක විය. විදේශීය අංශය සම්බන්ධයෙන් බලන කල සංවර්ධිත ආර්ථිකයන්ගේ මන්දගාමී වර්ධනය වසරේ ප්‍රථම භාගයේ දී මෙරට ආර්ථිකය කෙරෙහි අයහපත් ලෙස බලපානු ලැබුව ද ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්ත වන ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය ඇතුළු සංවර්ධිත ආර්ථික ක්‍රමිකව යථා තත්ත්වයට පත්වීමත් සමග වසරේ දෙවන භාගයේ දී විදේශීය ඉල්ලුම යහපත් වීම ආර්ථික වර්ධනය ඉහළ නැංවීමට දායක විය.

**නිෂ්පාදන ප්‍රවේශයේ ඇස්තමේන්තුවලට අනුව 2013 වසරේ ආර්ථික වර්ධනය කෙරෙහි ඉහළම දායකත්වය සේවා අංශය විසින් ලබා දී ඇත.** ආර්ථික ක්‍රියාකාරකම්හි පුළුල් වීමත් සමග ප්‍රවාහන සේවා සඳහා වූ ඉල්ලුම ඉහළ යාම හේතුවෙන් 2013 වසරේ දී සේවා අංශයෙහි වර්ධනය කෙරෙහි විශාලතම දායකත්වය ප්‍රවාහනය සහ සන්නිවේදනය උප අංශය මගින් සපයනු ලැබීය. විදේශීය මෙන්ම දේශීය වෙළෙඳ කටයුතුවල එකතු කළ අගය වර්ධනය වීම හේතුවෙන් තොග සහ සිල්ලර වෙළෙඳ කටයුතු ද 2013 වසර තුළ දී වැඩිදියුණු විය. විශේෂයෙන්ම, වසරේ දෙවන භාගයේ දී විදේශීය ඉල්ලුම වර්ධනය වීම සහ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම ද වෙළෙඳ කටයුතුවල වර්ධනය සඳහා යහපත්ව දායක විය. තවද, මූල්‍ය සේවා වර්ධනය 2012 වසරට වඩා අඩු වේගයකින් සිදු වුවද, සේවා අංශයේ වර්ධනය සඳහා තවදුරටත් දායක විය. මේ අතරතුර දී, කාර්මික අංශය 2013 වසරේ දී ද ඉහළම ආංශික වර්ධනය වාර්තා කරමින් සිය ඉහළ වර්ධන ගම්‍යතාවය

**2.1 සංඛ්‍යා සටහන**

**කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය සහ වර්ධනය (2002 ස්ථාවර මිල අනුව)**


| අංශය | වෙනස්වීමේ අනුපාතය (%) | | ද.දේ.නි. හි වෙනස්වීමේ දායකත්වය (%) | | ද.දේ.නි. ට දායකත්වය (%) | |
|---|---|---|---|---|---|---|
| | 2012 (අ) | 2013 (ආ) | 2012 (අ) | 2013 (ආ) | 2012 (අ) | 2013 (ආ) |
| **කෘෂිකාර්මික** | **5.2** | **4.7** | **9.2** | **7.2** | **11.1** | **10.8** |
| **1 කෘෂිකර්මය, පශු සම්පත් සහ දැව ආදී වන ද්‍රව්‍ය** | **4.7** | **4.5** | **7.3** | **6.0** | **9.7** | **9.5** |
| 1.1 තේ | 0.3 | 3.6 | 0.0 | 0.5 | 0.9 | 0.9 |
| 1.2 රබර් | - 6.0 | - 9.1 | - 0.2 | - 0.3 | 0.2 | 0.2 |
| 1.3 පොල් | 6.0 | - 16.1 | 1.0 | - 2.3 | 1.0 | 0.8 |
| 1.4 සුළු අපනයන බෝග | - 5.0 | 8.5 | - 0.3 | 0.4 | 0.4 | 0.4 |
| 1.5 වී | - 1.6 | 19.5 | - 0.4 | 3.8 | 1.4 | 1.6 |
| 1.6 පශු සම්පත් | 6.4 | 6.3 | 0.8 | 0.7 | 0.8 | 0.8 |
| 1.7 අනෙකුත් ආහාර බෝග | 9.1 | 4.3 | 5.1 | 2.2 | 3.7 | 3.6 |
| 1.8 වතු සංවර්ධනය | 8.8 | 3.3 | 0.4 | 0.1 | 0.3 | 0.3 |
| 1.9 දැව සහ වන සම්පත් | 5.4 | 5.0 | 0.5 | 0.4 | 0.6 | 0.6 |
| 1.10 වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන | 6.4 | 7.6 | 0.4 | 0.4 | 0.4 | 0.4 |
| **2 ධීවර කර්මාන්තය** | **9.3** | **6.2** | **1.9** | **1.2** | **1.3** | **1.3** |
| **කාර්මික** | **10.3** | **9.9** | **47.5** | **41.5** | **30.4** | **31.1** |
| **3 පතල් සහ කැණීම්** | **18.9** | **11.5** | **7.4** | **4.4** | **2.8** | **2.9** |
| **4 නිෂ්පාදන කර්මාන්ත** | **5.2** | **7.5** | **14.3** | **17.6** | **17.1** | **17.1** |
| 4.1 සැකසුම් (තේ, රබර් සහ පොල්) | 6.5 | 0.6 | 0.6 | 0.0 | 0.6 | 0.5 |
| 4.2 කර්මාන්තශාලා නිෂ්පාදන | 5.2 | 7.9 | 13.0 | 16.9 | 15.5 | 15.6 |
| 4.3 ගෘහ කර්මාන්ත | 4.6 | 5.1 | 0.8 | 0.7 | 1.0 | 1.0 |
| **5 විදුලිය, ගෑස් සහ ජලය** | **4.2** | **10.3** | **1.6** | **3.4** | **2.4** | **2.4** |
| 5.1 විදුලිය | 4.3 | 11.3 | 1.4 | 3.3 | 2.1 | 2.2 |
| 5.2 ගෑස් | 5.1 | 1.6 | 0.1 | 0.0 | 0.2 | 0.2 |
| 5.3 ජලය | 1.0 | 3.8 | 0.0 | 0.1 | 0.1 | 0.1 |
| **6 ඉදිකිරීම්** | **21.6** | **14.4** | **24.2** | **16.1** | **8.1** | **8.7** |
| **සේවා** | **4.6** | **6.4** | **43.3** | **51.3** | **58.6** | **58.1** |
| **7 තොග සහ සිල්ලර වෙළෙඳාම** | **3.7** | **5.5** | **13.7** | **17.4** | **23.0** | **22.7** |
| 7.1 ආනයන වෙළෙඳාම | 1.0 | 2.9 | 1.4 | 3.2 | 8.1 | 7.8 |
| 7.2 අපනයන වෙළෙඳාම | 0.8 | 6.7 | 0.5 | 3.6 | 3.9 | 3.9 |
| 7.3 දේශීය වෙළෙඳාම | 6.8 | 6.9 | 11.8 | 10.6 | 11.1 | 11.0 |
| **8 හෝටල් සහ ආපනශාලා** | **20.2** | **22.3** | **1.9** | **2.1** | **0.7** | **0.8** |
| **9 ප්‍රවාහනය සහ සන්නිවේදනය** | **6.2** | **9.4** | **14.0** | **18.5** | **14.3** | **14.6** |
| 9.1 ප්‍රවාහනය | 6.0 | 9.4 | 11.1 | 15.2 | 11.7 | 12.0 |
| 9.2 භාණ්ඩ මෙහෙයවීම - වරාය සහ සිවිල් ගුවන් සේවා | 5.7 | 3.1 | 0.6 | 0.3 | 0.7 | 0.7 |
| 9.3 තැපැල් සහ විදුලි සංදේශ | 7.9 | 11.4 | 2.3 | 3.0 | 1.9 | 2.0 |
| **10 බැංකු, රක්ෂණ සහ දේපළ වෙළෙඳාම් යනාදිය** | **6.7** | **5.9** | **9.4** | **7.2** | **8.9** | **8.7** |
| **11 නිවාස අයිතිය** | **1.7** | **2.9** | **0.7** | **1.0** | **2.5** | **2.4** |
| **12 රාජ්‍ය සේවා** | **1.4** | **2.8** | **1.6** | **2.7** | **6.8** | **6.5** |
| **13 පෞද්ගලික සේවා** | **5.5** | **7.3** | **2.0** | **2.3** | **2.3** | **2.3** |
| **දළ දේශීය නිෂ්පාදිතය** | **6.3** | **7.3** | **100.0** | **100.0** | **100.0** | **100.0** |
| විදේශීය ශුද්ධ සාධක ආදායම | - 97.4 | - 42.1 | | | | |
| **දළ ජාතික නිෂ්පාදිතය** | **5.3** | **6.5** | | | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

තවදුරටත් පවත්වා ගැනීමට සමත් විය. කර්මාන්ත අංශයේ උප අංශයක් වන ඉදිකිරීම් උප අංශය 2013 වසරේ දී ද ඉහළ අගයකින් අඛණ්ඩව වර්ධනය විය. කෙසේ නමුත්, එම වර්ධනය 2012 වසරේ දී වාර්තා වූ සැලකිය යුතු ඉහළ වර්ධනය හා සසඳන කල මන්දගාමීත්වයක් පෙන්නුම් කරයි. නිෂ්පාදන කර්මාන්ත උප අංශය ද වසරේ දෙවන භාගයේ දී දැකිය හැකි වූ විදේශීය ඉල්ලුම ඉහළ යාමෙහි දායකත්වය පිළිබිඹු කරමින් 2013 වසරේ දී යහපත් වර්ධනයක් වාර්තා කළේය. විදුලිබල උත්පාදනය සඳහා ප්‍රධාන වශයෙන් ජල විදුලිබලය යොදා ගැනීම හේතුවෙන් විදුලිබල උත්පාදනයේ එකතු කළ අගය ඉහළ යාම කර්මාන්ත අංශයේ සැලකිය යුතු වර්ධනය සඳහා දායක විය. මේ අතර, පොල් සහ රබර් නිෂ්පාදන පහළ වැටීම

**2.1 රූප සටහන** **වාර්ෂික වර්ධන අනුපාතිකය**




හමුවේ වුව ද වී, අනෙකුත් ආහාර බෝග සහ ධීවර උප අංශවල ඇති වූ ප්‍රසාරණය හේතුවෙන් කෘෂිකාර්මික අංශය තවදුරටත් ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කළේය.

වියදම් ප්‍රවේශයේ ඇස්තමේන්තුවලට අනුව **මූර්ත වශයෙන් පරිභෝජනය සහ ආයෝජනය යන අංශ දෙකෙහිම ඉහළ යාම දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.) වර්ධනයට දායක විය.** කෙසේ නමුත්, රාජ්‍ය අංශයේ පරිභෝජන වියදම පසුගිය වසරට වඩා වැඩි වේගයකින් වර්ධනය වුව ද පෞද්ගලික අංශයේ පරිභෝජන වියදමේ වර්ධනය පහළ වැටීම සමස්ත පරිභෝජන වියදමෙහි වර්ධනය අඩු වීමට හේතු විය. මේ අතර, ආයෝජක විශ්වාසය ඉහළ යාම පිළිබිඹු කරමින් ආයෝජන වියදම සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. විදේශීය ඉල්ලුම වර්ධනය වීමත් සමගම මූර්ත වශයෙන් භාණ්ඩ හා සේවා අපනයන සාපේක්ෂ වශයෙන් ඉහළ වර්ධනයක් අත්කර ගැනීම සහ ඒ අතරතුර දී මූර්ත වශයෙන් භාණ්ඩ හා සේවා ආනයන ආන්තික ලෙස පහළ වැටීම ශුද්ධ විදේශ ඉල්ලුම ප්‍රසාරණය වීමට හේතු විය.

**ද.දේ.නි. ට විදේශීය ශුද්ධ සාධක ආදායම (වි.ශු.සා.ආ.) ගැලපීමෙන් ගණනය කරනු ලබන දළ ජාතික නිෂ්පාදිතය (ද.ජා.නි.) 2012 වසරේ දී අත්කරගත් සියයට 5.3 ක වර්ධනයට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 6.5 කින් වර්ධනය විය.** ද.ජා.නි. හි දැකිය හැකි වූ මෙම අඩු වර්ධනය ගෙවුම් තුලනයේ ආදායම් ගිණුමෙහි පෙන්නුම් කළ ගෙවීම් ඉහළ යාම තුළින් පිළිබිඹු කරයි. භාණ්ඩාගාර බැඳුම්කර හා දිගුකාලීන ණය සඳහා රජය විසින් කරන ලද පොලී ගෙවීම් ඉහළ මට්ටමක පැවැතීම සහ මහ බැංකුව හා අනෙකුත් මූල්‍ය ආයතන විසින් කරන ලද පොලී ගෙවීම් හේතුවෙන් ආදායම් ගිණුමෙහි ගෙවීම් ඉහළ අගයක් ගන්නා ලදී. තවද, විදේශීය වෙළෙඳපොළවල පැවැති අඩු පොලී අනුපාතික හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ සංචිත සහ ස්ථාවර ආදායම් සුරැකුම්පත් සඳහා ලැබුණු ආදායම් බොහෝදුරට නොවෙනස්ව පැවැතුණි. මේ අතර, අනේවාසිකයන්ගේ ලාභාංශවලින් සැලකිය යුතු කොටසක් රට තුළම යළි ආයෝජනය කළ අතර එය ආදායම් ගිණුමෙහි ලාභාංශවලට අදාළ ගලා යාම් සම්බන්ධයෙන් වන බලපෑම අඩු වීමට හේතු විය.

2012 වසරේ දී වාර්තා කළ රුපියල් 372,814 ක් වූ **ඒක පුද්ගල ද.දේ.නි. ට සාපේක්ෂව 2013 වසරේ දී ඒක පුද්ගල ද.දේ.නි. රුපියල් 423,467 ක් විය.** 2013 වසරේ දී ද.දේ.නි. ගම්‍ය මිල අවධමනකය සියයට 6.7 කින් පමණක් වර්ධනය වීම සහ ඒක පුද්ගල ද.දේ.නි. සියයට 13.6 කින් වර්ධනය වීම මගින් මූර්ත ආදායම්හි වැඩිවීම පෙන්නුම් කෙරෙයි. 2013 වසරේ දී ඒක පුද්ගල ද.දේ.නි. එ.ජ. ඩොලර් 3,280 ක් දක්වා වර්ධනය වූ අතර එමගින් 2016 වසරේ දී ඒක පුද්ගල ආදායම් ඉලක්කය වන එ.ජ. ඩොලර් 4,000 අත්කර ගැනීමට ඇති හැකියාව පෙන්නුම් කරයි.

වෙළෙඳපොළ මිල ගණන් අනුව **ආර්ථිකයේ සමස්ත නිමැවුම පිළිබිඹු කරන පවත්නා මිල අනුව ගණනය කරනු ලබන ද.දේ.නි. පසුගිය වසරේ වාර්තා කරන ලද සියයට 15.8 ක වර්ධනයට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 14.5 ක අඩු වර්ධනයක් වාර්තා කළේය.** මූර්ත ද.දේ.නි. 2013 වසරේ දී ඉහළ අගයක් ගැනීම හමුවේ වෙළෙඳපොළ මිල මත ගණනය කරනු ලබන ද.දේ.නි. පහළ අගයක් ගැනීම මගින් ද.දේ.නි. හි ගම්‍ය මිල අවධමනකය තුළින් පිළිබිඹු කරන පරිදි ආර්ථිකය පුරා මිල මට්ටම් ඉහළ යාමේ වේගයෙහි සිදු වූ අඩුවීම පෙන්නුම් කරයි. තවදුරටත්, දේශීය ආර්ථිකයේ සමස්ත වටිනාකම රුපියල් බිලියන 8,674 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය එ.ජ. ඩොලර් බිලියන 67 කට සමාන වෙයි.

2012 වසරේ දැකිය හැකි වූ ප්‍රවණතාව තවදුරටත් **පවත්වා ගනිමින් ද.දේ.නි. හි ප්‍රතිශතයක් වශයෙන් දේශීය ඉතුරුම් සියයට 20.0 ක් දක්වා වර්ධනය විය.** ආනයනවල දැකිය හැකි වූ අඩු වර්ධනය හේතුවෙන් වෙළෙඳ ශේෂයේ හිඟය අඛණ්ඩව අඩු වීම මගින් ඉතුරුම් ඉහළ අගයක් ගැනීම පෙන්නුම් කෙරෙයි. දේශීය ඉතුරුම් ඉහළ යාමට පෞද්ගලික අංශයේ ඉතුරුම් ඉහළ යාම මෙන්ම රජයේ නිර්-ඉතුරුම් පහළ යාම ද හේතු විය. රජය වර්තන වියදම් අඩු කිරීම සඳහා අනුගමනය කළ විවිධ ක්‍රියාමාර්ග හේතුවෙන් රජයේ වර්තන ගිණුමේ හිඟය අඩු විය. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් 2012 වසරේ දී පැවැති අගයට වඩා අඩු වේගයකින් වුව ද අඛණ්ඩව වර්ධනය වීම ජාතික ඉතුරුම් වර්ධනය වීමට හේතු විය. කෙසේ වුවත්, සාධක ආදායම් ගලා යාම වැඩි වීම නිසා

වි.ශු.සා.ආ. පහළ වැටීම ජාතික ඉතුරුම්වල වර්ධනය අඩු වීමට හේතු විය. මේ අතර, විදේශීය අංශය මත ඇති රැඳියාව පෙන්නුම් කරන සම්පත් පරතරය 2013 වසරේ දී තවදුරටත් අඩු විය.

## 2.2 ආංශික නිමැවුම, ප්‍රතිපත්ති, ආයතනික පහසුකම් සහ ගැටළු


### කෘෂිකාර්මික අංශය

**කෘෂිකාර්මික අංශය 2012 වසරේ දී වාර්තා කළ සියයට 5.2 ක වර්ධනයට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 4.7 කින් වර්ධනය විය.** ඒ අනුව, 2013 වසරේ ද.දේ.නි. සඳහා කෘෂිකාර්මික අංශයේ දායකත්වය සියයට 10.8 ක් විය. මෙම වර්ධනය සඳහා වී, තේ සහ අනෙකුත් ආහාර බෝග ඇතුළු උප අංශ බොහොමයක් ධනාත්මක දායකත්වයක් දැක්වීය. 2013 වසරේ දී, මූලික වශයෙන් වී උප අංශයේ එකතු කළ අගය සියයට 19.5 කින් වර්ධනය වීම වැදගත් වන අතර, මහ කන්නයේ දී සිදුවූ වගා හානිය හමුවේ වර්ධනය මන්දගාමී වුවද වසරේ දෙවන භාගයේ දී යල කන්නයේ සරුසාර අස්වැන්න සමග සමස්ත අස්වැන්න ඉහළ යාම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, වසරේ තුන්වන කාර්තුවේ දී තේ නිෂ්පාදනය පහළ වැටීම හමුවේ වුවද මෙතෙක් වාර්තා වූ ඉහළම වාර්ෂික තේ නිෂ්පාදනය අත්කර ගනිමින් සියයට 3.6 කින් වර්ධනය විය. එසේම, වසරේ ප්‍රථම භාගයේ දී උස්බිම් බෝග නිෂ්පාදනයේ සිදුවූ පහළ යාම හේතුවෙන් කෘෂිකාර්මික අංශයට විශාලතම දායකත්වය දක්වනු ලබන අනෙකුත් ආහාර බෝග උප අංශයේ මන්දගාමී වීමක් දක්නට ලැබුණි. එමෙන්ම, සුළු අපනයන බෝග, පශු සම්පත්, වතු සංවර්ධනය, දැව සහ වන සම්පත් සහ වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදනයන් ද කෘෂිකාර්මික අංශයේ වර්ධනයට ධනාත්මකව දායක විය. කෙසේ වුවද, අයහපත් කාලගුණික තත්ත්වයන් මූලික කොටගෙන රබර් සහ පොල් නිෂ්පාදනයේ පහත වැටීමක් පෙන්නුම් කළේය. තවද, අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් විශේෂයෙන්ම, වසරේ දෙවන කාර්තුවේ දී ධීවර කර්මාන්ත උප අංශයේ වර්ධනය පහළ යාම එම අංශයේ ප්‍රසාරණය සියයට 6.2 කට සීමා වීමට හේතු විය.

### වී

**වසරේ මුල් භාගයේ දී පැවැති අයහපත් කාලගුණ තත්ත්වයන්ගේ බලපෑම මත සැලකිය යුතු වගා හානියක් සිදු වුවද 2013 වසර තුළ සමස්ත වී නිෂ්පාදනය කැපී පෙනෙන ලෙස වර්ධනය විය.** 2012 වසරට සාපේක්ෂව 2013 වසරේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 4.62 ක් දක්වා සියයට 20 කින් වර්ධනය වී තිබේ. සමස්ත නිෂ්පාදනයෙන්, 2012/13 මහ කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 2.85 ක් දක්වා සියයට 4.8 කින් වර්ධනය වූ අතර 2013 යල කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 1.77 ක් දක්වා සියයට 57 කින් වර්ධනය විය. හිතකර මට්ටමක පැවැති ඊසානදිග මෝසම් වර්ෂාව හේතුවෙන් ජලාශවල ජල මට්ටම ඉහළ යෑම හා රජය විසින් වී මිල ඉහළ දැමීම හේතුවෙන් වගාකරුවන් 2013 යල කන්නයේ දී ඉහළ බිම් ප්‍රමාණයක් අස්වැද්දීම යල කන්නයේ වී නිෂ්පාදනය කැපී පෙනෙන ලෙස ඉහළ යාමට හේතු විය. 2013 වසර තුළ දී, වී නිෂ්පාදනයේ ඉහළ ම වර්ධනය (සියයට 108) වයඹ පළාත තුළින් වාර්තා විය. මේ අතර, 2012/13 මහ කන්නය තුළ නැගෙනහිර පළාතෙන් වැඩි වගා හානියක් වාර්තාවීම හේතුවෙන් එම පළාතේ වී නිෂ්පාදනය සියයට 2 කින් පහළ ගියේය. මහ කන්නය තුළ පැවැති අහිතකර කාලගුණ තත්ත්වයන්ගේ බලපෑම පිළිබිඹු කරමින් 2012/13 මහ කන්නයේ වී ඵලදාව 2011/12 මහ කන්නයේ පැවැති හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම් 4,444 සිට හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම් 4,281 ක් දක්වා පහළ බැස තිබේ. කෙසේ වෙතත්, 2013 යල කන්නය තුළ දී වී ඵලදාව 2012 යල කන්නයේ පැවැති හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම් 4,145 සිට හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම් 4,408 ක් දක්වා වර්ධනය වීමට එම කන්නය පුරා පැවැති හිතකර කාලගුණ තත්ත්වයන් බලපා තිබේ.

2.2 රූප සටහන — සහල්: සැපයුම සහ ඉල්ලුම




**2013 වසරේ දී වී මිල ගණන් රජයේ ප්‍රතිපත්ති වෙනස්කම් හා වෙළෙඳපොළ අපේක්ෂාවන් වලට ප්‍රතිචාර දක්වමින් විචලනය විය.** 2012 වසරේ පළමු භාගයේ පැවැති වී මිල ගණන් හා සැසඳීමේ දී 2013 වසරේ පළමු භාගය තුළ දී වී මිල ඉහළ මට්ටමක පැවැතීමට වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ රජය ඉහළ මිලකට වී මිලදී ගැනීමත්, 2012 දෙසැම්බර් හා 2013 ජනවාරි මස දී පැවැති අධික වර්ෂාපතනයේ හා

**2.2 සංඛ්‍යා සටහන** වී වගා අංශය පිළිබඳ සංඛ්‍යා

| අයිතමය | ඒකකය | 2012 (අ) | | | 2013 (ආ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | මහ | යල | එකතුව | මහ | යල | එකතුව |
| වපුරන ලද බිම් ප්‍රමාණය දළ වශයෙන් | හෙක්ටයාර දහස් | 702 | 365 | 1,067 | 780 | 448 | 1,227 |
| අස්වැන්න නෙලා ගන්නා ලද දළ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 685 | 305 | 990 | 742 | 447 | 1,188 |
| අස්වැන්න නෙලා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 611 | 272 | 883 | 665 | 403 | 1,067 |
| නිෂ්පාදනය | මෙ.ටො.දහස් | 2,717 | 1,129 | 3,846 | 2,846 | 1,774 | 4,621 |
| | බුසල් දහස් | 130,212 | 54,107 | 184,319 | 136,393 | 85,042 | 221,435 |
| ඵලදාව (ඇ) | හෙක්ටයාරයට කි.ග්‍රෑ. | 4,444 | 4,145 | 4,353 | 4,281 | 4,408 | 4,329 |
| දෙන ලද ණය ප්‍රමාණය | රුපියල් මිලියන | 3,720 | 1,817 | 5,537 | 3,150 | 1,196 | 4,346 |
| සහල් ආනයනය | මෙ.ටො.දහස් | - | - | 36 | - | - | 23 |
| සහල් ආනයනයට සමාන වී ප්‍රමාණය | මෙ.ටො.දහස් | - | - | 52 | - | - | 33 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) අස්වනු කැපීමේ සමීක්ෂණයන්ගෙන් රැස්කළ දත්ත පදනම් කොට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද සංඛ්‍යා තොරතුරු උපයෝගී කරගෙන මහ සහ යල කන්න සඳහා වූ හෙක්ටයාරයක ඵලදාව ගණනය කර ඇත. මුළු නිෂ්පාදනය අස්වැන්න නෙලා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය ඵලදාව ගණනය කෙරේ.

මූලයන් : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ගංවතුර තර්ජනයේ බලපෑම මත ඇති වූ වගා හානිවල බලපෑමත් හේතු විය. කෙසේ වෙතත්, 2013 වසරේ යල කන්නය තුළ ඉහළ මට්ටමක වී අස්වැන්නක් වාර්තා වීම හේතුවෙන් 2013 වසරේ දෙවන භාගය තුළ දී වී මිල ගණන් පහළ ගියේය. එසේ ම, වී අලෙවි මණ්ඩලය 2012 වසරේ දී මෙට්‍රික් ටොන් 126,262 ක වී අස්වනු මිලදී ගනු ලැබූ අතර, 2013 වසරේ දී එය මෙට්‍රික් ටොන් 233,366 ක් දක්වා ඉහළ යාම, විශේෂයෙන් ම අස්වනු නෙළන සමයේ දී වී මිල ගණන් ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමට දායක විය.

### තේ

**2013 වසරේ මෙතෙක් වාර්තා වූ ඉහළ ම තේ නිෂ්පාදන මට්ටම කරා ළඟාවීමට තේ වගා කරන සෑම ප්‍රදේශයක ම පැවැති යහපත් කාලගුණ තත්ත්වයත්, කොළඹ තේ වෙන්දේසිවල වාර්තා වූ ඉහළ තේ මිල ගණන් හා අඛණ්ඩව ඉහළ මට්ටමක පැවැති අපනයන ඉල්ලුමත් උපකාරී විය.** ඒ අනුව, 2013 වසරේ තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 340.2 ක් දක්වා සියයට 3.6 කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2013 වසරේ තේ නිෂ්පාදනයේ ඉහළ යාම සිදුවූයේ පැවැති වියළි කාලගුණ තත්ත්වයන්ගේ බලපෑම මත 2012 වසරේ දී පහළ ගිය තේ නිෂ්පාදනයට සාපේක්ෂවයි. 2013 වසරේ තේ නිෂ්පාදනයේ වැඩි ම වර්ධන වේගය මැදි බිම් තේ නිෂ්පාදනයෙන් (සියයට 6.8 ක්) වාර්තා වූ අතර, පහත් බිම් තේ සියයට 3.1 කින් හා උස් බිම් තේ සියයට 2.6 කින් ද වර්ධනය විය. 2013 වසරේ පහත් බිම් තේ නිෂ්පාදනය මෙතෙක් එම අංශය තුළ වාර්තාගත වූ ඉහළම නිෂ්පාදන මට්ටම විය. සමස්ත ජාතික තේ නිෂ්පාදනයට ඉහළ ම දායකත්වයක් ලබා දෙමින් වැඩි වශයෙන් පහත් බිම් ප්‍රදේශවල වගා කරන කුඩා තේ වතු අංශයේ තේ නිෂ්පාදනය ද 2012 වසරේ පැවැති කිලෝ ග්‍රෑම් මිලියන 234 සිට 2013 වසරේ දී කිලෝ ග්‍රෑම් මිලියන 248 ක් දක්වා ඉහළ ගියේය. මේ සඳහා පැවැති හිතකර කාලගුණ තත්ත්වයන් මෙන් ම, වසර තුළ දී තේ දලු මිල ගණන් ඉහළ මට්ටමක පැවැතීම හේතුවෙන් පොහොර භාවිතය සඳහා උනන්දුවීම ද බලපා තිබේ. මේ අතර, විශේෂයෙන්ම තෙවන කාර්තුව තුළ උස් බිම් හා මැදි බිම් තේ වගා කරන ප්‍රදේශවල පැවැති අධික වර්ෂාපතනය තේ නිෂ්පාදනයේ වර්ධනය යම්තාක් දුරකට අඩාල කිරීමට බලපෑවේය.

**2.3 සංඛ්‍යා සටහන** කෘෂිකර්මාන්ත නිෂ්පාදන දර්ශක (2007-2010=100) (අ)

| අයිතමය | 2012 (ආ) | 2013 (ඇ) | වර්ධන වේගය (%) 2012/13 |
|---|---|---|---|
| කෘෂිකාර්මික සහ මත්ස්‍ය | 116.7 | 122.1 | 4.7 |
| 1. කෘෂිකර්මය | 110.6 | 115.5 | 4.5 |
| 1.1 කෘෂිකාර්මික බෝග | 109.0 | 113.0 | 3.6 |
| තේ | 105.4 | 109.2 | 3.6 |
| රබර් | 113.3 | 97.2 | -14.2 |
| පොල් | 103.8 | 88.7 | -14.5 |
| වී | 102.8 | 123.6 | 20.1 |
| අනෙකුත් බෝග | 118.2 | 125.4 | 6.1 |
| 1.2 පශු සම්පත් | 122.8 | 135.6 | 10.4 |
| 2. මත්ස්‍ය | 145.7 | 153.7 | 5.5 |

(අ) නිෂ්පාදන දර්ශකය ගණනය කිරීමේදී පදනම් අගයන් ලෙස භාවිත කළ 1997 2000 කාලපරිච්ඡේදය තුළ සාමාන්‍ය අගයන් වෙනුවට මෙම වසර තුළදී 2007-2010 කාලපරිච්ඡේදය තුළ සාමාන්‍ය අගයන් පදනම් අගයන් ලෙස භාවිත කර ඇත.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

**2013 වසර පුරා ම කොළඹ තේ වෙන්දේසියේ උස් බිම්, මැදි බිම් හා පහත් බිම් තේවල සාමාන්‍ය මිල ගණන් 2012 වසරේ පැවැති මිල ගණන් වලට වඩා ඉහළ මට්ටමක පැවැතුණි.** CTC හා හරිත තේ වැනි තේ වර්ගවල ගෝලීය නිෂ්පාදනයන්හි අතිරික්තයක් පැවැතිය ද, සාම්ප්‍රදායික කළු තේ නිෂ්පාදනය 2013 වසර තුළ සාපේක්ෂ වශයෙන් ස්ථාවරව පැවැතුණි. ශ්‍රී ලංකාව ලෝකයේ විශාලතම සාම්ප්‍රදායික කළු තේ අපනයනකරු වශයෙන් එම තේ සඳහා පැවැති ඉහළ ඉල්ලුමේ ප්‍රතිලාභය ලබා ගැනීමට හැකි වූ අතර, තේ වෙන්දේසිය තුළ වාර්තා වූ ඉහළ මිල ගණන් තුළින් එම තත්ත්වය පිළිබිඹු විය. උස් බිම්, මැදි බිම් හා පහත් බිම් තේ මිල ගණන් කිලෝ ග්‍රෑමයකට පිළිවෙළින් සියයට 7 කින්, සියයට 18 කින් හා සියයට 15 කින් රුපියල් 406 ක්, රුපියල් 416 ක් හා රුපියල් 471 ක් දක්වා ඉහළ ගියේය. මෙම තත්ත්වය, වැටුප් හා විදුලි ගාස්තු ඉහළ යාම මගින් ඉහළ ගිය නිෂ්පාදන පිරිවැයට මුහුණ දීම සඳහා තේ නිෂ්පාදකයින්ට උපකාරී විය.

## රබර්

**2013 වසරේ සමස්ත රබර් නිෂ්පාදනය 2012 වසරට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 130,421 ක් දක්වා සියයට 14.2 කින් පහළ වැටුණි.** නිෂ්පාදනයේ සැලකිය යුතු පහළ යාම කෙරෙහි විශේෂයෙන් ම පළමු මාස නවය තුළ පැවැති අධික වර්ෂාපතනය බලපෑ අතර, එය රබර් කිරි නිස්සාරණය කරනු ලබන දින ගණන් පහළ යාමට හේතු විය. විශේෂයෙන් ම, නිෂ්පාදනයේ සීඝ්‍ර අඩුවීම පැවැති මැයි, ජුනි හා ජුලි මාසවල රබර් කිරි නිස්සාරණය කරනු ලැබූ සාමාන්‍ය දින ගණන කැපී පෙනෙන ලෙස අඩු විය. කෙසේ වෙතත්, හතරවන කාර්තුව තුළ පැවැති හිතකර කාලගුණ තත්ත්වයන්ගේ බලපෑම මත රබර් නිෂ්පාදනය ඉහළ ගියේය. සමස්ත රබර් නිෂ්පාදනයේ පහළ යාම තුළ, ලේටෙක්ස් ක්‍රේප් රබර් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 15,373 ක් දක්වා සියයට 58 කින් පහළ යාම කැපී පෙනුණි. කෙසේ වෙතත්, ෂීට් රබර් නිෂ්පාදනය වසරේ අවසාන කාල පරිච්ඡේදය තුළ දී වැඩිවීම හේතුවෙන් මෙට්‍රික් ටොන් 62,800 ක් දක්වා සියයට 6 කින් ඉහළ යන ලදී. ස්වභාවික රබර් අපනයන තුළ ප්‍රධාන අපනයනයක් වන ලේටෙක්ස් ක්‍රේප් රබර් අපනයනය 2013 වසර තුළ දී මෙට්‍රික් ටොන් 23,580 ක් දක්වා සියයට 37 කින් අඩු විය. සමස්ත රබර් නිෂ්පාදනයෙන් සියයට 82 ක් (මෙට්‍රික් ටොන් 107,259) ක් දේශීයව පරිභෝජනය කළ අතර එය 2012 වසරේ දී සියයට 72 (මෙට්‍රික් ටොන් 110,038) ක් ලෙස පැවතුණි.

**ගෝලීය ස්වාභාවික රබර් මිල ගණන්වල පහළ යාමේ ප්‍රවණතාවය ශ්‍රී ලංකාවේ රබර් මිල ගණන් පහළ යෑමට ද බලපෑවේය.** 2013 වසරේ දී කොළඹ

**2.4 සංඛ්‍යා සටහන** — **ප්‍රධාන කෘෂි බෝගවල උපනතීන්**

| අයිතමය | ඒකකය | 2012 (අ) | 2013 (ආ) |
|---|---|---|---|
| 1. තේ | | | |
| 1.1 නිෂ්පාදනය (ඇ) | කි.ග්‍රෑ. මිලියන | 328.4 | 340.2 |
| 1.2 මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 222 | 222 |
| 1.3 දළු කැඩීම සිදුකරන ලද බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 185 | 184 |
| 1.4 නිෂ්පාදන පිරිවැය (ඈ) | රුපියල්/කි.ග්‍රෑ. | 390.89 | 418.22 |
| 1.5 සාමාන්‍ය මිල | | | |
| - කොළඹ වෙන්දේසිය | රුපියල්/කි.ග්‍රෑ. | 392.4 | 445.83 |
| - අපනයන (නැ.වි.ස.) | රුපියල්/කි.ග්‍රෑ. | 563.94 | 623.91 |
| 1.6 නැවත වගා කිරීම | හෙක්ටයාර | 1,268 | 1558 |
| 1.7 අළුතින් වගා කිරීම | හෙක්ටයාර | 280 | 263 |
| 1.8 එකතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 0.9 | 0.9 |
| 2. රබර් | | | |
| 2.1 නිෂ්පාදනය | කි.ග්‍රෑ. මිලියන | 152.0 | 130.4 |
| 2.2 මුළු වගා බිම් ප්‍රමාණය (ඊ) | හෙක්ටයාර දහස් | 131 | 132 |
| 2.3 කිරි කපන ලද බිම් ප්‍රමාණය (ඊ) | හෙක්ටයාර දහස් | 104 | 107 |
| 2.4 නිෂ්පාදන පිරිවැය | රුපියල්/කි.ග්‍රෑ. | 136.00 | 150.00 |
| 2.5 සාමාන්‍ය මිල | | | |
| - කොළඹ වෙන්දේසිය (ආර්.එස්.එස්.නො.1) | රුපියල්/කි.ග්‍රෑ. | 416.61 | 376.90 |
| - අපනයන (නැ.වි.ස.) | රුපියල්/කි.ග්‍රෑ. | 420.74 | 389.81 |
| 2.6 නැවත වගා කිරීම (උ) | හෙක්ටයාර | 2,161 | 1,782 |
| 2.7 අළුතින් වගා කිරීම (උ) | හෙක්ටයාර | 2,476 | 1,574 |
| 2.8 එකතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 0.2 | 0.2 |
| 3. පොල් | | | |
| 3.1 නිෂ්පාදනය | ගෙඩි මිලියන | 2,940 | 2,513 |
| 3.2 මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 395 | 395 |
| 3.3 නිෂ්පාදන පිරිවැය | ගෙඩියකට රුපියල් | 11.63 | 12.68 |
| 3.4 සාමාන්‍ය මිල | | | |
| - නිෂ්පාදන මිල | ගෙඩියක් රුපියල් | 21.60 | 29.60 |
| - අපනයන (නැ.වි.ස.) (ඌ) | ගෙඩියක් රුපියල් | 28.80 | 29.36 |
| 3.5 නැවත වගා කිරීම/ යටි වගාව (එ) | හෙක්ටයාර | 4,299 | 4,541 |
| 3.6 අළුතින් වගා කිරීම (එ) | හෙක්ටයාර | 4,814 | ලැ.නො. |
| 3.7 එ-කතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 1.0 | 0.8 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) හරිත තේ ඇතුළුව
(ඈ) අමු තේ දළු සැපයුම්කරුවන්ගේ ලාභාංශද ඇතුළත් වේ.
(ඉ) වගා කිරීම සහ සැකසුම් කටයුතු සිදු කළ ප්‍රමාණය පමණි.
(ඊ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2003 දී පවත්වන ලද කෘෂිකර්ම සංගණනය මත පදනම්ව රබර් වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය සංශෝධනය කර ඇත.
(උ) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගා සහන යෝජනා ක්‍රමය අනුව වගා කළ බිම් ප්‍රමාණය
(ඌ) ප්‍රධාන පොල් මද නිෂ්පාදන තුන සඳහා පමණි.
(එ) පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් දෙනු ලබන වගා සහනාධාර ක්‍රමය යටතට අයත් ඉඩම් ආවරණය වේ.

මූලයන් : ශ්‍රී ලංකා තේ මණ්ඩලය
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
පොල් වගා කිරීමේ මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය
පොල් සංවර්ධන සහ ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය
වැවිලි සමාගම්
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

රබර් වෙන්දේසි තුළ දුම්ගැසූ දාර සහිත රබර් ප්‍රභේද 1 (RSS1) හා ලේටෙක්ස් ක්‍රේප් රබර් 1x යන රබර් ප්‍රභේදයන්ගේ සාමාන්‍ය මිල ගණන් පිළිවෙළින් කිලෝ ග්‍රෑමයකට සියයට 10 කින් හා සියයට 3 කින් රුපියල් 377 ක් හා රුපියල් 397 ක් දක්වා පහත වැටුණි. එසේ ම, මෙම රබර් ප්‍රභේද දෙකෙහි අපනයන මිල ගණන් ද පිළිවෙළින් කිලෝ ග්‍රෑමයකට සියයට 6 කින් හා සියයට 7 කින් රුපියල් 422 ක් හා රුපියල් 377 ක් දක්වා පහත වැටුණි. ප්‍රධාන රබර් නිෂ්පාදනය කරන රටවල රබර් සැපයුම ඉහළ යාම සමග චීනය හා ජපානය වැනි රටවල ප්‍රධාන නිෂ්පාදකයින් සතුව ඉහළ රබර් තොග පැවැතීම රබර් මිල ගණන් පහළ යෑමට ප්‍රධාන වශයෙන් ආයක විය.

### පොල්

**පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන සැපයුම වසර තුළ දී සැලකිය යුතු පසුබෑමක් පෙන්නුම් කළේය.** පොල් නිෂ්පාදනය, 2013 වසරේ දී ගෙඩි මිලියන 2,513 ක් දක්වා සියයට 14.5 කින් පහළ ගියේය. පොල් නිෂ්පාදනය පහත වැටීම කෙරෙහි ප්‍රධාන වශයෙන් ම බලපෑවේ පොල් වගා කරන ප්‍රධාන ප්‍රදේශවල 2012 වසරේ පැවැති අඩු වර්ෂාපතනයේ පසු බලපෑමයි. 2013 වසරේ, පොල් නිෂ්පාදනය පහළ ගියද, සමස්ත පොල් නිෂ්පාදනයෙන් සියයට 72 ක් ආහාර පිසීමේ අවශ්‍යතා සඳහා ඉල්ලුම් කළ බැවින්, පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තකරුවන්ට අවශ්‍ය පොල් සපයා ගැනීම ගැටළුවක් විය. පොල් තෙල් නිෂ්පාදනය 2013 වසර තුළ දී මෙට්‍රික් ටොන් 45,208 ක් දක්වා (ගෙඩි මිලියන 349) සියයට 45 කින් පහළ ගියේය. පොල් තෙල් නිෂ්පාදනයේ පහළ යාම අනෙකුත් ආහාර පිසීමට භාවිත කරන තෙල් වර්ග ආනයනයන් ඉහළ යාමට හේතු විය. 2013 වසරේ මුල් කාලයේ දී පිරිපහදු කළ පාම් තෙල් සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට රුපියල් 115 ක් දක්වා ඉහළ දැමුව ද දේශීය වෙළෙඳපොළ තුළ පොල් තෙල්වලට ආසන්න ආදේශකයක් වන පාම් තෙල් ආනයනය 2013 වසර තුළ දී මෙට්‍රික් ටොන් 89,959 ක් දක්වා සියයට 41 කින් ඉහළ ගියේය. මේ අතර, කපාපු පොල් නිෂ්පාදනය ද 2013 වසරේ දී තියුණු පසුබෑමකට මුහුණ දෙමින් මෙට්‍රික් ටොන් 29,200 ක් දක්වා (ගෙඩි මිලියන 228) සියයට 30 කින් පහළ ගියේය. පොල් නිෂ්පාදනයේ පැවැති හිඟය සමගම පොල් ගෙඩියක ගොවිපොළ මිල ඉහළ යාම කපාපු පොල් නිෂ්පාදන පිරිවැය ඉහළ යාමට හේතු වූ අතර එය, වසර තුළ කපාපු පොල් අපනයනයන්ගේ ප්‍රමුඛ පසුබෑමකට මඟ පෑදීය. 2013 වසරේ කපාපු පොල් අපනයනය පසුගිය වසර හා සැසඳීමේ දී මෙට්‍රික් ටොන් 28,202 ක් දක්වා සියයට 30 කින් පහළ යන ලදී. කෙසේ වෙතත්, පොල් කිරිපිටි, පොල් ක්‍රීම් හා පොල් කිරි නිෂ්පාදනයන් 2013 වසර තුළ දී වර්ධනය විය. මෙම පොල් මද ආශ්‍රිත නිෂ්පාදනයන් මූලික වශයෙන් ම අපනයන වෙළෙඳපොළ සඳහා නිෂ්පාදනය කරන බැවින් එහි වර්ධන ප්‍රවණතාවය අඛණ්ඩව පවත්වා ගැනීම අත්‍යවශ්‍යය.

**පොල් මිල ගණන් 2013 වසර තුළ දී ඉහළ ගිය අතර ඒ සඳහා පහළ මට්ටමක පැවැති පොල් නිෂ්පාදනය මෙන් ම පොල් මද ආශ්‍රිත නිෂ්පාදකයින් අතර පොල් මිලදී ගැනීම සඳහා පැවැති ඉහළ තරගය ද බලපා තිබේ.** පහළ ගිය පොල් නිෂ්පාදනය කොප්පරා, පොල් තෙල් හා කපාපු පොල් මිල ගණන් ඉහළ යාමට හේතු විය. 2013 වසරේ දෙවන භාගය තුළ දී පොල් නිෂ්පාදනය සීඝ්‍ර ලෙස පහත වැටෙද්දී, පොල් මිල වැඩි වේගයකින් ඉහළ ගියේය. පොල් වෙන්දේසියේ පොල් ගෙඩියක සාමාන්‍ය මිල 2012 වසරේ දී පැවැති ගෙඩියකට රුපියල් 22.95 සිට 2013 වසරේ දී ගෙඩියකට රුපියල් 32.64 ක් දක්වා ඉහළ ගියේය. එසේම, පොල් ගෙඩියක සාමාන්‍ය සිල්ලර මිල ද 2012 වසරේ පැවැති ගෙඩියකට රුපියල් 34.56 සිට 2013 වසරේ දී රුපියල් 43.16 ක් දක්වා ඉහළ ගියේය. පොල් තෙල් ලීටරයක සාමාන්‍ය මිල ද 2012 වසරේ පැවැති රුපියල් 224 සිට 2013 වසරේ දී රුපියල් 258 ක් දක්වා ඉහළ යාමට කොප්පරා මිල ගණන්වල සැලකිය යුතු වැඩිවීම හේතු විය. කොළඹ පොල් වෙන්දේසිය තුළ කපාපු පොල්වල සාමාන්‍ය මිල 2012 වසරේ පැවැති රුපියල් 173.19 සිට 2013 වසරේ දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 239.05 ක් දක්වා ඉහළ ගියේය. කපාපු පොල් මිල ගණන් ඉහළ ගිය ද, කපාපු පොල්වල සාමාන්‍ය අපනයන මිල 2012 වසරේ පැවැති කිලෝ ග්‍රෑමයකට එ.ජ. ඩොලර් 1.65 සිට 2013 වසරේ දී එ.ජ. ඩොලර් 1.55 ක් දක්වා අඩුවීම මගින්, 2013 වසරේ දී කපාපු පොල් කර්මාන්තකරුවන්ගේ ලාභ ආන්තිකය අඩුවීම පිළිබිඹු විය.

### සුළු අපනයන බෝග

**සුළු අපනයන බෝග නිෂ්පාදනය 2013 වසර තුළ දී යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කරන ලදී.** 2013 වසරේ දී 2012 වසරට සාපේක්ෂව කුරුඳු, ගම්මිරිස්, කරාබුනැටි, කොකෝවා, පුවක්, සාදික්කා, බුලත් හා කජු මද වැනි නිෂ්පාදනයන් වර්ධනය වූ අතර කරදමුංගු නිෂ්පාදනය පහත වැටුණි. මල් හා ඵල පීදෙන වකවානුවේ හිතකර කාලගුණ තත්ත්වයන් පැවැතීම හා අලුතින් වගාකරන ලද ඉඩම්වල ඵලදාව ලැබීම හේතුවෙන් ගම්මිරිස් නිෂ්පාදනය මෙතෙක් වාර්තා වූ ඉහළ ම නිෂ්පාදනය අත්පත් කරගනිමින් පෙර වසරට සාපේක්ෂව සියයට 50.5 කින් වර්ධනය විය. වගාකරුවන්ට ඉහළ ප්‍රතිලාභ ලබා දෙමින්

ගම්මිරිස් අපනයන ඉල්ලුම වසර තුළ දී ඉහළ මට්ටමක පැවැතුණි. එසේ වුවද, ගම්මිරිස්වල ගොවිපොළ මිල සියයට 12 කින් පමණ පහළ ගිය බව දක්නට ලැබිණි. කරාබුනැටි නිෂ්පාදනය ද පෙර වසරට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 6,190 ක් දක්වා සියයට 54.4 කින් ඉහළ යාම මගින් ඉහළ ගිය ගොවිපොළ මිල ගණන්වල ප්‍රතිලාභ ලබා ගැනීමට වගාකරුවන්ට අවස්ථාව ලැබුණි. කජු මද නිෂ්පාදනය ද 2013 වසරේ දී මෙට්‍රික් ටොන් 2,072 ක් දක්වා සියයට 3.6 කින් ඉහළ ගිය අතර ඒ සඳහා මෑතකාලීනව අස්වනු නෙළන ඉඩම් ප්‍රමාණයේ ඉහළ යාමත් වගාකරුවන්ට ඉහළ මිලක් ලැබීමත් හේතු වී තිබේ. කුරුඳු නිෂ්පාදනය ද වසර තුළ දී සියයට 2 කින් සුළු වශයෙන් වර්ධනය වීමට මෑතකාලීනව කුරුඳු අස්වැන්න නෙළා ගන්නා ඉඩම්වල ප්‍රසාරණය දායක විය.

#### වෙනත් ක්ෂේත්‍ර බෝග

**වෙනත් ක්ෂේත්‍ර බෝගවල සමස්ත නිෂ්පාදනය 2012 වසරට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 968,246 ක් දක්වා සියයට 3.4 කින් වර්ධනය විය.** මෙය, 2012/13 මහ කන්නය තුළ දී මෙට්‍රික් ටොන් 587,477 දක්වා සියයට 3.8 කින් ඉහළ යාමේත් 2013 යල කන්නය තුළ දී මෙට්‍රික් ටොන් 380,769 ක් දක්වා සියයට 3.1 කින් වර්ධනය වීමේත් ඒකාබද්ධ ප්‍රතිඵලය විය. 2013 වසරේ ප්‍රධාන කන්නයන්හි දී වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කරන ලද බිම් ප්‍රමාණය ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් හිතකර කාලගුණික තත්ත්වයන් පැවැතීම, ජල සැපයුම ප්‍රමාණවත්ව පැවැතීම හා දේශීය ආදේශක බෝග වගාවන් දිරි ගැන්වීමේ අරමුණින් සමහර ආනයනික බෝගයන් මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද වැඩිකිරීම යන කරුණු හේතු විය. ඒ අනුව, 2013 වසරේ මැයි, ජුනි හා අගෝස්තු යන මාසවලදී අර්තාපල් හා ලොකු ළූණු සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉහළ නැංවීමට කටයුතු කර තිබේ. වසර තුළ දී සමහර බෝගයන් එනම්, උඳු, රතුළූණු, ලොකු ළූණු හා ඉඟුරු (අමු) නිෂ්පාදන පහළ ගොස් ඇත. ලොකු ළූණු නිෂ්පාදනය පහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් ම බලපානු ලැබුවේ තවාන් අදියරේ දී හා අස්වනු නෙළන කාලයන්හි දී අධික වර්ෂාව පැවැතීම හේතුවෙන් සිදු වූ වගා හානියයි. කෙසේ වෙතත්, ලොකු ළූණුවල නිෂ්පාදන මිල වසර පුරා ම ඉහළ මට්ටමක පැවැතීම වගාකරුවන් දිරිමත් කිරීමට හේතු විය. මේ අතර, කවුපි, කුරක්කන්, බඩඉරිඟු, සෝයා බෝංචි, තල, රටකජු, බතල, අර්තාපල් හා මිරිස් නිෂ්පාදනය වසර තුළ දී වර්ධනය විය. එසේ ම, බඩඉරිඟු, කව්පි හා රටකජුවල වර්තමාන නිෂ්පාදනය, දේශීය ඉල්ලුම ඉක්මවා ගොස් ඇති බැව් ඇස්තමේන්තු කර ඇත. එමනිසා, සත්ත්ව ආහාර නිෂ්පාදන කර්මාන්තයන් හා සැකසූ ආහාර නිෂ්පාදකයින්ට තවදුරටත් අමුද්‍රව්‍ය සඳහා ආනයන මත රඳා නොසිට, වැඩිදියුණු වූ දේශීය බෝග නිෂ්පාදන යොදා ගැනීමට හැකිවීම මගින් වැඩි ප්‍රතිලාභ ලැබෙනු ඇත.

#### එළවළු

**අයහපත් කාලගුණ තත්ත්වයන්ගේ බලපෑමට විටින් විට ලක් වුවද, එළවළු සැපයුම 2013 වසර පුරා වැඩි වර්ධනයක් දැක්විය.** 2013 වසර තුළ දී එළවළු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 1,091,491 දක්වා සියයට 15 කින් ඉහළ ගියේය. මේ අතර, උඩරට එළවළු සැපයුම සියයට 29 ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළ අතර, පහතරට එළවළු සැපයුම සියයට 5 කින් පහළ ගියේය. 2013 වසරේ සමස්ත එළවළු නිෂ්පාදනය තුළ උඩරට එළවළු සැපයුම සියයට 50 ක් පමණ විය. මේ සමග ම ගෝවා, කැරට්, බීට්, රාබු, ලීක්ස්, බෝංචි හා මාළු මිරිස්වල මිල ගණන් ද ප්‍රධාන කන්නයන් තුළ දී දිගට ම අඩුවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළේය. වගා කරනු ලබන ඉඩම් ප්‍රමාණයේ වැඩිවීමක් නොමැතිව නුවරඑළිය හා මාතලේ වැනි ප්‍රදේශවල එළවළු සැපයුමේ සිදු වූ වැඩිවීම, ප්‍රමාණවත් පරිදි පොහොර භාවිතයත් වැඩි ඵලදාවක් ලැබෙන බීජ භාවිතයත් සඳහා වගාකරුවන් යොමු වී ඇති බැව් පෙන්නුම් කරනු ලබයි. මෙයට අමතරව, වාරිජල සැපයුම වැඩිවීම, ඉල්ලුමට සරිලන පරිදි රට පුරා එළවළු බෙදාහැරීමේ ජාලය වැඩි දියුණුවීම, රජයේ වැඩසටහන් යටතේ ගෘහාශ්‍රිත එළවළු වගාවන් දිරිගැන්වීම ආදිය ද 2013 වසරේ එළවළු සැපයුමේ මනා වර්ධනය කෙරෙහි බලපා ඇති බැව් පෙනේ.

#### සීනි

**වසර තුළ දී සීනි කර්මාන්තය ප්‍රශංසනීය දියුණුවක් අත්පත් කර ගැනීමට සමත් විය.** සමස්ත සීනි නිෂ්පාදනය 2013 වසර තුළ දී මෙට්‍රික් ටොන් 53,061 දක්වා සියයට 48.8 කින් ඉහළ ගියේය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, 2013 වසරේ දී උක් වගා කරන ලද ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 11,801 ක් දක්වා සියයට 28.5 කින් ඉහළ යාමයි. පැලවත්ත, සෙවණගල හා ගල්ඔය යන කර්මාන්තශාලාවල ඇඹරීම සිදු කළ සමස්ත උක්දඬු ප්‍රමාණය වසර තුළ දී මෙට්‍රික් ටොන් 643,403 ක් දක්වා සියයට 49 කින් ඉහළ ගියේය. පොහොර යෙදීම, ඉහළ ඵලදාවක් ලබාදෙන උක්දඬු වගාකිරීම වැනි වඩාත් ප්‍රශස්ත කෘෂි භාවිතයන්ගේ ආධාරය ඇතිව හෙක්ටයාරයකට ලැබෙන උක්දඬු ඵලදාවේ ඉහළ යාමත් වගා කරන ලද බිම් ප්‍රමාණයේ වැඩිවීමත් මෙයට බලපා තිබේ. මෙයට අමතරව, වසර තුළ ප්‍රමාණවත් වර්ෂාපතනයක් පැවැතීම හා උක්දඬු මෙට්‍රික් ටොන් එකක සාමාන්‍ය නිෂ්පාදන ගැනුම් මිල රුපියල් 4,000 කට වඩා වැඩිවීම

මගින් වෙනත් බෝග වගාවන්වල සිට උක් වගාවට වගාකරුවන් යළි පැමිණීම දිරි ගන්වනු ලැබීය. සීනි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග එනම්, නව උක් වගා ප්‍රදේශවල ව්‍යාප්තිය, වාරිජල පහසුකම්වල වර්ධනය, කෘෂිකාර්මික මූල්‍ය හා රක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වාදීම ආදියේ ආධාරය ඇතිව ඉදිරි කාලය තුළ දී දේශීය සීනි නිෂ්පාදනය අඛණ්ඩව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### ධීවර

**2013 වසරේ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 512,840 ක් දක්වා සියයට 5.5 කින් ඉහළ ගියේය.** මෙය මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය සියයට 6.9 කින් ඉහළ යාමේත් මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 3 කින් පහළ යාමේත්, ඒකාබද්ධ ප්‍රතිඵලය විය. මුහුදු මත්ස්‍ය නිෂ්පාදනයේ ඉහළ යාම තුළ, ගැඹුරු මුහුදු හා වෙරළාසන්න මත්ස්‍ය නිෂ්පාදනය පිළිවෙළින් සියයට 11.4 කින් හා සියයට 4 කින් වර්ධනය විය. මැයි හා ජුනි මාසවලදී ඇති වූ අයහපත් කාලගුණ තත්ත්වයන්ගේ බලපෑම මුහුදු මත්ස්‍ය නිෂ්පාදනයේ වර්ධනය කෙරෙහි දැඩි ලෙස බලපෑවේය. කෙසේ වෙතත්, උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල බහුලව මත්ස්‍ය අස්වනු ලබා ගන්නා කාලය තුළ දී පැවැති යහපත් කාලගුණයත් සමග මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය තෙවන හා හතරවන කාර්තුව තුළ දී යථා තත්ත්වයට පත්විය. යුද්ධය අවසන් වීමෙන් පසුව රට තුළ ධීවර යටිතල පහසුකම් ක්ෂේත්‍රයේ සිදු වූ වැඩිදියුණුවීම් හා ධීවර යාත්‍රා ප්‍රමාණයේ ඇති වූ වර්ධනය, රටේ සෑම පළාතකින් ම මත්ස්‍ය නිෂ්පාදනයට කරනු ලබන දායකත්වය ඉහළ නැංවීමට හේතු විය. සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය තුළ ගැඹුරු මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය 2012 වසරේ දී පැවැති සියයට 38 සිට 2013 වසරේ දී සියයට 40 ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, 2013 වසරේ දී, ටින් කළ මාළු නිපදවන දේශීය සමාගම් 4 විසින් සිදු කළ සාමාන්‍ය දෛනික නිෂ්පාදනය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. පසුගිය වසරේ පැවැති නියගයේ බලපෑම මත ජලාශයන්හි මත්ස්‍ය සම්පත් විනාශවීම හේතුවෙන් මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 6.2 කින් පහළ යාම නිසා 2013 වසර තුළ දී මිරිදිය හා අභ්‍යන්තර ජලජීවී මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 66,910 ක් දක්වා සියයට 3 කින් අඩුවිය. කෙසේ වෙතත්, වසර තුළ අභ්‍යන්තර ජලජීවී වගාව හා ඉස්සන් ඇතුළුව වෙරළාසන්න ජලජීවී වගාව යන උප අංශයන් සියයට 15.8 කින් වර්ධනය විය. මේ සඳහා, මනා කළමනාකරණ භාවිතයන් හරහා රෝග ව්‍යාප්තිය පාලනය කිරීමට හැකිවීම මෙන්ම මත්ස්‍ය වගා ගොවිපොළවල ව්‍යාප්තිය ද බලපා තිබේ.

**2.5 සංඛ්‍යා සටහන — මත්ස්‍ය නිෂ්පාදනය**

| උප අංශය | 2012 (අ) | 2013 (ආ) |
|---|---|---|
| මුහුදු මත්ස්‍ය (ඇ) | 417 | 446 |
| ජල ජීවී සහ මිරිදිය මසුන් | 69 | 67 |
| **එකතුව** | **486** | **513** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුහුදුබඩ සහ ගැඹුරු මුහුදු ධීවර අංශයන්

මූලය : ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය

### පශු සම්පත්

**2013 වසරේ දී සමස්ත ජාතික කිරි නිෂ්පාදනය කිරි ලීටර් මිලියන 319.8 ක් දක්වා සියයට 6.8 ක් වර්ධනය වූ අතර, කිරිපිටි ආනයනය සියයට 16.9 කින් පහළ ගියේය.** 2016 වසරේ දී කිරි නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වීම සඳහා රජය සැලසුම් ක්‍රියාත්මක කිරීමත්, ආනයනික කිරිපිටි පරිභෝජනයට සුදුසු මට්ටමක නොපවතින බවට පාරිභෝගිකයන් අතර පැවැති අවිනිශ්චිතතාවයත් මෙයට හේතු විය. මෙය, ආනයනික කිරිපිටි සඳහා පැවැති ඉල්ලුම දේශීය නිෂ්පාදිත කිරිපිටි හා දියර කිරි සඳහා යොමුවීමට බලපා තිබේ. දේශීය කිරි නිෂ්පාදන සමාගම් වලට කෙටි කාලයේ දී සිය නිෂ්පාදන ධාරිතාවයන් පුළුල් කර ගැනීමට නොහැකි වුවද, මෙම කර්මාන්තශාලා වෙළෙඳපොළ ඉල්ලුම සපුරාලීම සඳහා උපරිම ධාරිතාවයෙන් සිය මෙහෙයුම් කටයුතු පවත්වා ගනු ලැබීය. ඒ අනුව, 2013 වසරේ දී මහා පරිමාණ කිරි නිෂ්පාදකයින් විසින් එකතු කරන ලද කිරි ප්‍රමාණය ලීටර් මිලියන 200.3 ක් දක්වා සියයට 9.1 කින් වර්ධනය විය.

**2.6 සංඛ්‍යා සටහන — පශු සම්පත් අංශය පිළිබඳ සංඛ්‍යා**

| උප අංශය | 2012 (අ) | 2013 (ආ) |
|---|---|---|
| 1. ජාතික ගවයන් සංඛ්‍යාව (මිලියන) | 1.6 | 1.5 |
| එළ ගවයන් | 1.2 | 1.1 |
| මී ගවයන් | 0.4 | 0.4 |
| 2. ජාතික කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන) | 299.2 | 319.8 |
| එළ ගවයන් | 237.6 | 258.0 |
| මී ගවයන් | 61.6 | 61.7 |
| 3. කිරි ආහාර නිෂ්පාදනය (ලීටර් මිලියන) | 30.6 | 36.5 |
| 4. නිෂ්පාදන මිල - එළකිරි (රු./ලීටර්) | 48.9 | 51.4 |
| 5. ජාතික බිත්තර නිෂ්පාදනය (මිලියන) | 1,457.1 | 1,942.2 |
| 6. ජාතික කුකුළු මස් නිෂ්පාදනය (මෙ.ටො.දහස්) | 137.4 | 144.5 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මිල්කෝ සමාගමේ අතිතාප ප්‍රතිකාරක (UHT) කිරි පැකට් නිෂ්පාදනය 2012 වසරේ පැවැති ලීටර් මිලියන 3.4 සිට 2013 වසරේ දී ලීටර් මිලියන 6.9 ක් දක්වා ඉහළ නැංවීමට සමත් වූ අතර යෝගට් නිෂ්පාදනය ද 2012 වසරේ පැවැති ලීටර් මිලියන 4.3 සිට 2013 වසරේ දී ලීටර් මිලියන 4.8 ක් දක්වා ඉහළ නැංවීමට සමත් විය. මිල්කෝ සමාගම හා පැලවත්ත කිරි සමාගම දේශීය වෙළෙඳපොළ තුළ පවතින ඉහළ ඉල්ලුම සපුරාලීම සඳහා සිය කර්මාන්තශාලා පුළුල් කිරීමට ආයෝජනයන් සිදු කරන ලදී. එසේ ම, කර්මාන්තකරුවන්ගේ කිරි සඳහා ඉහළ යන ඉල්ලුම සපුරාලීමට දේශීය කිරි සැපයුම සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි කිරීම සඳහා ඉහළ ඵලදාවක් සහිත දෙනුන්ගෙන් සමන්විත විශාල ගොවිපොළවල් ආරම්භ කිරීම සඳහා රජය විසින් ආයෝජන දිරිගන්වනු ලැබීය. මේ අතර, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය (NLDB) දිනකට කිරි ලීටර 20 ක් පමණ ලබාදෙන උසස් තත්ත්වයේ කිරි ගවයින් 1,500 ක් ආනයනය කරන ලදී.

**කුකුළු මස් හා බිත්තර නිෂ්පාදන ක්ෂේත්‍රය 2013 වසර තුළ දී ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී.** 2013 වසරේ දී බිත්තර නිෂ්පාදනය මිලයන 1,942 ක් දක්වා සියයට 33 කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, කුකුළු මස් නිෂ්පාදනය ද මෙට්‍රික් ටොන් 144,540 ක් දක්වා සියයට 5.2 කින් වර්ධනය විය. රජය විසින් කුකුළු මස් හා බිත්තර නිෂ්පාදන ක්ෂේත්‍ර වර්ධනය සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස මහා පරිමාණ කුකුළු මස් නිෂ්පාදකයින්ගේ සැපයුම වසර තුළ දී වර්ධනය විය. සන්නාම සහිත කුකුළු මස් නිෂ්පාදන සඳහා අදාළ පාලන මිල ඉහළ නැංවීම, දේශීය අමුද්‍රව්‍ය යොදාගෙන සත්ත්ව ආහාර නිෂ්පාදනය දිරිගැන්වීම, නිෂ්පාදන ධාරිතා ප්‍රසාරණය සඳහා අවශ්‍ය ප්‍රාග්ධන උපකරණ ආනයනය සඳහා බදු සහන ලබාදීම, මීමුතු කුකුළන් නිෂ්පාදනය කිරීම සඳහා ආයෝජනයන් දිරිගැන්වීමේ ප්‍රතිඵලයක් ලෙස බ්‍රොයිලර් අභිජනකයන් සැලකිය යුතු ප්‍රමාණයකින් වර්ධනයවීම, කුකුළු මස් හා බිත්තර නිෂ්පාදකයින් මත පනවන ආදායම් බදු පහත හෙළීම ආදිය රජය විසින් මෙම ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා ගනු ලැබූ ක්‍රියාමාර්ගයන් වේ. මස් පිණිස නිපදවන බ්‍රොයිලර් සතුන්ගේ නිෂ්පාදනය වැඩිවීම පිළිබිඹු කරමින්, 2013 වසර තුළ දී කුකුළු මස්වල මිල ගණන් අඩුවීමක් ද දක්නට ලැබිණි. බිත්තර නිෂ්පාදනයේ සැලකිය යුතු ඉහළ යාමක් වසර තුළ දී දක්නට ලැබුන ද, බිත්තරයක සිල්ලර මිල 2012 වසරේ පැවැති රුපියල් 11 සිට 2013 දී රුපියල් 14 දක්වා ඉහළ යාමට ප්‍රධාන වශයෙන් නිෂ්පාදන පිරිවැය ඉහළ යාම බලපා තිබේ.

### වන සම්පත්

**ශ්‍රී ලංකාවේ සමස්ත වනගහණය 2013 වසරේ දී හෙක්ටයාර 1,951,472 ක් වූ අතර එයින් හෙක්ටයාර 1,438,275 ක ඝණ වනාන්තර ව්‍යාප්තව ඇත.** වසර තුළ දී හෙක්ටයාර 863 ක වනගහනයක් දැව අවශ්‍යතාවය වෙනුවෙන් හෙළිකළ අතර හෙක්ටයාර් 1,319 ක නව වන වගාවන් සිදු කරන ලදී. වන සම්පත් ආරක්ෂා කරමින්, මනා ලෙස කළමනාකරණය කරමින් හා එම සම්පත් නැණවත් ලෙස පරිභෝජනයට ගනිමින් ශ්‍රී ලංකා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර සංවිධානවල ආධාරය ඇතිව දේශගුණ වෙනස්වීම්වලට මුහුණදෙන ගෝලීය අරගලයට අඛණ්ඩව දායක විය. ඔස්ට්‍රේලියානු ආධාර ලබන ශ්‍රී ලංකා ප්‍රජා වන වැඩසටහන සිය මෙහෙයුම් කටයුතු 2013 වසර තුළ දී ආරම්භ කරන ලද අතර එය ශ්‍රී ලංකාවේ ශුෂ්ක හා අන්තර්ශුෂ්ක කලාපයන් ආවරණය වන පරිදි දිස්ත්‍රික්ක 15 ක ක්‍රියාත්මක වේ. මේ යටතේ, වන සම්පත් කළමනාකරණය වැඩිදියුණු කරමින් ජනතාවගේ ආදායම් මාර්ග ඉහළ නංවා ගැනීමට ආධාර කිරීම අරමුණු කෙරේ. මේ අතර, දෙපාර්තමේන්තුව ලෝක උරුම භූමි භාගයන් ලෙස නම් කර ඇති, සිංහරාජ හා නකල්ස් වන සම්පත කළමනාකරණයට අදාල කටයුතු උදෙසා රුපියල් මිලියන 20 ක් වැය කරන ලද අතර, තවත් රුපියල් මිලියන 15 ක් පාරිසරික සංචාරක කලාපයන්හි නඩත්තුව සඳහා වියදම් කරන ලදී.

### කෘෂිකාර්මික ප්‍රතිපත්තීන් හා ආයතනික සහය

**රටේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය ආහාර සුරක්ෂිතතාවය උදෙසා දේශීය ආහාර නිෂ්පාදනය වැඩි කිරීමටත් ආහාර ආනයන වියදම අඩුකර ගැනීමටත් කෘෂිකාර්මික අපනයන දිරිගැන්වීම සඳහාත් අඛණ්ඩව යොමු වී තිබේ.** උතුරු, නැගෙනහිර, වයඹ හා දකුණු පළාත්වල ශුෂ්ක ප්‍රදේශවලට වාරිජල පහසුකම් ලබාදීම සඳහා මොරගහකන්ද, උමා ඔය, රඹුක්කන් ඔය හා යාන් ඔය වැනි ප්‍රධාන ව්‍යාපෘති 2013 වසර තුළ අඛණ්ඩව ක්‍රියාත්මක විය. උතුරු හා උතුරුමැද පළාතේ පානීය ජල අවශ්‍යතාවය මෙන්ම වාරිජල අවශ්‍යතාවය සඳහා මොරගහකන්ද ජලාශය හා ඉරණමඩු ජලාශය සම්බන්ධ කරමින් “උතුරුමැද ඇල මාර්ගය” ඉදිකිරීමට සැලසුම් කර ඇත. මේ අතර, රජයේ පොහොර සහන වැඩපිළිවෙළ ක්‍රියාත්මක වූ අතර, මේ යටතේ, වසර තුළ මෙට්‍රික් ටොන් 418,964 ක පොහොර වී වගාව සඳහාත් මෙට්‍රික් ටොන් 403,000 ක් වී නොවන වෙනත් බෝග සඳහාත් නිකුත් කළ අතර වසර තුළ පොහොර සහන වැඩපිළිවෙළ සඳහා රජයේ වියදම රුපියල් බිලියන 19.7 ක් විය. ඇතැම් ආහාර ආනයනයන් අඩු කිරීමටත් දේශීයව නිෂ්පාදනය කළ හැකි ආහාර බෝග

නිෂ්පාදනය දිරිගැන්වීම සඳහාත් තෝරාගත් භාණ්ඩ මත අය කරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉහළ නංවනු ලැබීය. එසේම, රටේ සීනි හා කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිණ. නව ධීවර වරායන් ඉදිකරමින්, බහුදින ධීවර යාත්‍රා ප්‍රමාණය ඉහළ නංවමින් සහ ජාත්‍යන්තර මුහුදේ මත්ස්‍ය සම්පත් නෙලා ගැනීම සඳහා අවශ්‍ය ආයෝජනයන් අඛණ්ඩව දිරිමත් කරමින් සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය තුළ ගැඹුරු මුහුදේ මත්ස්‍ය නිෂ්පාදනයේ දායකත්වය ඉහළ නැංවීමට කටයුතු කරන ලදී. තේ නැවත වගාව හා තේ නව වගාවන් සඳහා සපයනු ලබන සහනාධාරය වැඩි කරමින්, රබර් හා පොල් වගාවන් සම්ප්‍රදායික වගා ප්‍රදේශවලින් ඔබ්බට ව්‍යාප්ත කිරීමට පියවර ගනු ලැබිණ. මේ අතර, දැනට ප්‍රාදේශීය වැවිලි සමාගම් යටතේ ඇති වගාවට යොදා නොගත් හෙක්ටයාර් 10,000 ක් පමණ ඉඩම් තෝරාගත් තරුණ වගාකරුවන් අතර බෙදාහැරීම සඳහා පත්කරනු ලැබූ කමිටුවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා, සැලැසුම් සකස් කරන ලදී.

**ශ්‍රී ලංකා තේ මණ්ඩලය (ශ්‍රී.ලං.තේ.ම.) හා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය (ශ්‍රී.ලං.තේ.ප.ආ.) වසර තුළ දී සිය සංවර්ධන හා පර්යේෂණ ක්‍රියාකාරකම් තේ ක්ෂේත්‍රයේ දිගුකාලීන උපාය මාර්ගවලට අනුගතව ක්‍රියාත්මක කරන ලදී.** තේ නිෂ්පාදනය කරනු ලබන රටවල අමාත්‍යවරුන්ගේ සමාරම්භක සම්මන්ත්‍රණය, 2013 වසරේ දී ශ්‍රී.ලං.තේ. මණ්ඩලයේ අනුග්‍රාහකත්වය යටතේ, ශ්‍රී ලංකාවේ දී පවත්වන ලදී. ගෝලීය වශයෙන් තේ සංවර්ධනයට හා ප්‍රචාරණයට ජාත්‍යන්තර ආයතනයක් පිහිටුවා ගැනීම මෙහි අරමුණ විය. "ලංකා තේ" සන්නාමය විදේශ රටවල ප්‍රචාරය කිරීමේ ප්‍රතිපත්තිය අනුව, ශ්‍රී.ලං.තේ.ම., ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලය සමග 2013 - 2016 කාලය සඳහා ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායමේ විදේශීය තරග අනුග්‍රාහකයා ලෙස ක්‍රියා කිරීම සඳහා ගිවිසුමකට එළැඹිණ. තවදුරටත්, ශ්‍රී.ලං.තේ.ම. ලතින් ඇමරිකානු කලාපයේ ශ්‍රී ලංකා තේ සඳහා නව තේ ගැනුම්කරුවන් සොයා ගැනීමේ ප්‍රචාරණ වැඩසටහනක් ක්‍රියාවට නංවන ලද අතර "2013 පොදුරාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායකයින්ගේ සැසිවාරයට සමගාමීව පැවැති ව්‍යාපාරික සමුළුව" සඳහා ද අනුග්‍රාහකත්වය ලබාදෙන ලදී. මේ අතර, මනා කෘෂිකාර්මික හා නිෂ්පාදන භාවිතයන් ප්‍රචාරණය කරමින් ශ්‍රී.ලං.තේ.ම. සිය සහනාධාර වැඩසටහන් හා තේ කර්මාන්තශාලා නවීකරණ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාවට නැංවීය. 2014 වසර සඳහා රාජ්‍ය අයවැය මගින් යෝජනා කළ පරිදි නැවත තේ වගා කිරීම හා නව වගා කිරීම් සඳහා ලබාදෙන සහනාධාරය පිළිවෙළින් හෙක්ටයාරයකට රුපියල් 350,000 ක් හා රුපියල් 250,000 ක් දක්වා ඉහළ නංවන ලදී. මේ අනුව, 2013 වසර තුළ දී රුපියල් මිලියන 398 ක පිරිවැයක් දරමින් කුඩා තේ වතු වගා අංශය තුළ හෙක්ටයාර 1,483 ක නැවත හා නව තේ වගා කිරීම් සිදු කරන ලදී. මේ අතර, ශ්‍රී.ලං.තේ.ප.ආ. හා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය (කු.තේ.සං.අ.) එක්ව රුපියල් මිලියන 100 ක වියදමක් දරමින් කුඩා තේ වතු අංශය තුළ තේ දලු නෙළීමේ කටයුතු යන්ත්‍ර මගින් සිදු කිරීම ආරම්භ කිරීම සඳහා ඵලදායී වැඩසටහනක් සාර්ථකව හඳුන්වා දෙන ලදී. තවද, තේ වගාකිරීමේ කටයුතු වලට නැනෝ තාක්ෂණය එකතු කරමින්, ශ්‍රී.ලං.තේ.ප.ආ. ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය විසින් නිපදවූ "පාලනයකින් යුතුව ශාඛවලට පොහොර අවශෝෂණය සිදු කිරීම පිළිබඳ තාක්ෂණය" වගා ක්ෂේත්‍ර තුළ පර්යේෂණ මට්ටමින් අත්හදා බලන ලදී. අගය එකතු කළ තේ අපනයන දිරිගැන්වීම පිණිස කිලෝ ග්‍රෑම් 10 කට වඩා වැඩි බහාලුම් තුළ තේ අපනයනය කරන විට දී අදාළ සෙස් බද්ද කිලෝ ග්‍රෑමයකට රුපියල් 10 ක් දක්වා වැඩි කළ අතර කිලෝ ග්‍රෑම් 10 කට වඩා අඩු තේ බහාලුම් තුළ තේ අපනයනය කරන විට අදාල වන සෙස් බද්ද රුපියල් 4.50 කට සීමා කරන ලදී. කුඩා තේ වතු හිමියන්ට ඔවුන්ගේ තේ ඉඩම්වල තත්ත්වය උසස් කර ගැනීමට අවශ්‍ය ජල හා පාංශු සංරක්ෂණ කටයුතු උදෙසා රුපියල් 5,000 ක වාර්ෂික දීමනාවක් ලබාදීමට 2014 අයවැය මගින් යෝජනා කරන ලදී. වතු වැවිලි සමාගම්වල යළි වගාකිරීමේ කටයුතු දිරිගැන්වීම සඳහා අවුරුදු 8 ක කල්පිරීමක් හා සියයට 6 ක සහන පොලී අනුපාතයක් සහිත ණය යෝජනා ක්‍රමයක් ද මෙම යෝජනා අතර දක්නට ලැබිණි.

**කෙටි කාලයේ දී මනා කෘෂි භාවිතයන් ප්‍රවර්ධනය කිරීම තුළින් ඵලදායීතාවය ඉහළ නැංවීමත් මැදි හා දිගු කාලීනව නව හා නැවත රබර් වගාවන් හරහා රබර් වගා බිම් ප්‍රමාණය ඉහළ නැංවීමත් රබර් ක්ෂේත්‍රයේ සංවර්ධන උපායමාර්ගය වේ.** 2013 වසරේ දී අම්පාර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර් 10,000 ක රබර් වැවීමේ නව වැඩසටහනක් ආරම්භ කෙරුණ අතර සාම්ප්‍රදායික වගා ප්‍රදේශවල හෙක්ටයාර් 1,782 ක රබර් යළි වගාකිරීමේ කටයුතු වසර තුළ දී ප්‍රවර්ධනය කරන ලදී. ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය (ශ්‍රී.ලං.ර.ප.ආ.) මෙම නව ප්‍රදේශවල රබර් වගාවට සුදුසු ඉඩම් හඳුනාගැනීම සඳහා ක්ෂේත්‍ර පර්යේෂණ කටයුතුවලට දායක විය. ශ්‍රී.ලං.ර.ප.ආ. සිය කණ්ඩායම් උපදෙස් සේවාව එනම්, "විහිදුම් සත්කාර" වැඩපිළිවෙළ අඛණ්ඩව ක්‍රියාවට නංවමින් කුඩා රබර් වගාකරුවන්ට නව තාක්ෂණය හඳුන්වාදීමේ දී ඇති ගැටළු නිරාකරණය කර ගැනීමට මැදිහත් වූ අතර "නිපුණතා සවිය" පුහුණු වැඩසටහන තුළින් රබර් කිරි නිස්සාරණයේ යෙදෙන්නන්ගේ කුසලතා වැඩිදියුණු කිරීම සිදු කරන ලදී. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව ද සිය ව්‍යාප්ති

වැඩසටහන් ක්‍රියාවට නංවමින් රබර් කිරි නිස්සාරණය කරන්නන් හා රබර් පැල බද්ධ කරන්නන් පුහුණු කිරීමේ වැඩසටහන් රාශියක් පවත්වන ලදී. රබර් ඉඩම්වල පීලි සහිත වැහි ආවරණ යෙදීමේ තාක්ෂණය පිළිබඳව ද වගාකරුවන් දැනුම්වත් කිරීමට කටයුතු කරන ලදී. තවදුරටත්, දිස්ත්‍රික් මට්ටමේ වැඩමුළු හා පුහුණු වැඩසටහන් රාශියක් "තුරු සවිය සමිති" හරහා පවත්වන ලදී. මේ යටතේ, යන්ත්‍ර හා උපකරණ නියමිත ප්‍රමිති මට්ටමේ පවත්වා ගැනීම හා රබර් සැකසුම් මධ්‍යස්ථාන නවීකරණය කිරීම සිදු කරන ලදී. වසර තුළ දී, තුරු සවිය හා ලංකා බැංකුව ඒකාබද්ධව රුපියල් මිලියන 25.5 ක ණය ප්‍රමාණයක් වගාකරුවන් 275 ක් සඳහා නිකුත් කරන ලදී.

**"ජාතික පොල් සංවර්ධන සැලැස්ම" යටතේ වසර 2016 දී ජාතික පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 3,650 ක් දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.** ශ්‍රී ලංකාවේ පොල් ආශ්‍රිත කර්මාන්තයන්හි ව්‍යාප්තිය සඳහා පවතින ප්‍රධාන බාධාවක් වන්නේ පොල් නිෂ්පාදනයේ වර්ධනය මන්දගාමී අයුරින් සිදුවීමයි. පොල් සැපයුම ඉහළ නැංවීම සඳහා ජාතික පොල් ඵලදාව සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ නැංවීම සහතික කරමින් පොල් වගාබිම් උපරිම ලෙස උපයෝජනය කළ යුතු අතර නව වගාවන් වලදී ඉහළ ඵලදාවක් ලබාදෙන බීජ පැල භාවිතයට ගැනීම ද අවශ්‍ය වේ. වසර තුළ දී ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනය (ශ්‍රී.ලං.පො.ප.අ.) ඉහළ ඵලදාවක් ලබාදෙන CRISL 2012 (Brown Dwarf Tall) හා CRISL 2013 (Brown Dwarf San Raman) නමැති නව දෙමුහුන් ප්‍රභේද දෙක හඳුන්වාදුන් අතර හලාවත වතු සමාගම හා ඒකාබද්ධව ශ්‍රී.ලං.පො.ප.ආ. කිනියාම වතුයායේ අක්කර 200 ක "කපුරුවාන" පොල් බීජ පැල තවානක් පිහිටුවමින් ඉහළ ඵලදාවක් ලබාදෙන පොල් බීජ පැල සැපයුම ඉහළ දැමීමට කටයුතු කරන ලදී. තවදුරටත්, පොල් වගාකිරීමේ මණ්ඩලය වගා ඉඩම්වල යෝග්‍යතාවය තක්සේරු කිරීමේ වැඩසටහනක් ආරම්භ කරමින් මොණරාගල, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, අනුරාධපුරය, පොළොන්නරුව හා යාපනය වැනි ප්‍රදේශවලට පොල් වගාව ව්‍යාප්ත කිරීමේ කටයුතු සඳහා සාර්ථක ලෙස දායකත්වය ලබා දෙන ලදී. තවද, පොල් බීජ පැල මිලියන 2.07 ක ප්‍රමාණයක් "දිවි නැගුම" වැඩසටහන යටතේ පොල් වගාකරුවන්ට බෙදා දෙන ලදී. තවදුරටත්, ශ්‍රී.ලං.පො.ප.ආ. රෝග ව්‍යාප්තිය පාලනය කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කරන ලද අතර පොල් ආශ්‍රිත කර්මාන්තවල අගය එකතු කිරීමේ කටයුතු වැඩිදියුණු කරන ලදී. පොල් දළඹු වසංගතය සාර්ථකව පාලනය කිරීම සඳහා පරපෝෂිතයින් 809,810 ක් මුදාහළ අතර පෙරමෝන් රසායනිකය යෙදූ නල 3,000 ක් බෙදාහරිමින් රතු කුරුමිණි වසංගතය පාලනය කිරීම සිදු කරන ලදී. මෙයට අමතරව, විලෝපිත මයිටාවන් අඩංගු බහාලුම් 135,398 ක් වගාකරුවන් අතර බෙදාහරිමින් පොල් මයිටා වසංගතය පැතිරීම පාලනය කිරීමට කටයුතු කරන ලදී. එසේම, ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ හා වෙනත් බාහිර විශේෂඥයින්ගේ සහාය ඇතිව ශ්‍රී.ලං.පො.ප.ආ. පොල් මයිටා හා වැලිගම කොළ මැලවීමේ හා අතු හැකිලීමේ රෝගය පැතිරීම පාලනය කිරීම සඳහා කටයුතු සිදු කරන ලදී. විශේෂයෙන්ම, මෙම රෝගය වෙනත් ප්‍රදේශවලට පැතිරීම සම්පූර්ණයෙන් පාලනය කළ අතර රෝගය වැළඳුණු පොල් ගස් 66,065 ක් කපා ඉවත් කිරීමට කටයුතු කරන ලදී. නොඉඳුල් පොල් තෙල් නිෂ්පාදනය හා වෙනත් අගය එකතු කළ පොල් ආශ්‍රිත නිෂ්පාදිත එනම්, පොල් තලප, අයිස්ක්‍රීම්, පිටි කළ මී රා, පොල් කොහු මිශ්‍රණ ආදී නිෂ්පාදන වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ තවදුරටත් සාර්ථකව සිදු කරන ලදී. මැදි හා දිගු කාලීනව රටේ වෙනත් ආහාර පිසීමට ගන්නා පාම් හා සෝයා තෙල් වැනි විකල්ප තෙල් වර්ග ප්‍රවර්ධනය කිරීම අවශ්‍ය වන අතර එමගින් රටේ ආහාර පිසීමට ගන්නා තෙල්වල අවශ්‍යතාවයෙන් කොටසක් සපුරාලීමට හැකිවනු ඇත. මේ අනුව, 2013 දී පාම් වගාව ප්‍රවර්ධනය සඳහා ප්‍රාදේශීය වතු වැවිලි සමාගම් කිහිපයකට පාම් බීජ බදු සහන පදනම යටතේ ආනයනය කිරීමට අවසර ලබාදෙන ලදී. මේ අතර, 2016 වනවිට පාම් තෙල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 100,000 ක් දක්වා ඉහළ දැමීමට අපේක්ෂා කරන අතර එමගින් පාම් තෙල් ආනයන වියදම අඩුකර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. මෙමගින් දේශීය වෙළෙඳපොලෙහි පොල් හා පොල් තෙල් මිලෙහි ඇතිවිය හැකි විචලනය ද අවම කර ගැනීමට හැකිවනු ඇත.

**2016 වනවිට දේශීය සීනි නිෂ්පාදනය සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම සඳහා ආයෝජන සැලැස්මක්, 2013 වසරේ ක්‍රියාවට නංවනු ලැබීය.** මේ අනුව, දේශීය සීනි කර්මාන්තය නියාමනය කිරීමේ වගකීම සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයට පවරනු ලැබීය. එසේම, අමාත්‍යාංශය යටතේ ලංකා සීනි සමාගම පිහිටුවනු ලැබූ අතර රාජ්‍ය සීනි සමාගම් දෙක කළමනාකරණයේ වගකීම එයට පවරනු ලැබීය. ලංකා සීනි සමාගම අම්පාර, මඩකලපුව, කිලිනොච්චිය හා අනුරාධපුරය යන ප්‍රදේශවල උක් වගාකිරීම සඳහා සුදුසු ඉඩම් හඳුනා ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය. උක් වගා කටයුතු සඳහා පහසුකම් සලසමින්, උඩවලවේ, කන්තලේ හා හිඟුරාණ යන ප්‍රදේශවල උක් වගාව ව්‍යාප්ත කිරීම සඳහා පියවර ගනු ලැබූ අතර උක් වගාව සඳහා ඉතා හිතකර පරිසරයක්

පවතින බවට හඳුනාගෙන ඇති කිලිනොච්චි දිස්ත්‍රික්කයේ උක් වැවිලි වතු පිහිටුවීම සඳහා ද පියවර ගනු ලැබීය. මේ අතර, සීනි පර්යේෂණ ආයතනය වාරිජල පහසුකම් හා වැසි ජලය යන දෙආකාරයට ම වගා කළ හැකි වැඩිදියුණු කළ උක්දඬු බීජ ප්‍රභේද 8 ක් වාණිජ පරිමාණයේ වගා කටයුතු සඳහා හඳුන්වා දීම ද සිදු විය.

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතන දේශීය කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වලට ආධාර පිණිස කෘෂි වැඩසටහන් පුළුල් ලෙස ක්‍රියාවට නංවන ලදී.** පොහොර භාවිතයේ දී සිදුවන නාස්තිය අඩු කරමින් හා පාරිසරික හා සෞඛ්‍යය උවදුරු අවම කරමින් විවිධ පාරිසරික තත්ත්වයන් යටතේ ලාභදායී ඵලදා මට්ටමක් ලබාදෙන, පොහොර මිශ්‍රණයන් පිළිබඳ නවතම නිර්දේශයන් 2013 වසරේ දී හඳුන්වා දෙන ලදී. ලොකු ළූණු, රතු ළූණු, බඩඉරිඟු, මුංඇට, රටකජු, තල, කව්පි, සෝයා බෝංචි, මිරිස්, කුරක්කන් හා උඳු වැනි වෙනත් ක්ෂේත්‍ර බෝගයන් උතුරු, නැගෙනහිර, උතුරුමැද හා වයඹ පළාත්වල වගා කිරීම ඉහළ දමමින්, 2016 වසර වනවිට මෙම බෝග නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වීමට විශේෂ අවධානයක් යොමු කරන ලදී. වසර තුළ දී, "තරුණ කෘෂි ව්‍යවසායකත්වය" හා "වාණිජ ගොවිපොළ" නමැති වැඩසටහන් රුපියල් මිලියන 120 ක වියදමක් දරමින් ක්‍රියාත්මක කරන ලදී. මේ අතර, 2013 වසර තුළ දී සහල් පර්යේෂණ හා සංවර්ධන ආයතනය සහල් බිස්කට් නිෂ්පාදනය කිරීමට යෝග්‍ය සහල් ප්‍රභේද 05 ක් (AT 308, AT 306, AT 309, BG MA 2, AT 405) හඳුන්වා දෙන ලදී. තවදුරටත් සහල් අපනයනය ප්‍රවර්ධනය කරනු සඳහා ඉහළ ගුණත්වයෙන් යුතු සහල් ප්‍රභේදයක් (BG 1165-6) හඳුන්වා දෙනු ලැබීය. එසේම, අපනයන වෙළෙඳපොළ සඳහා සාම්ප්‍රදායික වී වර්ග වගා කිරීමට ගොවීන් උනන්දු කළ අතර මෙසේ වගා කළ "පච්චපෙරුමාල්" සහල් ප්‍රභේදයේ පළමු තොගය 2014 වසර මුල දී අපනයනය කිරීමට අපේක්ෂා කෙරේ.

**රජය මෑත කාලයේ දී වාරිජල පහසුකම් ව්‍යාප්ත කිරීම උදෙසා ඉතා පුළුල් වශයෙන් ආයෝජනයන් සිදු කරනු ලැබීය.** 2013 වසර තුළ දී දැනට පවත්නා වාරිමාර්ග ව්‍යාපෘතීන් බොහොමයක වැඩිදියුණු කළ අතර වයඹ පළාතට මහවැලි ජලය හැරවීමේ ව්‍යාපෘතිය හා මහ ගල්ගමුව ජලාශය පුළුල් කිරීම වැනි නව ව්‍යාපෘතීන් ආරම්භ කළ අතර ඉන් ගොවි පවුල් 16,000 කට සෘජු ප්‍රතිලාභ ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. තව ද, තවමත් වගාවට යොදා නොගත් ඉඩම් විශාල ප්‍රමාණයක් පවතින උතුරු නැගෙනහිර පළාත්වලට ද වාරිජල පහසුකම් ව්‍යාප්ත කිරීම සඳහා සැලසුම් කෙරෙමින් පවතී.

**පශු සම්පත් අංශයේ සංවර්ධනය උදෙසා සකස්කළ, ප්‍රධාන සැලැස්ම යටතේ රාජ්‍ය ආයතන වෙත පවරනු ලැබ ඇති කාර්යභාරය අඛණ්ඩව දෙවන වසරටත් 2013 වසරේ දී සාර්ථකව ඉටුවිය.** ආනයනය කරන ලද උසස් තත්ත්වයේ ෆ්‍රීසියන් හා ජර්සි ෆ්‍රීසියන් යන කිරි ගව ප්‍රභේදවල දායකත්වය ලැබීමෙන් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය අතිතාප ප්‍රතිකාරක කිරි පැකට් (UHT) මාසික නිෂ්පාදනය, දැනට පවත්නා 8,000 සිට 70,000 දක්වා ඉහළ නැංවීමට සැලසුම් කර ඇත. මෙමගින්, රට තුළ උසස් තත්ත්වයේ සකස් කළ දියර කිරි භාවිතය ප්‍රචලිත කිරීමට අපේක්ෂා කෙරේ. 2014 අයවැය මගින් සුළු හා මධ්‍ය පරිමාණ කිරි ගොවිපළවල් සංවර්ධනය කරමින් රටේ නැවුම් කිරි සැපයුම ඉහළ නැංවීම සඳහා ඉහළ ඵලදාවකින් යුත් කිරි ගවයින් 20,000 ක් තවදුරටත් ආනයනය කිරීමට යෝජනා කරන ලදී. ආනයනය කරන ලද උසස් තත්ත්වයේ කිරි ගවයින් ගොවීන්ට ලබාදීම සඳහා විශේෂ ණය යෝජනා ක්‍රමයක් ද යෝජනා කළ අතර, කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට, උපකරණ මිල දී ගැනීමට හා සත්ත්ව ආහාර නිෂ්පාදනය ආදිය සඳහා ද මේ යටතේ ණය පහසුකම් සලසනු ඇත. පශු වෛද්‍ය සේවාවන් ශක්තිමත් කරනු පිණිස, අලුතින් පශු වෛද්‍යවරුන් සේවයේ යෙදවීම සඳහා සහ පශු වෛද්‍යවරුන්ට රුපියල් 7,500 ක මාසික දීමනාවක් ලබා දීම සඳහා සැලසුම් කර ඇත.

**කුකුළු මස් හා බිත්තර නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා ප්‍රතිපත්තීන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.** 2013 වසරේ දී බිත්තර සඳහා කිකිළි පැටවුන් ලබා ගැනීමට මාපිය සතුන් (Layer Parent Birds) ආනයනය සහ මස් පිණිස බ්‍රොයිලර් සතුන් නිපදවීම සඳහා අවශ්‍ය මාපිය සත්ත්ව (Broiler Parent Birds) දේශීය නිෂ්පාදනය ඉහළ යාම තුළින් මෙම ක්‍රියාවලිය ශක්තිමත් වූ අතර එමගින් 2013 දී දිනක් වයසැති කුකුළු පැටවුන් සැපයුමෙහි ඉහළ යාමක් සිදු විය. කුකුළු බිත්තර හා මස් නිෂ්පාදනය ශක්තිමත් කරමින් 2013 වසරේ දී "දිවිනැගුම" වැඩසටහන යටතේ 358,193 ක පමණ කුකුළු පැටවුන් ප්‍රමාණයක් ග්‍රාමීය ප්‍රජාව අතර බෙදාහැරීමට කටයුතු කරන ලදී. මේ අතර, මෙම කාලය තුළ, "ඒවියන් ඉන්ෆ්ලුවන්සා" හෙවත් කුරුලු උණ රෝගය පිළිබඳ මෙහෙයුම් හා එහි ව්‍යාප්තිය පාලනය කිරීමේ කටයුතු වලට අදාල අධීක්ෂණ කටයුතු සිදු කරන ලදී. එසේම, කුකුළන්ට වැළඳෙන රෝග පාලනය කිරීම සඳහා නිරෝධායන රෙගුලාසි ද ඉතා දැඩි ලෙස ක්‍රියාත්මක කරන ලදී. තවදුරටත්, 2014 අයවැය තුළින්, වර්තමානයේ කුකුළු පාලන

ක්ෂේත්‍රය තුළ ඇති වූ වර්ධනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ණය යෝජනා ක්‍රමයක් යෝජනා කරන ලදී.

**අගය එකතු කළ මත්ස්‍ය නිෂ්පාදන හා මුහුදු මත්ස්‍ය අපනයනයන් වර්ධනය කිරීම සඳහා ගැඹුරු මුහුදේ මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.** 2013 වසරේ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අනුමත කළ, දේශීය - විදේශීය හවුල් ව්‍යාපෘතියක් යටතේ දිග මීටර් 24 කට වඩා විශාල ධීවර යාත්‍රා 08 ක් ජාත්‍යන්තර මුහුදු කලාපය තුළ මසුන් ඇල්ලීමේ කටයුතු සඳහා යෙදවීය. 2013 වසරේ දී වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කළ දික්ඕවිට ධීවර වරාය මගින් මෙම විශාල යාත්‍රා සඳහා අවශ්‍ය වරාය පහසුකම් සැපයීමට අපේක්ෂා කෙරේ. 2014 වසරේ අයවැය මගින් වෙන්නප්පුව, හලාවත, කප්පරතොට, දොඩන්දූව, හික්කඩුව හා මීගමුව කලපුව වැනි දැනට පවත්නා වරාය හා නැංගුරම් තොටුපොළ වැඩිදියුණු කිරීම සඳහා යෝජනා කරන ලදී. "දියවර දිරිය" ධීවර ණය යෝජනා ක්‍රමය අඛණ්ඩව දෙවන වසරටත් ක්‍රියාත්මක වූ අතර එමගින් ගැඹුරු මුහුදේ ධීවර කටයුතු සඳහා යොදා ගැනෙන යාත්‍රා ප්‍රමාණය වැඩි කිරීමට හා නව තාක්ෂණය යොදා ගනිමින් දැනට පවත්නා එබඳු යාත්‍රා නවීකරණය කිරීම සඳහා සහනදායී පොලී අනුපාත යටතේ ණය පහසුකම් ලබාදෙනු ලැබීය. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ 2012 හා 2013 වසර වලදී නිකුත් කරනු ලැබූ සමස්ත ණය ප්‍රමාණය රුපියල් මිලියන 2,489 ක් වූ අතර, පොලී සහනාධාරය වෙනුවෙන් රුපියල් මිලියන 53 ක් රජය විසින් දරන ලදී. තව ද, ධීවර ප්‍රජාවට ලබාදෙන ඉන්ධන සහනාධාරය වසර තුළ දී අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර මේ යටතේ 2013 වසරේ දී වැය කළ මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 1,524 ක් වූ අතර එය 2012 වසරේ දී රුපියල් මිලියන 2,970 ක් විය. 2014 අයවැය තුළින් කරවල, වියලි හාල්මැස්සන්, උම්බලකඩ, ටින් කළ මාළු හා වෙනත් සැකසූ මත්ස්‍ය ආහාර ආනයනය සඳහා ඉහළ බදු අනුපාත පවත්නා ගැනීමට යෝජනා කරන ලදී.

**ඉහළ නිෂ්පාදන විභවයක් සහිත සාම්ප්‍රදායික නොවන ජලජීවී වගාවන් දිරිගැන්වීමේ අරමුණින් යුතුව මිරිදිය හා ජලජීවී වගාව සඳහා අවශ්‍ය යටිතල පහසුකම් පුළුල් කිරීමට ක්‍රියාකරනු ලැබීය.** මිරිදිය ඉස්සන් වගාකිරීමේ ආදර්ශ ගොවිපොළක් 2013 ජනවාරි මස වාකරේ හිදී විවෘත කරන ලදී. මෙම ව්‍යාපෘතිය මගින් 2013 වසර තුළ දී රුපියල් මිලියන 40 ක වටිනාකමින් යුත් මෙට්‍රික් ටොන් 55.6 ක මත්ස්‍ය අස්වැන්නක් ලබා ගැනීමට හැකි වී ඇත. එසේම, වසර තුළ දී උතුරු පළාතේ ඉරණමඩු ප්‍රදේශයේ රුපියල් මිලියන 400 ක වියදමින් ජලජීවී අභිජනන හා සංවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලැබීය. මෙම ව්‍යාපෘතිය මගින් අගය එකතු කළ මත්ස්‍ය අපනයනයන් වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

**ඉහත දැනටමත් පෙන්වා දී ඇති යෝජනාවන්ට අමතරව, වගාවන් සඳහා ඉහළ ගුණාත්වයෙන් යුතු බීජ හා පැල රෝපණ ද්‍රව්‍ය ලබාදීමේ සිට වගා හානි සඳහා වන්දි ගෙවීම් දක්වා වූ විවිධ ක්‍රියාමාර්ගයන් 2014 අයවැය මගින් කෘෂිකර්මාන්ත අංශයේ ප්‍රවර්ධනය උදෙසා යෝජනා කරන ලදී.** ප්‍රධාන වගා ප්‍රදේශ ආවරණය වන පරිදි දිස්ත්‍රික් ලේකම් කොට්ඨාස යටතේ ඉදිරියට රැගෙන යා හැකි රුපියල් මිලියන 300 ක අරමුදලක් පිහිටුවීමට යෝජනා කළ අතර මෙමගින් අහිතකර කාලගුණික බලපෑම්වලින් සිදුවන වගා හානි වලදී වගාකරුවන්ට ඉක්මන් සහන සැලසීමට අපේක්ෂා කෙරේ. තව ද, වයස අවුරුදු 63 ඉක්මවූ ගොවීන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් යෝජනා කළ අතර මේ යටතේ එබඳු ගොවියෙකුට මසකට රුපියල් 1,250 ක මුදලක් ලබා දීමට අපේක්ෂා කෙරේ.

### කාර්මික අංශය

**2012 වසරේ දී අත්කරගත් සියයට 10.3 ක වර්ධනයට සාපේක්ෂව කාර්මික අංශය 2013 වසරේ දී සියයට 9.9 ක වර්ධනයක් වාර්තා කළේය.** ඒ අනුව, ද.දේ.නි. සඳහා කාර්මික අංශයේ දායකත්වය සියයට 31.1 ක් විය. ශ්‍රී ලාංකීය අපනයන සඳහා ඉල්ලුම ඉහළ යාම සහ දේශීය ඉල්ලුම සතුටුදායක මට්ටමක පැවැතීම හේතුවෙන් කාර්මික අංශයේ විශාලතම උප අංශය වන කර්මාන්තශාලා නිෂ්පාදන 2012 වසරේ දී වාර්තා කළ සියයට 5.2 ක වර්ධනයට සාපේක්ෂව මෙම වසරේ දී සියයට 7.9 ක ඉහළ වර්ධනයක් අත්කර ගත්තේය. ජල විදුලිබල උත්පාදනය මත විශාල වශයෙන් රඳා පැවැත්ම තුළින් එහි එකතු කළ අගය ඉහළ මට්ටමක පැවැතීම හේතුවෙන් විදුලිය, ගෑස් සහ ජලය උප අංශය ද වඩා වැඩි වේගයකින් වර්ධනය විය. ඉදිකිරීම් මෙන්ම පතල් සහ කැණීම් උප අංශ ද 2012 වසරේ දී වාර්තා කළ ඉහළ වර්ධනයට සාපේක්ෂව 2013 වසරේ දී ද අඛණ්ඩව යහපත් ලෙස වර්ධනය විය. එනමුදු, මෙම උප අංශයන්ගේ වර්ධන වේගය 2012 වසරට සාපේක්ෂව අඩු වීම කාර්මික අංශයේ එකතු කළ අගය මෙම වසර තුළ දී ආන්තික ලෙස පහළ යාමට හේතු විය.

### පතල් සහ කැණීම්

**පතල් සහ කැණීම් උප අංශය 2012 වසරේ දී වාර්තා කළ සියයට 18.9 ක වර්ධනයට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 11.5 කින් ප්‍රසාරණය වූ අතර, ඒ සඳහා අනෙකුත් පතල් උප අංශයේ වර්ධනය බෙහෙවින් උපකාරී විය.** මෙම උප අංශය ඉදිකිරීම්

ආශ්‍රිත අමුද්‍රව්‍ය වන වැලි, හුනු ගල්, කළු ගල් සහ මැටි මෙන්ම ග්‍රැෆයිට්, පොස්පේට්, ඛනිජ වැලි සහ ලුණු නිෂ්පාදනය ආදී ඛනිජ ද්‍රව්‍ය නිස්සාරණ කටයුතුවලින් සමන්විත වෙයි. ඉදිකිරීම් ආශ්‍රිත අමුද්‍රව්‍ය සඳහා ඉල්ලුම ඉහළ යාම අනෙකුත් පතල් කැණීම් උප අංශයේ දක්නට ලැබුණු වර්ධනයට මූලිකවම හේතු විය. පොහොර සඳහා වූ වෙළෙඳපොළ ඉල්ලුම ඉහළ යාමත් සමගම පොස්පේට් නිෂ්පාදනය ආන්තික වශයෙන් වර්ධනය විය. මේ අතර, ග්‍රැෆයිට් සහ ඛනිජ වැලි නිෂ්පාදන කටයුතු පහළ වැටීම මෙම උප අංශයේ වර්ධනය අඩු වීමට හේතු වූ අතර, ඛනිජ ද්‍රව්‍ය අපනයන පරිමා දර්ශකය පහළ වැටීම තුළින් ද එය පිළිබිඹු විය. තවද, පතල් සහ කැණීම් උප අංශයෙන් සියයට 18.4 කට දායකත්වය සපයනු ලබන මැණික් පතල් කැණීම් උප අංශය 2012 වසරේ දී අත්කරගත් සියයට 10.2 ක වර්ධනය හා සැසඳීමේ දී සියයට 10.7 කින් 2013 වසර තුළ දී වර්ධනය විය. මේ අතරතුර දී, 2013 වසරේ නොවැම්බර් මාසයේ සිට වැලි කැණීම් ද ඇතුළත්ව සියලුම ඛනිජමය පතල් කැණීම් ක්‍රියාකාරකම් සඳහා වූ අධිභාරය ඉහළ නැංවීම ද 2014 වසරේ මුල් කාලයේ දී ඛනිජ ගවේෂණ කටයුතු පාලනය හා සම්බන්ධව හඳුන්වා දුන් නව නියෝගයන් ද මෙම උප අංශයේ වර්ධනය සඳහා අභියෝගයක් විය හැක. මෙම උප අංශයේ වර්ධනය සඳහා ප්‍රතිපත්ති සම්පාදනයේ දී ඛනිජ ද්‍රව්‍ය, අමුද්‍රව්‍ය වශයෙන් අපනයනය කිරීම අධෛර්යමත් කිරීම සඳහා අවධානය යොමු කළ යුතු අතර, අපනයනයේ දී අගය එකතු කළ ඛනිජ ද්‍රව්‍ය සඳහා ඇති වෙළෙඳපොළ වර්ධනය කිරීමට අනුබල දීම මෙම අංශයේ වර්ධනය සඳහා වැදගත් වේ. තවද, කර්මාන්තශාලා සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දෙමින් නවීකරණය කිරීම මෙම උප අංශයේ ඵලදායීතාවය වැඩිදියුණු කිරීමට දායක වනු ඇත.

### නිෂ්පාදන කර්මාන්ත


#### සැකසුම්

**තේ, රබර් සහ පොල් සැකසුම් කර්මාන්ත අයත් වන සැකසුම් උප අංශය 2012 වසරේ වාර්තා කළ සියයට 6.5 ක වර්ධනයට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 0.6 කින් ආන්තික ලෙස වර්ධනය විය.** රබර් සහ පොල් නිෂ්පාදනයේ සිදුවූ පහත වැටීම මෙම ආන්තික වර්ධනයට හේතු විය. අයහපත් කාලගුණික තත්ත්වයන් මෙන්ම වෙළෙඳපොළ මිල මට්ටම් පහත යාම තුළින් නිෂ්පාදකයන් අධෛර්යමත් වීම රබර් නිෂ්පාදනය පහළ වැටීමට මූලික ලෙසම හේතු විය. පොල් නිෂ්පාදනය ද පසුගිය වසරේ පැවැති නියඟයෙහි පසු බලපෑම හේතුවෙන් පහළ යාමක් වාර්තා කළේය. වාර්තාගත තේ නිෂ්පාදනය හේතුවෙන් පොල් සහ රබර් නිෂ්පාදනවල දැකිය හැකි වූ අයහපත් වර්ධනයන්ගේ බලපෑම සීමා විය. තේ වගා කරන ප්‍රදේශවල තේ සඳහා හිතකර කාලගුණික තත්ත්වයන් පැවැතීම සහ සතුටුදායක මිල මට්ටම් පැවැතීම මගින් නිෂ්පාදකයන්ට සිය නිෂ්පාදන පරිමා ප්‍රශස්ත මට්ටමක රඳවා ගැනීම මෙම වාර්තාගත තේ නිෂ්පාදනයට හේතු විය. තේ පර්යේෂණ ආයතනය විසින් තේ සැකසුම් තාක්ෂණය වැඩිදියුණු කිරීම සඳහා ගෙන ඇති නව ක්‍රියාමාර්ග හේතුවෙන් අනාගතයේ දී තේ සැකසුම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම තේ සැකසුම් අංශය තවදුරටත් වැඩිදියුණු කිරීමට උපකාරී වනු ඇත.

#### කර්මාන්තශාලා නිෂ්පාදන

**නිෂ්පාදන කර්මාන්ත උප අංශයට විශාලතම දායකත්වය සපයන කර්මාන්තශාලා නිෂ්පාදනය, 2013 වසර තුළ දී එකතු කළ අගය පදනම මත සියයට 7.9 කින් වර්ධනය විය.** වඩා යහපත් වූ ගෝලීය ආර්ථික පරිසරය, හිතකර දේශීය සාර්ව ආර්ථික පරිසරය, දේශීය හා සංචාරක ඉල්ලුම ඉහළ යාම සහ මහා පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පැවැතීම, මෙම යහපත් වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදිත කාණ්ඩයත් රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදිත කාණ්ඩයත් පිළිවෙලින් සියයට 8.9 කින් හා සියයට 7.6 කින් වර්ධනය වූ අතර, මෙම වර්ධනය අපනයන ඉලක්ක කරගත් කර්මාන්තවල එකතු කළ අගය ඉහළ නැංවීම සඳහා බෙහෙවින් දායක විය. ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදිත

**2.3 රූප සටහන** — **නිෂ්පාදන කර්මාන්ත උප අංශයේ එකතු කළ අගය (2002 ස්ථාවර මිල)**



කාණ්ඩය සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත කාණ්ඩය පිළිවෙලින් සියයට 7.5 කින් හා සියයට 5.6 කින් වර්ධනය වූ අතර, මෙම වර්ධනය දේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් කර්මාන්තශාලාවල එකතු කළ අගය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. මේ අතර, සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රෝපකරණ හා ප්‍රවාහන උපකරණ කාණ්ඩය වසර තුළ දී සියයට 8.8 ක යහපත් වර්ධනයක් වාර්තා කරන ලදී.

### කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය

**කර්මාන්තශාලා නිෂ්පාදනයේ නිමැවුම් ප්‍රමාණය මැනීම සඳහා යොදාගන්නා දර්ශකයක් වන කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය, ඇතැම් උප අංශයන් ශීඝ්‍රයෙන් වර්ධනය වීමේ සහ අනෙකුත් උප අංශ මන්දගාමී වර්ධනයක් වාර්තා කිරීමේ ශුද්ධ ප්‍රතිඵලයක් ලෙස 2013 වසරේ දී සියයට 0.8 ක සමස්ත වර්ධනයක් වාර්තා කළේය.**[1] විදේශීය ඉල්ලුම ඉහළ යාම, යහපත් දේශීය සාර්ව ආර්ථික පසුබිම සහ දේශීය එකතු කළ අගය වැඩි කිරීමටත් අධිතාක්ෂණික නිෂ්පාදන දිරිමත් කිරීමටත් රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කර්මාන්තශාලා අංශයේ ක්‍රියාකාරිත්වය වේගවත් කිරීමට හේතු විය. ප්‍රධාන වශයෙන් ඇමෙරිකාව සහ යුරෝපා කලාපය ඇතුළු ගෝලීය ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමඟ විදේශීය ඉල්ලුම වර්ධනය වීම, ඉහළ නිෂ්පාදන වර්ධනය සඳහා දායක විය. ඇඟළුම් හා රබර් නිෂ්පාදන වැනි අපනයන ඉලක්ක කරගත් කර්මාන්තශාලා නිෂ්පාදන, 2013 වසරේ දී කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් ම දායක විය. විශාල ලෙස අපනයන වෙළෙඳපොළ කෙරෙහි යොමු වූ නැව් අලුත්වැඩියා හා නිෂ්පාදන සහ විද්‍යුත් උපකරණ වැනි නැගී එන නව කර්මාන්ත ද වසර තුළ දී ඉහළ වර්ධනයක් වාර්තා කළේය. කිරිපිටි, තිරිඟු පිටි, පාන වර්ග, දුම්කොළ, පොහොර සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත 2013 වසරේ දී පසුබෑමක් පිළිබිඹු කළේය. බේකරි නිෂ්පාදන, සකස් කළ මස් වර්ග, පැණිරස ආහාර, සකස් කළ ආහාර, සම් නිෂ්පාදන, පාවහන් නිෂ්පාදන, පිරිපහදු කළ ඛණිජ තෙල් නිෂ්පාදන, ඖෂධ, මූලික ලෝහ නිෂ්පාදන වැනි දේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් කර්මාන්තශාලා 2013 වසර තුළ දී යහපත් වර්ධනයක් පෙන්නුම් කළේය.

**කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ දෙවන විශාලතම උප අංශය වන ඇඟළුම් උප අංශය 2013 වසරේ දී, කර්මාන්තශාලා නිමැවුම ඉහළ නැංවීම කෙරෙහි විශාල වශයෙන් දායක විය.** ඒ අනුව, 2012 වසරේ දී සියයට 4.2 ක වර්ධනයක් වාර්තා කළ ඇඟළුම් උප අංශය, 2013 වසරේ දී සියයට 6.7 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. ඇඟළුම් අපනයන ගමනාන්තයන් සාම්ප්‍රදායික නොවන වෙනත් වෙළෙඳපොළ වෙත විවිධාංගීකරණය කිරීම සඳහා පියවර ගැනීම ඇඟළුම් අපනයන ඉහළ නැංවීමට උපකාරී වූ අතර, පූර්ව ක්‍රියාවලීන් සම්බන්ධීකරණයට විශාල වශයෙන් යොමුවීම, ප්‍රවීණතා දැනුම ලබා ගැනීම, නිෂ්පාදන දාමයේ ඉහළ වටිනාකමකින් යුත් භාණ්ඩ නිපදවීම, විශ්වවිද්‍යාල - කර්මාන්ත - රජය අතර සම්බන්ධීකරණය සහ උසස් තත්ත්වයෙන් යුතු විශ්වාසදායී ඇඟළුම් තරගකාරී මිලට ජාත්‍යන්තර වෙළෙඳපොළ වෙත ඉදිරිපත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකාව

**2.7 සංඛ්‍යා සටහන — කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය**
**2010 = 100**

| කාණ්ඩය (කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ බර තැබීම වරහන් තුළ දක්වා ඇත) | දර්ශකය | | |
|---|---|---|---|
| | 2012 (අ) | 2013 (ආ) | වාර්ෂික වෙනස්වීම % |
| 1. ආහාර නිෂ්පාදිත (23.7%) | 108.5 | 105.3 | -2.9 |
| 2. පාන වර්ග (8.1%) | 107.4 | 103.0 | -4.1 |
| 3. දුම්කොළ නිෂ්පාදිත (8.4%) | 99.9 | 96.7 | -3.2 |
| 4. රෙදිපිළි (1.6%) | 113.9 | 128.5 | 12.8 |
| 5. ඇඟලුම් (23.1%) | 118.5 | 126.5 | 6.7 |
| 6. සම් සහ ආශ්‍රිත නිෂ්පාදිත (0.8%) | 93.1 | 98.3 | 5.6 |
| 7. ගෘහ භාණ්ඩ හැර, දැව සහ දැව නිෂ්පාදිත (0.1%) | 98.4 | 114.6 | 16.4 |
| 8. කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත (0.1%) | 98.8 | 127.0 | 28.5 |
| 9. මුද්‍රණය සහ තැටි පිටපත් කිරීම (0.7%) | 106.3 | 110.3 | 3.8 |
| 10. පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත (2.2%) | 81.3 | 83.4 | 2.6 |
| 11. රසායන ද්‍රව්‍ය සහ රසායන ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදිත (6.3%) | 77.6 | 74.1 | -4.5 |
| 12. ඖෂධ, ඖෂධීය සහ උද්භිද විද්‍යාත්මක නිෂ්පාදිත (0.1%) | 138.8 | 185.1 | 33.4 |
| 13. රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත (10.5%) | 116.9 | 118.2 | 1.1 |
| 14. අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (7.2%) | 117.5 | 103.2 | -12.2 |
| 15. මූලික ලෝහ නිෂ්පාදිත (1.0%) | 99.0 | 100.0 | 1.1 |
| 16. යන්ත්‍රෝපකරණ සහ උපකරණ හැර, සකස් කළ ලෝහ නිෂ්පාදිත (3.8%) | 111.7 | 136.5 | 22.1 |
| 17. විදුලි උපකරණ (2.3%) | 98.4 | 107.6 | 9.4 |
| **කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය** | **108.8** | **109.6** | **0.8** |


(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන : කාර්මික නිෂ්පාදන දර්ශකය 2013 වසරේදී කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය ලෙස නැවත නම් කරන ලදී.

[1] උප කාණ්ඩ 17 ක් ආවරණය කරමින් කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය ගණනය කර ඇති අතර, 2010 වසර පදනම් වර්ෂය ලෙස ගෙන බර තැබීම සිදුකර ඇත. කෙසේ වුවද, ඉන්පසු ආර්ථිකයේ දැකිය හැකි කැපී පෙනෙන ව්‍යුහාත්මක වෙනස්කම් හේතුවෙන් නැගී එන නව කර්මාන්ත සඳහා වැඩි බර තැබීමක් කළ යුතුව ඇති අතර, මෙම නියැදිය තුළ අඩංගු වී පැවැති සමහර කර්මාන්ත සඳහා බර තැබීම කැපී පෙනෙන ලෙස අඩු වී ඇත. මෙම තත්ත්වය, කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ මීළඟ සංශෝධනයේ දී සලකා බැලීමට අපේක්ෂා කෙරේ.

**2.4 රූප සටහන** **කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය (2010 = 100)**





ලබා ඇති පිළිගැනීම, සාම්ප්‍රදායික වෙළෙඳපොළ වෙත රෙදිපිළි සහ ඇඟළුම් අපනයනයෙහි ඉහළ වර්ධනයන් පවත්වා ගැනීමට ඉවහල් විය. තවද, බංග්ලාදේශ ඇඟළුම් කර්මාන්තයේ අස්ථාවරත්වය ද, ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තය වෙත නව ඇණවුම් වැඩිවීමට හේතු විය. ගෝලීය වෙළෙඳපොළවල පැවැති අහිතකර තත්ත්වයන් හමුවේ වුවද, ඇඟළුම් උප අංශය වෙත ලබාදුන් විවිධ බදු දිරිගැන්වීම්, වසර පුරා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට හිතකර වාතාවරණයක් පැවැතීම සහ පුද්ගලික අංශයේ කර්මාන්තකරුවන් ගනු ලැබූ දූරදර්ශී සහ කාලෝචිත පියවර හේතුවෙන් මෙම උප අංශය ශක්තිමත්ව පැවැතුණි. කර්මාන්තකරුවන් විසින් අනුගමනය කරන ලද හරිත නිෂ්පාදන ක්‍රමවේදයන් සහ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයන් ඇඟළුම් අපනයනකරුවන්ට, ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ තම වෙළෙඳ ප්‍රතිරූපය ගොඩනගා ගැනීමට තවදුරටත් උපකාරී විය. මේ අතර, දේශීය වශයෙන් නිෂ්පාදිත යෙදවුම් සඳහා ඇඟළුම් නිෂ්පාදකයින්ගෙන් වූ ඉල්ලුම සැලකිය යුතු ලෙස වර්ධනය වීම සහ දේශීය රෙදි වර්ග සඳහා සංචාරකයින්ගේ ඉල්ලුම ඉහළ යාම හේතුවෙන් 2013 වසරේ දී රෙදිපිළි උප අංශය සියයට 12.8 ක වර්ධනයක් වාර්තා කළේය.

**රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදිත උප අංශය විවිධ අභියෝග මධ්‍යයෙහි වුවද 2013 වසර තුළ දී වර්ධනය විය.** 2013 වසරේ අවසන් භාගයේ දී රබර් ටයර්, ටියුබ් සහ අනෙකුත් රබර් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර ඉල්ලුම ඉහළ යාම හේතුවෙන් රබර් නිෂ්පාදනය සියයට 4.6 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කරන ලදී. ඇමෙරිකාවේ සහ යුරෝපා ප්‍රදේශවල කර්මාන්තශාලා නිෂ්පාදන අංශයේ වර්ධනයත් ඒ සමග ඇති වූ මෝටර් රථ නිෂ්පාදනයේ තියුණු වර්ධනයත් හමුවේ රබර් භාණ්ඩ නිෂ්පාදනයට විශාල වශයෙන් දායකත්වය ලබාදෙමින් ඝන ටයර් හා ටියුබ් ටයර් අපනයන වැඩි විය. තවද, 2013 වසර තුළ දී ද රබර් අත්වැසුම් සඳහා වූ විදේශීය ඉල්ලුම සතුටුදායකව පැවැති අතර, එය අපනයන වෙළෙඳපොළ සඳහා නිෂ්පාදනය කළ කාර්මික, ශල්‍ය හා ගේදොර කටයුතු සඳහා භාවිතා කරන අත්වැසුම් නිෂ්පාදනයේ ඉහළ වර්ධනය ශක්තිමත් කළේය. අහිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් සකස් නොකළ රබර්වල හිඟයක් දේශීය වෙළෙඳපොළෙහි තාවකාලිකව පැවැතීම, පරිසර දූෂණය හා සම්බන්ධ කරුණු මත කර්මාන්තශාලාවක් වැසීයාම සහ බලශක්ති පිරිවැය ඉහළ යාම යනාදී බාධක තිබියදීත්, මෙම යහපත් වර්ධනය අත්කරගෙන ඇත. කෙසේ වුවද, ඉහළ අමුද්‍රව්‍ය පිරිවැය හා ඉහළ බලශක්ති පිරිවැය, වසර තුළ නිෂ්පාදන ලාභ ආන්තික මත අහිතකර බලපෑමක් ඇති කළේය. මේ අතර, කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයෙන් පිළිබිඹු වන පරිදි, මූලික වශයෙන් දේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් ප්ලාස්ටික් නිෂ්පාදනයේ පසුබෑම හේතුවෙන්, 2013 වසරේ දී කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයෙහි රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත අංශයේ සමස්ත වර්ධනය මන්දගාමී විය.

**ප්‍රධාන වශයෙන් නැව් නිෂ්පාදනය කිරීම සහ නැව් අලුත්වැඩියා කිරීමේ කර්මාන්තයන්ගෙන් සමන්විත සකස් කළ ලෝහ නිෂ්පාදිත උප අංශය 2013 වසරේ දී යහපත් වර්ධනයක් වාර්තා කළේය.** ඉතා උසස් තත්ත්වයෙන් යුත් නැව් ජාත්‍යන්තර

**2.5 රූප සටහන** **කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ සංයුතිය - 2013**



වෙළෙඳපොළ සඳහා නිෂ්පාදනය කිරීම හා කලාපීය ගනුදෙනුකරුවන් සමග ඇති කරගත් දිගුකාලීන මිත්‍රශීලී සබඳතා, ශ්‍රී ලාංකේය නිෂ්පාදිත සඳහා ඇති ඉල්ලුමේ අඛණ්ඩ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. එබැවින්, යුරෝපා රටවලින් විනෝද කටයුතු සඳහා යොදා ගන්නා බෝට්ටු සඳහා වූ ඉල්ලුම අඩුවීම සහ ගෝලීය වෙළෙඳ කටයුතු මන්දගාමීවීම හේතුවෙන් නාවික ගමනාගමනය අඩුවීම මධ්‍යයේ වුවද මෙම අංශය වසර තුළ දී සියයට 22.1 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කළේය. වරායන් පුළුල් කිරීම හා නිදහස් වරාය පහසුකම් හඳුන්වාදීම සහ බැර කර්මාන්ත දිරිමත් කිරීමට වර්තමාන රජය අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හඳුන්වාදීමත් සමඟ නැව් ඉදිකිරීමේ හා අලුත්වැඩියා කිරීමේ උප අංශය ඉදිරි වසරවලදී තවදුරටත් වර්ධනය වෙතැයි අපේක්ෂා කරයි.

**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) විසින් පිරිපහදු කරන ඛනිජ තෙල් නිෂ්පාදිතවලින් මුළුමනින් ම සමන්විත වන පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත උප අංශය 2013 වසරේ දී මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය.** 2012 වසරේ දී ඇමෙරිකා එක්සත් ජනපදය විසින් ඉරානය මත සම්බාධක පනවා තිබියදීත්, ප්‍රධාන වශයෙන් ඕමානය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය වැනි වෙනත් රටවලින් අඛණ්ඩ ලෙස බොරතෙල් සැපයීම හේතුවෙන්, 2013 වසරේ දී මෙම උප අංශයේ නිෂ්පාදනය සියයට 2.6 ක යහපත් වර්ධනයක් වාර්තා කරන ලදී. මෙලෙස බොරතෙල් විකල්ප ප්‍රභවයන් වෙතින් ලබා ගැනීම හේතුවෙන් වසරේ මුල් භාගය තුළ දී ධාරිතා උපයෝජනය සහ ඵලදායීතාව පහළ මට්ටමක පැවතුණි. කෙසේ වුවද, වසරේ අවසන් භාගයේ දී පමණ පිරිපහදු කටයුතු සඳහා සුදුසු බොරතෙල් සංයෝගය හඳුනාගැනීමත් සමග පෙට්‍රල් හා ඩීසල් වැනි ඉහළ තලයේ නිෂ්පාදනවල පිරිපහදු ඵලදායීතාවය වැඩිදියුණු විය. එසේ නමුත්, හිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ජල විදුලි බලාගාරවල බලශක්ති ජනනය සැලකිය යුතු ලෙස වර්ධනය වීම බලශක්ති ජනනය සඳහා ඉන්ධන අවශ්‍යතාවය අඩු කළ අතර, එය මෙම උප අංශයේ සමස්ත වර්ධනය මන්දගාමී වීමට හේතු විය.

**කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයට අනුව 2013 වසරේ දී ආහාර නිෂ්පාදිත උප අංශය මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් වාර්තා කරන ලදී.** ආහාර නිෂ්පාදිත උප අංශය සඳහා ආසන්න වශයෙන් සියයට 43.7 ක දායකත්වයක් දක්වන බේකරි නිෂ්පාදන, සීනි, කොකෝවා, චොකලට්, රසකැවිලි හා සකස් කළ ආහාර වැනි ආහාර නිෂ්පාදන 2013 වසරේ දී සියයට 5.4 කින් වර්ධනය විය. මස් වර්ග සැකසීම හා කල් තබා ගැනීම සියයට 2.7 ක වර්ධනයක් වාර්තා කළේය. සංචාරක පරිභෝජන ඉල්ලුම වැඩිවීම සහ වෙළෙඳපොළෙහි නව නිෂ්පාදන ශීඝ්‍රයෙන් වැඩි වීම මෙම යහපත් වර්ධන ප්‍රවණතාවය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, කිරි නිෂ්පාදන, පිටි හා පිෂ්ඨමය නිෂ්පාදන යනාදියෙහි වර්ධනය වසර තුළ දී අඩු විය. දේශීය නැවුම් කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා කිරිපිටි ආනයන මත රජය විසින් පනවන ලද ඉහළ තීරු බදු හේතුවෙන් ආනයනික කිරිපිටි යොදාගනු ලබන කිරි නිෂ්පාදන අඩු විය. 2013 වසරේ දී වෙළෙඳපොළෙන් DCD අඩංගු කිරි නිෂ්පාදන ඉවත් කිරීමත් සමග මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර විය. කෙසේ වුවද, වසර තුළ කිරිපිටි සැපයුම් හිඟතාවයෙන් වාසි ලබමින් දේශීය කිරි කර්මාන්ත වර්ධනයක් වාර්තා කරන ලදී. ප්‍රධාන වෙළෙඳ කොටස්කරුවකු විසින් තිරිඟු පිටි මත පනවන ලද ආනයන සීමාවන් සහ වෙළෙඳපොළ තරගකාරීත්වය ඉහළ යාම හේතුවෙන් අපනයන ඉල්ලුම පහත වැටුණු අතර, මේ හේතුවෙන් පිටි හා පිෂ්ඨමය නිෂ්පාදනයේ අඩුවීමක් වාර්තා විය.

**2013 වසරේ දී පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදනය මන්දගාමී විය.** සුරාබදු වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස මත්පැන් මිල ගණන් ඉහළ යාම හේතුවෙන් දේශීයව නිපදවන ඉහළ මිලක් සහිත සැර මත්පැන් නිෂ්පාදන සඳහා වන ඉල්ලුම සැලකිය යුතු ලෙස පහත වැටුණි. කෙසේ වුවත්, මෙම ප්‍රවනතාවය හා නීති විරෝධී මත්පැන් වැටලීම් ගණන වැඩිවීම යන සාධක දෙක ම හේතුවෙන්, අඩු මිලක් සහිත සැර මත්පැන් නිෂ්පාදන සඳහා වූ ඉල්ලුම ඉහළ ගිය අතර, එම නිෂ්පාදනයන්හි සැලකිය යුතු වර්ධනයක් වාර්තා විය. මෙලෙස ම, 2013 වසරේ දී ඉහළ පාරිභෝගික රුචිය හේතුවෙන් මෝල්ට් අඩංගු බීර නිෂ්පාදනය ද වර්ධනය විය. 2013 වසර තුළ දී ඛනිජ ලවණ අඩංගු පානීය ජලය සහ බෝතල් කළ ජලය නිෂ්පාදනයේ වර්ධනයක් වාර්තා විය. එහෙත් කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය මගින් පෙන්නුම් කළ පරිදි වසර තුළ දී සිසිල් බීම නිෂ්පාදනය මන්දගාමී විය. දුම්කොළ නිෂ්පාදන සඳහා වූ ඉල්ලුම පහළ යාම හේතුවෙන් 2013 වසරේ දී දුම්කොළ නිෂ්පාදන උප අංශය සියයට 3.2 කින් අඩු විය. සිගරට් මත වූ නිෂ්පාදන බදු වැඩි කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සිගරට් මිල ගණන් ඉහළ ගිය අතර දුම්කොළ පරිභෝජනය හේතුවෙන් ඇතිවන සෞඛ්‍ය ගැටලු පිළිබඳ පාරිභෝගිකයන්ගේ සැලකිල්ල වැඩිවීම හේතුවෙන් දුම්කොළ සඳහා වූ ඉල්ලුම අඩු විය.

**රසායන ද්‍රව්‍ය හා රසායන ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදිත උප අංශය වසර තුළ දී මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්වීය.** වගා කටයුතු වලදී කාබනික පොහොර භාවිතය දිරි ගැන්වීම සඳහා රජය විසින් ගත් ක්‍රියාමාර්ග රසායනික

පොහොර සඳහා ඉල්ලුම අඩු වීමට හේතු විය. කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ සඳහන් වන පරිදි සබන්, සේදුම් කුඩු, තීන්ත හා වාර්නිෂ් නිෂ්පාදනය අඩුවීම රසායන ද්‍රව්‍ය හා රසායන ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන උප අංශයේ අඩුවීමට හේතු විය. ආනයනික භාණ්ඩ හේතුවෙන් වෙළෙඳපොළ තරගකාරීත්වය වැඩිවීම ද මෙම අඩුවීම සඳහා තරමක් දුරට හේතු විය.

**ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත 2013 වසරේ දී මන්දගාමී ක්‍රියාකාරිත්වයක් පෙන්වීය.** කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය මගින් නිරූපනය වන පරිදි උළු කැට වැනි මැටි ආශ්‍රිත ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදනය යහපත් වර්ධනයක් පෙන්නුම් කරන ලදී. පිඟන් මැටි හා සෙරමික් නිෂ්පාදන වසර තුළ දී අඩු වර්ධනයක් වාර්තා කළ අතර, ඉහළ බලශක්ති පිරිවැය හා මන්දගාමී අපනයන ඇණවුම් මෙම අඩු වර්ධනයට හේතු විය. තවද, දියමන්ති කැපීම, හැඩගැන්වීම හා ඔප දැමීමට, අදාළ නිෂ්පාදනය වසර තුළ දී අඩුවීමක් වාර්තා කරන ලදී.

**විදුලි උපකරණ උප අංශයේ නිෂ්පාදනය 2013 වසරේ දී සියයට 9.4 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.** ඉදිකිරීම් අංශයේ වර්ධනය සහ උසස් ගුණාත්මක නිෂ්පාදන සඳහා දේශීය හා ජාත්‍යන්තර ඉල්ලුම ඉහළ යාම, වසර තුළ දී විදුලි රැහැන් හා අනෙකුත් විදුලි උපකරණ නිෂ්පාදනය ඉහළ යාමට දායක විය. ළදරු අවධියක පවතින මෙම අංශයට, බඳු දිරිගැන්වීම් හා ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ස්ථාපිත සන්නාම ප්‍රතිරූපය හේතුවෙන් තවදුරටත් පුළුල් වීමට විශාල අවකාශයක් පවතී.

### කාර්මික ප්‍රතිපත්තිය සහ ආයතනික සහය

**රජයේ වර්තමාන කාර්මික ප්‍රතිපත්තිය ගෝලීය වශයෙන් තරගකාරී සහ දැනුම පදනම් කරගත් නිෂ්පාදන කර්මාන්ත අංශයක් ගොඩනැංවීමටත් ඒ තුළින් අපනයනවල එකතු කළ අගය ඉහළ නැංවීමටත් යොමු විය.** මේ සම්බන්ධයෙන්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් ඉක්මණින් වෙනස්වන සුළු දේශීය හා ගෝලීය පරිසරයක, ශ්‍රී ලංකාවේ කාර්මික අංශයේ තරගකාරිත්වය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා සිය උපායමාර්ගය යළි සකස් කර ඇත. කාර්මික අංශයේ තාක්ෂණය යොදා ගැනීම වර්ධනය කිරීම තුළින් හා ජාත්‍යන්තර වශයෙන් තරගකාරී, ඉහළ එකතු කළ අගයක් ඇති වෙළෙඳ නාම සහිත නිෂ්පාදන දිරිගැන්වීම තුළින් දැනට පවත්නා ශ්‍රමය මුල් කරගත් නිෂ්පාදන කර්මාන්තයන් දැනුම මත පදනම් වූ තාක්ෂණය මුල් කරගත් කර්මාන්ත බවට පරිවර්තනය කිරීම සඳහා විශාල ප්‍රයත්නයක් ගෙන ඇත. තවද, තාක්ෂණය යොදා ගැනීම, කාන්තා ව්‍යවසායකත්වය වර්ධනය කිරීම සහ දැරිය හැකි පිරිවැයකට මූල්‍ය සේවාවන් ලබා ගැනීමට ඇති හැකියාව වර්ධනය කිරීම තුළින් කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යවසායකයින් දියුණු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු විය.

**2013 වසර තුළ දී රජය විසින් රේඛීය අමාත්‍යාංශ සහ අනෙකුත් රාජ්‍ය ආයතන හරහා ප්‍රාදේශීය කර්මාන්ත සංවර්ධන ප්‍රතිපත්තීන් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය (MIC) විසින් සිය ප්‍රාදේශීය කර්මාන්ත සංවර්ධන වැඩසටහන් හරහා කාර්මික ජනපද පිහිටුවීම තුළින් ප්‍රාදේශීය කර්මාන්තවල යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම නිසා පැන නැගුනු ගැටලුවලට විසඳුම් ලබාදීම අඛණ්ඩව කරගෙන යන ලදී. කාර්මික ජනපද තුළ කර්මාන්තශාලා ස්ථාපිත කිරීමේ දී ඉඩම්, විදුලිය හා ජලය වැනි පොදු පහසුකම් සපයනු ලබන අතර බදු කුලී හා අනෙකුත් තීරුබදු මත සහන ලබාදීම සිදු කරන බැවින් කර්මාන්තකරුවන්ට දැරීමට සිදුවන මූලික පිරිවැය අඩුකර ගැනීමට මෙය රුකුලක් වේ. මෙම වැඩසටහන යටතේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය මේ දක්වා දිස්ත්‍රික්ක 18 ක කාර්මික ජනපද 27 ක් පිහිටුවා ඇත. 2013 වසරේ දී, මතුගම කාර්මික ජනපදයේ දෙවන අදියර සම්බන්ධයෙන් වූ ඉදිකිරීම් කටයුතු ආරම්භ කෙරිණි. උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල කර්මාන්තවලට අනුග්‍රහය දැක්වීම සඳහා "වඩක්කිල් වසන්තම්" හා "නැගෙනහිර නවෝදය" වැඩසටහන් හා සමගාමීව උතුරු හා නැගෙනහිර පළාත්වල ද කාර්මික ජනපද පිහිටුවනු ලැබීය. මේ අනුව, 2013 වසරේ දී ත්‍රිකුණාමලයේ ඉදිකෙරෙමින් පවතින කාර්මික ජනපදයේ දෙවන අදියරෙන් ආසන්න වශයෙන් සියයට හැත්තෑවක් පමණ නිම කරන ලද අතර, මන්නාරම කාර්මික ජනපදයේ සංවර්ධන කටයුතු දැනට සිදුවෙමින් පවතී. ලංකා ආයෝජන මණ්ඩලය (BOI) විසින්, රැකියා අවස්ථා 2,500 ක් සපයමින් මන්නාරම් දිස්ත්‍රික්කයේ පිහිටි කාර්මික ජනපදයේ ඇඟලුම් කර්මාන්ත 2 ක් පිහිටුවීම සඳහා අනුමැතිය ලබා දී ඇති අතර, මෙම කර්මාන්ත විසින් අත්හදාබැලීම් මට්ටමින් නිෂ්පාදන කටයුතු ආරම්භ කරන ලදී. මේ අතර, අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටි කාර්මික ජනපදයේ ඇඟළුම් කර්මාන්ත 3 ක ඉදිකිරීම් කටයුතු සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය පහසුකම් සලසන ලදී. තවද, වවුනියාව, මඩකලපුව, පල්ලෙකැලේ සහ මුලතිව් ඇතුළුව තවත් ස්ථාන ගණනාවක් කාර්මික ජනපද පිහිටුවීම සඳහා හඳුනාගෙන ඇත.

**2013 වසර තුළ දී, කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්තශාලා වැඩිදියුණු කිරීම තුළින් ප්‍රාදේශීය කාර්මීකරණය ප්‍රවර්ධනය සඳහා සම්ප්‍රදායික**

**කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය (MTISED) විසින් ක්‍රියාමාර්ග ගන්නා ලදී.** කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් සඳහා පිහිටුවීමට අපේක්ෂිත කාර්මික ජනපද පහෙන් පළමු ජනපදය වන අච්චුවේලි කාර්මික ජනපදයේ පුනරුත්ථාපනය සම්බන්ධයෙන් සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් තවදුරටත් කටයුතු කළේය. කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත සඳහා ම වෙන් වූ ඒකල, පල්ලේකැලේ, හොරණ, පන්නල සහ පානලුව ඇතුළත්ව ප්‍රධාන හා සුළු කාර්මික ජනපද 20 ක් 2013 වසර තුළ දී නවීකරණය කිරීමට ද සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය මූලික පියවර ගන්නා ලදී. මේ අතර, කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) යටතේ මන්නාරම, මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල පිහිටුවන ලද දිස්ත්‍රික්ක කාර්යාල 2013 වසරේ දී කටයුතු ආරම්භ කරන ලදී. මෙම දිස්ත්‍රික් කාර්යාල මගින් තාක්ෂණික, අලෙවිකරණ, ව්‍යවසායක සහ අනෙකුත් කර්මාන්ත ආශ්‍රිත අනුග්‍රාහක සේවා සැපයීම මගින් ස්වයං රැකියා ඒකක හා නව ව්‍යවසායකයින්ට උපකාරක සේවා ලබාදීමට සම්බන්ධ කටයුතුවල නිරත වී සිටියි.

**රජය, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) හරහා කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායක අංශයේ දියුණුව සඳහා වැඩසටහන් විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක කරන ලදී.** රටේ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින්ගේ කටයුතු අධීක්ෂණය කරන මධ්‍යම අධිකාරිය වන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) විසින් අවශ්‍ය පුහුණුවීම් හා හැකියා ප්‍රවර්ධනය සලසමින් කිරි නිෂ්පාදන හා මල් වැවීමේ අංශ සඳහා සංවර්ධන වැඩසටහන් මෙහෙයවන ලදී. තවද, ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා මූල්‍යමය සහාය ලබාදීම තුළින් රැකියා අපේක්ෂක උපාධිධාරීන් ව්‍යවසායකයින් බවට පත් කිරීමේ වැඩසටහනකට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් යොමු වන ලදී. තවද කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන තුළින් කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා ඉහළ අවධානයක් යොමු කරන ලදී. කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් ඔවුන්ගේ මූල්‍ය වගකීම් ඉටු කිරීමට අපොහොසත් වීම කෙරෙහි මූලික වශයෙන් හේතු වූයේ ව්‍යවසායකත්ව හැකියා නොමැතිකම බව හඳුනාගෙන ඇත. ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව (LDB) සහ ග්‍රාමීය සංවර්ධන බැංකුව (RDB) වැනි මූල්‍ය ආයතන හරහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුවීම් වැඩසටහන් පෙළක් ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් මෙහෙයවන ලදී. තවද, කුඩා හා මධ්‍යම ව්‍යාපාර ව්‍යවසායකයින්ගේ අපනයන වර්ධනය කිරීම සඳහා සුදුසු විදේශීය වෙළෙඳපොළ සොයාගැනීම සඳහා ව්‍යාපාර නියෝජිතයින්ට පහසුකම් සැලසීමට කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකත්ව මණ්ඩලය කටයුතු කළේය. මෙම වැඩසටහන යටතේ, 2013 වසරේ දී, බැංකොක් වෙළෙඳ ප්‍රදර්ශනය සඳහා පහළොස් දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක් සහභාගී විය. මේ අතර, 2013 වසර තුළ දී භූගෝලීය පර්ෂද සංවර්ධන වැඩසටහන් තුළින් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායක කර්මාන්ත නගාසිටුවීම අඛණ්ඩව ක්‍රියාත්මක විය. මෙම වැඩසටහන යටතේ, අමුද්‍රව්‍ය සුලබතාවය, සේවක කුසලතා සහ අනෙකුත් ස්ථානීය වාසි මත පදනම්ව තෝරා ගත් දිස්ත්‍රික්කවල ලීබඩු, කොහු, අත්කම්, සැහැල්ලු ඉංජිනේරු කර්මාන්ත හා අත්‍යන්ත්‍ර රෙදිපිළි කර්මාන්ත වැනි විශේෂ අංශ හඳුනා ගෙන අවශ්‍ය සහාය ලබාදෙන ලදී. කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින්ගේ ගැටලු, අදාල තීරණ ගන්නා පාර්ශ්වයන් වෙත, පළාත් මහ ලේකම් කාර්යාල මට්ටමේ දිස්ත්‍රික්ක ව්‍යවසායකත්ව සංසඳ හරහා යොමු කිරීම මගින් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින්ට සහය දක්වන්නා වූ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් ව්‍යවසාය සංසඳ වැඩසටහන 2013 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක වුණි. තවද, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකත්ව ප්‍රතිපත්තියක් ක්‍රමවත්ව සකස් කිරීම සඳහා ජර්මානු ෆෙඩරල් රජයේ GIZ හි සහය ඇතිව පියවර ගන්නා ලද අතර, ඊට අදාල ප්‍රතිපත්ති කෙටුම්පත සකස් කිරීම ද සම්පූර්ණ කර ඇත.

**2013 වසර තුළ දී, රටෙහි තාක්ෂණය පදනම් කරගත් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන් සංවර්ධනය කිරීම සඳහා ඉහළ අවධානයක් යොමු කරන ලදී.** තාක්ෂණය පදනම් කරගත් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින්ට සහය දැක්වීම සඳහා තාක්ෂණ සංවර්ධන අරමුදලක් පිහිටුවීමට අවශ්‍ය මූලික කටයුතු 2013 වසර තුළ දී ආරම්භ කරන ලදී. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ සහාය ඇතිව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය හා වයඹ විශ්ව විද්‍යාලය හා සම්බන්ධව, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ශිල්පීය ව්‍යවසාය ඉන්කියුබේටර හා තාක්ෂණික සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන පිහිටුවීමට මූලික පියවර ගන්නා ලදී. කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් කුඩා, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායක අංශවල කර්මාන්තකරුවන්ට ව්‍යාපාර ආරම්භ කිරීමට, පුළුල් කිරීමට හා නවීකරණය කිරීමට තාක්ෂණික අනුග්‍රහය දැක්වීම තුළින් මෙම අංශයට අඛණ්ඩව සහය දක්වන ලදී. මේ අනුව, කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් 2013 වසර තුළ දී ශ්‍රී ලංකාවේ කුඩා ව්‍යවසායකයින් හා සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණ දැනුම ලබාදීමේ වැඩසටහන් 192 ක් තුළින් තාක්ෂණික පුහුණුවීම සපයන ලදී.

**දිවයින පුරා පැතිර සිටින දේශීය කර්මාන්තකරුවන්ට සහයවීම පිණිස 2013 වසරේ දී කර්මාන්ත මණ්ඩලයන් මගින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.** මෙම වැඩසටහන් අතර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට සහයවීම පිණිස ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු, සල්පිල් සහ සම්මාන ලබාදීමේ උත්සව විය. වාණිජ බැංකුවක ප්‍රාදේශීය ශාඛා මගින් හඳුනා ගන්නා ලද කුඩා, සුළු හා මධ්‍යම පරිමාණයේ කර්මාන්ත සඳහා සේවා සපයමින්, ශ්‍රී ලංකා සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත මණ්ඩලය (SLCSMI) විසින් "ව්‍යාපාරික සවිය" වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. තවද, උතුරු පළාත ද ඇතුළත් වන ලෙසින් සුළු හා මධ්‍යම පරිමාණයේ කර්මාන්ත අංශයේ කර්මාන්තකරුවන් වෙනුවෙන් "කර්මාන්ත විශිෂ්ටතා සම්මාන 2013" නමින් උළෙලක් ද ශ්‍රී ලංකා සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත මණ්ඩලය විසින් පවත්වන ලදී.

**ඵලදායීතාව වැඩිදියුණු කිරීම සහ නාස්තිය අවම කිරීම සඳහා 2013 වසර තුළ දී රාජ්‍ය ආයතන විසින් විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබීය.** බලශක්ති විගණනය සහ තාක්ෂණික විසඳුම් ක්‍රියාත්මක කිරීම මගින් තෝරාගත් කර්මාන්තශාලා තුළ ඵලදායීතාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන් සහ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් තවදුරටත් පවත්වාගෙන යාමට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය පියවර ගන්නා ලදී. මේ අතර, කාර්මික අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් යටතේ දංකොටුව කාර්මික ජනපදය තුළ විශේෂ සමීක්ෂණයක් පවත්වන ලද අතර, ඒ සඳහා අවශ්‍ය පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කරන ලදී. 2013 වසරේ දී ශ්‍රී ලංකා රෙදිපිළි සහ ඇඟළුම් ආයතනය (SLITA) විසින් රෙදිපිළි, ඇඟළුම් සහ පාවහන් අංශයන්හි සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් සඳහා ඵලදායීතාව වැඩිදියුණු කිරීමේ සහ කුසලතා සංවර්ධන පුහුණු කිරීමේ වැඩසටහන් ගණනාවක් ම පවත්වන ලදී.

**රජය විසින්, 2014 අයවැය මගින් දේශීය කර්මාන්ත පුළුල් කිරීමටත්, දේශීයව අගය එකතු කිරීම දිරිමත් කිරීමටත් පියවර ගණනාවක් ගන්නා ලදී.** දේශීයව අගය එකතු කිරීම දිරිමත් කිරීම සඳහා ආහාර, පාන වර්ග, රසායන ද්‍රව්‍ය, රබර්, මූලික ලෝහ සහ සකස් කළ ලෝහ යන අංශයන්හි තෝරාගත් නිෂ්පාදන ආනයනය මත අය කරන සෙස් බදු අනුපාතිකයන් ඉහළ නංවන ලදී. කෘෂිකාර්මික අංශයේ පූර්ව ක්‍රියාවලීන් සම්බන්ධීකරණය දිරිමත් කිරීම හා බැර කර්මාන්ත අංශයෙහි දේශීය අගය එකතු කිරීම දිරිමත් කිරීම අරමුණු කරමින් තේ කම්හල්වල භාවිතා වන යන්ත්‍රෝපකරණ, ට්‍රැක්ටර් සහ වීල්බැරෝ ආනයනයේ දී පනවන ලද තීරු බදු ද ඉහළ නංවන ලදී. එලෙසින් ම, දේශීය බෝට්ටු නිෂ්පාදන කර්මාන්තය දිරිමත් කිරීම සඳහා ආනයනික බෝට්ටු මත තීරු බදු ඉහළ නංවන ලදී. තවද, රසකැවිලි වර්ග සහ සන්නාම සහිත අයිතමයන් වැනි තෝරාගත් කර්මාන්ත සඳහා යොදාගන්නා අමුද්‍රව්‍ය ආනයනය මත වන තීරුබදු ද පහත දමන ලදී. බලශක්ති සංරක්ෂණ සහ හරිත නිෂ්පාදන ක්‍රමවේදයන් දිරිමත් කිරීම පිණිස සූර්ය ආරක්ෂක පටල ආනයනයන් තීරුබදු වලින් නිදහස් කරන ලදී. බටර්, යෝගට්, කරවල, හාල්මැස්සන්, ටින් මාළු සහ උම්බලකඩ නිෂ්පාදනයේ යෙදෙන සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තයන් නගා සිටුවීමටත්, දේශීය ආදේශක සඳහා ඇති ඉල්ලුම ඉහළ නැංවීමටත්, එවැනි භාණ්ඩ ආනයන මත වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉහළ දමන ලදී. ඉදිකිරීම් ආශ්‍රිත අමුද්‍රව්‍ය සහ උපාංග නිෂ්පාදනයේ නිරත දේශීය කර්මාන්ත නගාසිටුවීම අරමුණු කර ගනිමින් ආයෝජන මණ්ඩල ව්‍යාපෘති විසින් ආනයනය කරන භාණ්ඩ සඳහා ඍණාත්මක ලැයිස්තුවක් ඇති කරන ලදී.

**රජය, සිය විද්‍යා හා තාක්ෂණික ප්‍රතිපත්තියට අනුකූලව අධිතාක්ෂණික කාර්මික අපනයන ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගනිමින් ශිල්පීය ව්‍යවසාය පරිසරයක් ඇති කිරීම උදෙසා පියවර ගන්නා ලදී.** ඒ අනුව, ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා, තාක්ෂණික සහ නවීකරණ උපායමාර්ගයට අනුකූලව එකතු කළ අගය වැඩි කිරීම සහ වාණිජකරණය ඉහළ නැංවීමේ අරමුණින්, විද්‍යා, තාක්ෂණික සහ නවීකරණ සම්බන්ධීකරණය හා අධීක්ෂණය සඳහා පහසුකම් සැලසීම උදෙසා, විද්‍යා, තාක්ෂණික සහ නවීකරණ සම්බන්ධීකරණ කාර්යාලයක් (COSTI) පිහිටුවන ලදී. කැනඩාවේ ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයේ මූල්‍යාධාර ඇතිව ජාතික විද්‍යා පදනම (NSF) විසින් සකස් කරන ලද, නැනෝතාක්ෂණික සොයා ගැනීම් සහ අදාළ නව නිපැයුම් සම්බන්ධ ජාතික නීතිමය රාමුව, 2013 වසර මැයි මස දී සම්පූර්ණ කරන ලදී. උපායමාර්ගික ලෙස පර්යේෂණ සහ සංවර්ධන කටයුතු කිරීම අරමුණු කර ගනිමින් පිහිටුවන ලද සර්ව සම්පූර්ණ නැනෝතාක්ෂණික විශිෂ්ටත්ව මධ්‍යස්ථානයක් (NCE) සමග නැනෝවිද්‍යා උද්‍යානය 2013 ඔක්තෝබර් මස හෝමාගම දී විවෘත කරන ලදී. නැනෝවිද්‍යා උද්‍යානය මගින් මේ වනවිට සිදුකර ඇති පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ප්‍රධාන වශයෙන් ඇඟළුම්, කෘෂිකාර්මික, ඖෂධීය ආහාර, ජල පිරිපහදුව සහ ඛනිජ සම්පත් යන ක්ෂේත්‍ර ආවරණය කර ඇත. 2013 වසර අවසානය වනවිට, නැනෝවිද්‍යා උද්‍යානය විසින් ජාත්‍යන්තර සහ දේශීය පේටන්ට් බලපත්‍ර කිහිපයක් ම අත්පත් කරගෙන ඇති අතර, එක් නිෂ්පාදනයක නියමු නිෂ්පාදන කටයුතු අරඹා ඇත.

**ඇඟළුම් අංශය සංවර්ධනය කිරීමේ උපායමාර්ග සැකසීම පිණිස ඒකාබද්ධ ඇඟළුම් සංගමය (JAAF) විශේෂ කාර්යභාරයක් ඉටු කළේය.** නිෂ්පාදන පිරිවැය අඩු රටවලින් නිරන්තර අභියෝගයට ලක්වන ඇඟළුම් කර්මාන්තය, නිදහස් වරාය ක්‍රියාකාරකම් ඇරඹීම සහ චීනය හා ශ්‍රී ලංකාව අතර යෝජිත නව නිදහස් වෙළෙඳ ගිවිසුම යන කරුණු මෙන්ම, කර්මාන්තකරුවන් විසින් ක්‍රියාත්මක කරන ලද වියදම් කපාහැරීමේ සහ බලශක්ති පිරිමැසීමේ ක්‍රියාමාර්ගවලින් ද ප්‍රතිලාභ ලබනු ඇතැයි අපේක්ෂා කෙරේ. කොළඹ නිදහස් වරායේ අන්තරාල වෙළෙඳ කටයුතු සඳහා පහසුකම් සලසනු ඇතැයි අපේක්ෂා කරන අතර මේ තුළින් අසල්වැසි රටවලින් ශ්‍රී ලංකාවට නව ව්‍යාපාරික අවස්ථා ආකර්ෂණය වනු ඇත. චීනය සහ ජපානය වැනි රටවල් සමග ඇති කරගත් වෙළෙඳ සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කරගැනීමෙන් ශ්‍රී ලාංකික ඇඟළුම් අපනයන සඳහා නව වෙළෙඳපොළවල් විවෘත වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**ශ්‍රී ලංකාව වාණිජ මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම උදෙසා වන නීතිමය රාමුව 2013 වසරේ දී නීතිගත කරන ලදී.** ඒ අනුව, 2013 අංක 12 දරන මුදල් පනත නීතිගත කිරීමෙන් අනතුරුව, 2013 අංක 1 දරන මුදල් පනත - වාණිජ මධ්‍යස්ථාන රෙගුලාසිය ගැසට් පත්‍රයක් ලෙස පළ කරන ලදී. මෙම රෙගුලාසිය මගින් කොළඹ සහ හම්බන්තොට වරායන් නිදහස් වරායන් ලෙසත්, කටුනායක, කොග්ගල සහ මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයන් සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල බන්ධිත ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇත. මේ අතරින් මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල විශේෂිත බන්ධිත ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇති අතර, අන්තරාල වෙළෙඳ කටයුතු සඳහා විශේෂයෙන් වෙන්කර ඇත. කටුනායක සහ කොග්ගල අපනයන සැකසුම් කලාපයන් නම් කරන ලද බන්ධිත ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇති අතර, නිදහස් වරාය සහ බන්ධිත ප්‍රදේශවලට අදාල සියළු ක්‍රියාකාරකම් සඳහා විවෘත වනු ඇත. අන්තරාල වෙළෙඳ කටයුතු, සැලසුම්, සංවිධායක හා මෙහෙයුම් සේවා සහ බහුපාර්ශ්වික ඒකාබද්ධ කිරීම, අක්වෙරළ වෙළෙඳාම, විදේශීය සේවාදායකයන් සඳහා ඉදිරි පෙළ සේවා සහ බිල්පත් කටයුතු හා මූල්‍ය සැපයුම් දාමය කළමනාකරණය සඳහා මූලස්ථානය පවත්වාගෙන යාමට පහසුකම් සැපයීම සඳහා නිදහස් වරාය සහ බන්ධිත ප්‍රදේශ පිහිටුවා ඇත. මුළු ආයෝජනයෙන් අවම වශයෙන් සියයට හැට පහක් වත් විදේශ මූලාශ්‍රවලින් සමන්විත වන හා මුළු පිරිවැටුම ම භාණ්ඩ හා සේවා අපනයනයෙන් සමන්විත වන, ඉහත කාර්යයන් සඳහා ශ්‍රී ලංකාව තුළ අලුතින් සංස්ථාගත කරන ලද හෝ අලුතින් පිහිටුවන ලද ඕනෑ ම ආයතනයක්, තීරුබදු, එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු, විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු, වරාය සහ ගුවන් තොටුපොල සංවර්ධන බදු සහ නිෂ්පාදන බදු වලින් ද, විනිමය පාලන සහ වෙළෙඳ විධි විධාන වලින් ද නිදහස් කිරීම් සඳහා හිමිකම් ලබයි.

**අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) විසින් අපනයන ප්‍රවර්ධනය සඳහා වූ සිය ක්‍රියාකාරකම් 2013 වසරේ දී තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී.** අපනයන සංවර්ධන මණ්ඩලය 2013 වසර තුළ දී වෙළෙඳ සල්පිල් සහ ප්‍රදර්ශන සඳහා සහභාගි වූ අතර, වෙළෙඳපොළ විවිධාංගීකරණ උපායමාර්ගයන් හි නිරත විය. ඒ අනුව, යුරෝපීය වෙළෙඳපොළින් වූ මන්දගාමී ඉල්ලුම හමුවේ අපනයන සංවර්ධන මණ්ඩලය බෝට්ටු ඉදිකිරීමේ තාක්ෂණ ආයතනය හා සම්බන්ධව බෝට්ටු ඉදිකිරීමේ කර්මාන්තය සඳහා නව වෙළෙඳපොළ ආකර්ෂණය කර ගැනීම කෙරෙහි යොමු විය. තවද, ඉලෙක්ට්‍රොනික කර්මාන්තයේ ගෝලීය ප්‍රශස්ත භාවිතයන් පිළිබඳ දැනුම වැඩි කිරීම තුළින්, ඉලෙක්ට්‍රොනික අංශයේ අපනයනයන් ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන අපනයනකරුවන් සඳහා IPC[2] තාක්ෂණ හමුව කොළඹ දී සංවිධානය කරන ලදී.

**මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය දියුණු කිරීම සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (NGJA) 2013 වසරේ දී පියවර රැසක් ගන්නා ලදී.** මෙම අංශයේ කර්මාන්තකරුවන් මුහුණ දෙන විවිධ අභියෝග මධ්‍යයේ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය එක්සත් ජනපදය, චීනය, ඉන්දියාව සහ සිංගප්පූරුව වැනි රටවල පැවැති සල්පිල් සහ ප්‍රදර්ශන වලදී දේශීය නිෂ්පාදන ප්‍රවර්ධනයට ක්‍රියා කරන ලද අතර, ශ්‍රී ලංකා-චීන ද්විපාර්ශ්වික වෙළෙඳ ගිවිසුම අත්සන් කිරීමත් සමග මෙරට මැණික් චීනයට අපනයනය කිරීමට වැඩි අවස්ථාවක් ලබා ගැනීම සඳහා ද සාකච්ඡා කරමින් පවතී. මේ අතර, ජාත්‍යන්තර තත්ත්වයේ නවීන සහ කාර්යක්ෂම විද්‍යාගාර උපකරණ සවිකිරීම මගින් මැණික් පරීක්ෂණාගාරවල තත්ත්වය ඉහළ නැංවීම සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් පියවර ගන්නා ලදී.

[2] IPC යනු සැකසූ පරිපථ පුවරු සහ ඉලෙක්ට්‍රොනික එකලස් කිරීමේ කර්මාන්ත සහ ඔවුන්ගේ ගනුදෙනුකරුවන් හා සැපයුම්කරුවන් වෙත සේවා සපයන ගෝලීය වෙළෙඳ සංවිධානයකි. මෙම සංවිධානය කර්මාන්තයේ ප්‍රමිති, පුහුණුකිරීම්, වෙළෙඳපොළ සමීක්ෂණ සහ පොදු ප්‍රතිපත්ති උපදේශන සඳහා ප්‍රමුඛතම මූලාශ්‍රයයි.

යාන්ත්‍රිකව මැණික් ගැරීමේ කටයුතු සඳහා අනුමැති ලබාදීමට සහ තාක්ෂණික උපදේශන සේවා ලබාදීම තුළින් ද නීතිරීති සහ විධිවිධාන සැකසීම සහ බලපැවැත්වීම මගින් පරිසර හිතකාමී ලෙස මැණික් ගැරීමේ කටයුතු කිරීම දිරිමත් කිරීම සඳහා 2012 වසරේ දී ගන්නා ලද පියවර 2013 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. තවද, මැණික් ගැරීමේ කටයුතු හේතුවෙන් පරිසරයට හානි සිදු වූ ප්‍රදේශ පුනරුත්ථාපනය කිරීමට හා රැක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මෙම අධිකාරිය විසින් පියවර ගන්නා ලදී. එසේම, මෙම අංශයේ නිෂ්පාදන වැඩි කිරීම සඳහා සුළු හා මධ්‍යම පරිමාණ ස්වර්ණාභරණ නිෂ්පාදකයින්ගෙන් සමන්විත සාමාජිකත්වය අතර බෙදාහැරීම පිණිස නවීන යන්ත්‍රෝපකරණ, මෙවලම් සහ උපකරණ පරිත්‍යාග කිරීම සඳහා වයඹ ස්වර්ණාභරණ ශිල්පීන්ගේ සංගමය මෙම අධිකාරිය මගින් තෝරාගෙන ඇත.

#### ගෘහ කර්මාන්ත

**ව්‍යවසායකත්වය වර්ධනය කිරීම සඳහා රජය ගත් ක්‍රියාමාර්ගයෙහි ප්‍රතිලාභ පෙන්නුම් කරමින් ගෘහ කර්මාන්ත උප අංශය 2012 වසරේ දී අත්කරගත් සියයට 4.6 ක වර්ධනයට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 5.1 කින් වර්ධනය විය.** සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය මගින් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සහ ජාතික ශිල්ප සභාව වැනි සිය වැඩසටහන් ක්‍රියාත්මක කරන ආයතන හරහා මෙහෙයවනු ලැබූ විවිධ ව්‍යාපෘති මගින් ක්‍රියාත්මක කළ විවිධ වැඩසටහන් මෙම උප අංශයේ වර්ධනය රඳවා ගැනීමට බෙහෙවින් දායක විය. එසේම, දිවයිනේ නොයෙකුත් පළාත්වල පැවැති ජාතික මෙන්ම දිස්ත්‍රික් මට්ටමේ ප්‍රදර්ශන සහ වෙළෙඳ ප්‍රදර්ශන මගින් නව වෙළෙඳපොළවල් කරා පිවිසීමට මෙන්ම දැනුම හා තාක්ෂණය ලබාදීම ඇතුළුව මූල්‍ය සේවා හා පුහුණු කිරීමේ අවස්ථා සැපයීම ද සිදු විය. තවද, 2016 වසර වනවිට තිරසාර ගෘහ කර්මාන්ත 60,000 ක් පිහිටුවීම සඳහා වන රජයේ අරමුණ අනුව දියත් කරන ලද ජාතික නිෂ්පාදන කර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන සහ සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය වැනි ව්‍යාපෘතීන් ද මෙම උප අංශයේ වර්ධනය පවත්වා ගැනීමට දායක විය. එසේම, ගෘහ කර්මාන්ත පිළිබඳව 'දිවි නැගුම' ජාතික වැඩසටහන මගින් යෝජිත ප්‍රතිපත්තීන් ද මෙම උප අංශයේ ධනාත්මක වර්ධන ගාමකත්වය තවදුරටත් පවත්වාගෙන යාම සඳහා උපකාරී වනු ඇත.

#### විදුලිය, ගෑස් සහ ජලය

**විදුලිය, ගෑස් සහ ජලය උප අංශය 2012 වසරේ දී වාර්තා කළ සියයට 4.2 ක වර්ධනයට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 10.3 කින් වර්ධනය විය.** මෙම උප අංශය සඳහා විශාලතම දායකත්වය සපයන විදුලිය උප අංශයෙහි එකතු කළ වටිනාකම සියයට 11.3 කින් ඉහළ යාම, මෙම වර්ධනය කෙරෙහි බෙහෙවින් ඉවහල් විය. වර්ෂය තුළ පැවැති හිතකර කාලගුණික තත්ත්වය හේතුවෙන් ජල විදුලිබල උත්පාදනය මත පැවැති දැඩි රැඳියාව සහ පෙර වසරේ අඩු නිෂ්පාදන පදනම හේතුවෙන් ජල විදුලිබල උත්පාදනයෙහි වූ සියයට 110.1 ක සුවිශේෂී වර්ධනය මෙන්ම ඉහළ පිරිවැයකින් යුත් තාප විදුලිබල ජනනය සියයට 42.8 කින් පහළ වැටීම ද මෙම අංශයේ එකතු කළ අගය ඉහළ යාමට හේතු විය. තවද, 2012 වසරේ දෙවන භාගයේ දී, ඉහළ කොත්මලේ ජල විදුලිබලාගාරය ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කිරීම ද විදුලිය උප අංශයෙහි එකතු කළ අගය ඉහළ යාම කෙරෙහි දායක විය. මේ අතර, පසුගිය වසර තුළ ගෑස් උප අංශය සියයට 1.6 කින් ප්‍රසාරණය වූ අතර කාර්මික අංශයේ ගෑස් පරිභෝජනය ඉහළ යාම මෙම වැඩි වීමට ප්‍රධාන ලෙසම දායක විය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් බෙදාහරින ලද ජල පරිමාව සියයට 2.8 කින් ඉහළ යාම සහ පාරිභෝගික ගිණුම් සංඛ්‍යාව සියයට 7.6 කින් ඉහළ යාම ජලය උප අංශයෙහි එකතු කළ අගය සියයට 3.8 කින් වර්ධනය වීමට දායක විය. එමෙන්ම, ජල පිරිපහදු බලාගාර ස්ථාපනය ද නව ජල සැපයුම් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම ද මෙම උප අංශයෙහි එකතු කළ අගය වර්ධනය කෙරෙහි තවදුරටත් දායක වනු ඇත.

#### ඉදිකිරීම්

**ඉදිකිරීම් උප අංශය එහි වර්ධන ගාමකත්වය අඛණ්ඩව පවත්වා ගනිමින්, 2012 වසරේ වාර්තා කළ සියයට 21.6 ක සුවිශේෂී වර්ධනයට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 14.4 ක වර්ධනයක් වාර්තා කර ඇත.** මහාමාර්ග, දුම්රිය මාර්ග මෙන්ම දක්ෂිණ අධිවේගී මාර්ගයේ දෙවන අදියර, කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය, කොළඹ පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතිය සහ උතුරු දුම්රිය මාර්ග ව්‍යාපෘතිය වැනි ප්‍රවාහන අංශයේ සංවර්ධන ව්‍යාපෘති හා වරාය සංවර්ධන ව්‍යාපෘති සඳහා වූ රාජ්‍ය අංශයේ ආයෝජන මෙම වර්ධනය සඳහා දායක විය. තවද, මාර්ග ජාලය වැඩිදියුණු කිරීම සහ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතීන් ද සමග 'මග නැගුම' හා 'ගම නැගුම' වැනි සාර්ව සහභාගිත්වයක් සහිත ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම දිරිගැන්වීම අරමුණු කරගත් ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන

**විශේෂ සටහන 2**

## ජාතික ගිණුම් සම්පාදනය

යම් කාලපරිච්ඡේදයක් තුළ රටක සිදුවූ ආර්ථික ප්‍රගතිය නිර්ණය කිරීමේ අවශ්‍යතාවය මූලික කොට ගෙන ජාතික ගිණුම් ඇස්තමේන්තු පිළියෙළ කිරීම ආරම්භ විය. මෙම මූල්‍ය ඇස්තමේන්තු මගින් ආර්ථිකයේ සියලු ගනුදෙනුවල ක්‍රමවත් සාරාංශයක් සහ ආංශික විභේදනය විදහා දැක්වෙන අතර, ආර්ථිකයේ විවිධ අංශයන්ගේ වර්ධනයන් හඳුනා ගැනීම සඳහා පදනමක් සපයනු ලැබේ. තවද, යෝග්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට මෙන්ම ලෝකයේ විවිධ ආර්ථිකයන් සංසන්දනය කිරීමේදී ද මෙම ඇස්තමේන්තු වැදගත් වෙයි. වසර 1947 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රකාශයට පත්කරන ලද ජාතික ආදායම මැනීම සහ සමාජ ගිණුම් විග්‍රහය (1947 වාර්තාව) මගින් ජාතික ගිණුම් සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය වඩාත් විධිමත් කරන ලදී.

### ජාතික ගිණුම් ක්‍රමවේදයේ (ජා.ගි.ක්‍ර.) විකසනය

1947 වාර්තාවෙන් අනතුරුව වසර 1953 දී වඩාත් විස්තීරණ ලෙස සම්මත ගිණුම් සහ වගු ඇතුළත් වන පරිදි ජාතික ගිණුම් ක්‍රමවේදයක් (1953 ජා.ගි.ක්‍ර.) එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත්කරන ලද අතර, එහිදී ජා.ගි.ක්‍ර. තුළ පුළුල්ව භාවිතා වන සංකල්ප සහ නිර්වචන ගෙනහැර දක්වා තිබුණි. පසුකාලීනව, 1953 ජා.ගි.ක්‍ර. ක්‍රියාවට නැංවීමේ දී ඒ ඒ රටවල් ලද අත්දැකීම් සැලකිල්ලට ගනිමින් 1960 දී ප්‍රතිශෝධිත ජා.ගි.ක්‍ර. නිකුත් කරනු ලැබිණි. එසේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ.අ.) ගෙවුම් තුලන අත්පොත සමග ජා.ගි.ක්‍ර. තවදුරටත් සංගත වන පරිදි 1964 දී තවදුරටත් සංශෝධිත ජා.ගි.ක්‍ර ප්‍රකාශයට පත්කෙරිණි. අනතුරුව, 1968 ජා.ගි.ක්‍ර. මගින් යෙදවුම්-නිමැවුම් වගු සහ ශේෂ පත්‍රය ඇතුළත් කරමින් ජාතික ගිණුම් සම්පාදනයේ පරාසය පුළුල් කරන ලද අතර, ස්ථාවර මිල මට්ටම් අනුව ඇස්තමේන්තු පිළියෙළ කිරීමේ වැදගත්කම ද ඉහළ නංවා තිබුණි. පසුකාලීනව, 1993 දී ජාතික ගිණුම් සංඛ්‍යාලේඛනයන්ගේ වැදගත් ඉදිරි පියවරක් සනිටුහන් කරමින් අනිකුත් ජාත්‍යන්තර සංඛ්‍යාන සම්මුතීන් හා අනුකූල වන පරිදි නවතම සංස්කරණයක් හඳුන්වා දෙනු ලැබීය. 1993 ජා.ගි.ක්‍ර. මගින් ජාතික ගිණුම් සම්පාදනය සඳහා අනුක්‍රමික ගිණුම් පද්ධතියක් නිර්දේශ කරනු ලැබූ අතර, සම්පූර්ණ ක්‍රමවේදය වර්තන ගිණුම්, සමුච්ඡන ගිණුම් සහ ශේෂ පත්‍රය ලෙස මූලික කොටස් තුනකට වර්ග කර ඇත. මෙහිදී සුලභ ලෙස භාවිතයට ගැනෙන වර්තන ගිණුම් වැදගත් කොට සැලකිය හැක. ඒ අනුව, වර්තන ගිණුම්, දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) ඇස්තමේන්තු කිරීමට භාවිතා කරන නිෂ්පාදන ගිණුමෙන් ආරම්භ වී ආර්ථිකය විසින් උත්පාදනය කරන ලද මුළු වැය කළ හැකි ආදායම මනිනු ලබන ආදායම් බෙදී යාමේ ගිණුම් ඔස්සේ ආර්ථිකයේ මුළු වියදම සහ ඉතුරුම් ඇස්තමේන්තු කරන ආදායම් භාවිත ගිණුමෙන් අවසන් වේ. ද.දේ.නි. අගය, එම නිෂ්පාදනයෙන් උපයාගත් ආදායමටත් එම නිෂ්පාදනය සඳහා කළ වියදමටත් සමාන වන බැවින් කුමන වර්තන ගිණුම ඔස්සේ වුව ද ඇස්තමේන්තු කරනු ලබන අවසාන වටිනාකම සිද්ධාන්තමය වශයෙන් සමාන විය යුතුය. 2008 නවතම ජා.ගි.ක්‍ර., එහි 1993 සංග්‍රහයේම යාවත්කාලීන කරන ලද සංස්කරණයක් වන අතර, එමගින් ආර්ථික පරිසරයෙහි ඇති වූ වෙනස්කම්, ක්‍රමවේදී පර්යේෂණයන්ගේ සිදුවූ දියුණුව සහ පරිශීලනයේදී ඇතිවන අවශ්‍යතා ආදිය සැලකිල්ලට ගනිමින් පිළියෙළ කරන ලදී.

### ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් සම්පාදනය

රජයේ සංඛ්‍යාලේඛන පිළිබඳ නියෝජිත ආයතනය වශයෙන් ජාතික ගිණුම් සංඛ්‍යාලේඛන ද ඇතුළත්ව ශ්‍රී ලංකාව පිළිබඳ බොහොමයක් සංඛ්‍යාලේඛන පිළිබඳ දත්ත රැස් කිරීම, සම්පාදනය කිරීම සහ දත්ත බෙදාහැරීම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (ජ.සං.දෙ.) සතු වගකීමකි. ක්‍රමානුකූල ලෙස ජාතික ගිණුම් ඇස්තමේන්තු කිරීම 'ලංකාවේ ජාතික ආදායම' පිළියෙළ කිරීමත් සමගම වසර 1947 දී ආරම්භ වූ අතර, එම ඇස්තමේන්තු ජ.සං.දෙ. හි සංඛ්‍යාන නිබන්ධනයේ සහ එක්සත් ජාතීන්ගේ ජාතික ගිණුම් පිළිබඳ වාර්ෂික සංග්‍රහයේ වරින් වර ප්‍රකාශයට පත්කරන ලදී. එහෙත් 1970 වසරේ සිට ජ.සං.දෙ. විසින් අදාළ ඇස්තමේන්තු ප්‍රකාශයට පත් කිරීමට ගතවන කාලය අඩු කරමින් නව ප්‍රකාශනයක් ලෙස ජාතික ගිණුම් විවරණිකාවක් නිකුත් කිරීම ආරම්භ කරන ලදී. කෙසේ වුවද, මෙම මුල් ප්‍රයත්නයන් තුළ ද.දේ.නි., දළ දේශීය වියදම (ද.දේ.වි.), ආනයන, අපනයන වැනි සංඛ්‍යාලේඛන කිහිපයක් පමණක් අඩංගු විය. 1953 ජා.ගි.ක්‍ර. පළ කිරීමෙන් අනතුරුව ජ.සං.දෙ. විසින් සිය ජාතික ගිණුම් ඇස්තමේන්තු ක්‍රියාවලිය තවදුරටත් වැඩිදියුණු කරමින් යාවත්කාලීන කරන ලද අතර, එහිදී සංක්ෂිප්ත වගු සමගින් නිෂ්පාදන, පරිභෝජන, සමුච්ඡන සහ විදේශ ගනුදෙනු ආදිය පිළිබඳ දත්ත වගු වාර්තා කරන ලදී. පසුකාලීනව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ආසියානු සංවර්ධන බැංකුව වැනි විදේශීය ආයතනවල අනුග්‍රහය සහිතව ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් සංඛ්‍යානයන් ජා.ගි.ක්‍ර. අනුව ගොඩනැගුණු සංකල්ප, අර්ථ විග්‍රහ සහ ආර්ථික ක්‍රියාකාරකම්වල වර්ගීකරණයන්ට අනුගත වන පරිදි අඛණ්ඩව වැඩිදියුණු වූ අතර පදනම් වර්ෂයන් ද මෙම කාලපරාසය තුළ සුදුසු පරිදි ප්‍රතිශෝධනය කරන ලදී. තවද, ශ්‍රී ලංකාව මේ වනවිට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ IV වන ප්‍රඥප්තියේ අවශ්‍යතාවන්ට අනුව සාමාන්‍ය දත්ත බෙදාහැරීමේ ක්‍රමය (General Data Dissemination System) යටතේ

දත්ත සැපයීම සිදු කරනු ලබන අතර, දත්ත සැපයීමේ කාලපරාසය අඩු වීම සහ දත්තවල කාලීන ස්වභාවය දියුණු වීමත් සමගම ශ්‍රී ලංකාව විශේෂ දත්ත බෙදාහැරීමේ සම්මතය (Special Data Dissemination Standard) යටතේ දත්ත සපයනු ලබන රටක් බවට වැඩිදියුණු වීමට නියමිතය. එසේම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ IV වන ප්‍රඥප්තියට අනුව සාමාජික රටවල දත්ත සම්බන්ධ කරුණු පිළිබඳව ජා.මූ.අ. වාර්ෂිකව දූත මණ්ඩල සාකච්ඡා පවත්වනු ලබන අතර, ඉන් අනතුරුව සාමාන්‍යයෙන් සියලුම රටවලට අදාළව දත්තයන්ගේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශයන් ඉදිරිපත් කරනු ලැබෙයි.

**ජාතික ගිණුම් සම්පාදන ක්‍රියාවලිය**

ජාතික ගිණුම් සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීමේ දී තොරතුරු එක්රැස් කිරීම සහ සම්පාදනය කිරීමේ දී මෙන්ම නියමිත කාලය තුළ දී ප්‍රකාශයට පත්කිරීමට ඇස්තමේන්තු පිළියෙළ කිරීම ඉතා සංකීර්ණ ක්‍රියාවලියක් වන අතර ඒ සඳහා අදාළ තාක්ෂණික කුසලතාවයන්ගේ ප්‍රවීණත්වය අවශ්‍ය වේ. ජ.සං.දෙ. සිය දත්ත එක්රැස් කිරීමේ ජාලය විමධ්‍යගත කර ඇති අතර ඒ අනුව ප්‍රධාන කාර්යාලයේ අනෙකුත් අංශයන්ගෙන් හා ශාඛා කාර්යාලවලින් මෙන්ම විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් සභා ආදියේ රඳවා සිටින දෙපාර්තමේන්තු නිලධාරීන්ගෙන් මෙන්ම බාහිර මූලාශ්‍ර මගින් ද ජාතික ගිණුම් සංඛ්‍යාලේඛන සම්පාදනය සඳහා දත්ත එක්රැස් කරනු ලැබෙයි. තවද, කුටුම්බ ආදායම් හා වියදම් සමීක්ෂණය (HIES), ඉදිකිරීම් කර්මාන්ත පිළිබඳ සමීක්ෂණය, වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය සහ කෘෂිකර්ම සංගණනය වැනි ජ.සං.දෙ. ක්ෂේත්‍ර අධ්‍යයනයන්ගෙන් ද ජාතික ගිණුම් සම්පාදනයට අවශ්‍ය තොරතුරු සපයනු ලැබෙයි. මෙම සමීක්ෂණයන්ට අමතරව ඒ ඒ අංශයන්ට අදාළ විශේෂිත තොරතුරු විශාල ප්‍රමාණයක් රට පුරා විවිධ ආයතනවලින් එක්රැස් කරගනු ලැබේ.

දත්ත එක්රැස් කිරීමේ ක්‍රියාවලියෙන් අනතුරුව ජාතික ගිණුම් ක්‍රමවේදයට අනුව ඇස්තමේන්තු සම්පාදනය කිරීම සඳහා තාක්ෂණික ප්‍රවීණතාවයකින් යුතු වෘත්තිකයන් සම්බන්ධ වෙයි. තවද, 2013 ජා.මූ.අ. තාක්ෂණික දූත මෙහෙවරෙහි දී, 1993/2008 ජා.ගි.ක්‍ර. ක්‍රියාත්මක කිරීමට අදාළව අවම දත්ත කට්ටලවල අවශ්‍යතාවලින් බොහොමයක් මේ වනවිට ශ්‍රී ලංකාව සපුරා ගෙන ඇති බව හඳුනා ගෙන ඇති අතර, එම අවශ්‍ය තොරතුරු බොහොමයක් සපයා ගැනීම සඳහා දැනටමත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

දැනට ජ.සං.දෙ. නිමැවුම් ප්‍රවේශයෙන් මෙන්ම වියදම් ප්‍රවේශයෙන් ද වාර්ෂික ඇස්තමේන්තු සම්පාදනය කරන අතර, කාර්තුමය ඇස්තමේන්තු නිමැවුම් ප්‍රවේශයෙන් පමණක් ඇස්තමේන්තු කෙරේ. අදාළ ඇස්තමේන්තු පවත්නා මිලට මෙන්ම ස්ථාවර මිලට ද ගණනය කෙරෙන අතර, ප්‍රථමයෙන් පවතින දත්තවලට අනුව තාවකාලික ඇස්තමේන්තු අදාළ කාලය තුළ දී ඉදිරිපත් කර අනතුරුව වඩාත් තහවුරු වූ දත්ත මත සංශෝධිත ඇස්තමේන්තු ඉදිරිපත් කරනු ලබයි. මෙහිදී නිෂ්පාදිතය, පරිභෝජනය, ආයෝජන වියදම හා ඉතුරුම් ආදිය මෙම තොරතුරු වගුවල ඇතුළත් වෙයි. මෙම නිෂ්පාදිතය කර්මාන්ත මූලයට අනුව මූලික වශයෙන් කෘෂිකාර්මික, කාර්මික සහ සේවා ලෙස පුළුල් අංශ තුනකට වර්ග කෙරෙන අතර, එම අංශ තවදුරටත් උප අංශ 40 කට පමණ විභේදනය වන පරිදි ප්‍රකාශයට පත්කරනු ලැබෙයි. මෙම විභේදනයට එක්සත් ජාතීන්ගේ සම්මත ජාත්‍යන්තර කාර්මික වර්ගීකරණයෙන් (ISIC) ව්‍යුත්පන්න කරන ලදුව දැනට පවත්නා ශ්‍රී ලංකා කාර්මික වර්ගීකරණයේ සඳහන් ආර්ථික ක්‍රියාකාරකම් පාදක වී ඇත.

**ජාතික ගිණුම් සම්පාදන ක්‍රියාවලියේ අඛණ්ඩ සංවර්ධනය**

මේ වනවිට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි තාක්ෂණික සහාය ද සහිතව ජාතික ගිණුම් සම්පාදන ව්‍යුහය වැඩිදියුණු කිරීමට කටයුතු කරගෙන යයි. ඒ අනුව, 2010-2013 කාලපරිච්ඡේදයේ දී ආසියා-පැසිපික් කලාපීය රටවල ජාතික ගිණුම් මෙන්ම මිල දර්ශක සකස් කිරීමේ ක්‍රමවේද ද වැඩිදියුණු කිරීම සඳහා ජා.මූ.අ. සංවිධානය කරන ලද වැඩමුළු මාලාව සඳහා ශ්‍රී ලංකාව ද සහභාගි වූ අතර, මෙම ක්‍රියාවලියට සහාය දැක්වීම උදෙසා ජා.මූ.අ. උපදේශකවරුන් ද කිහිප වරක්ම මෙරටට පැමිණ ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස ජ.සං.දෙ. නිලධාරීන්හට ජාතික ගිණුම් ඇස්තමේන්තු සම්පාදනය සහ මිල දර්ශක සකස් කිරීම; ප්‍රමාණවත් ලෙස දත්ත මූලාශ්‍රයන් නොපවතින ආර්ථික කටයුතු සඳහා ඇස්තමේන්තු සකස් කර ගැනීමට ශ්‍රම බලකාය සහ බදු පිළිබඳ තොරතුරු භාවිතා කරන ආකාරය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව; පදනම් වර්ෂය සංශෝධනය සහ ගිණුම් ක්‍රමවේදය නිවැරදි කර ගැනීම මෙන්ම නිෂ්පාදක මිල දර්ශකයක් (PPI) සකස් කිරීම යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම ප්‍රගුණ කර ගැනීමට හැකි විය.

2014 වසරේ සිට දැනට ජාතික ගිණුම් සකස් කිරීමෙහිලා භාවිතා කරන 2002 පදනම් වර්ෂය, 2010 බවට සංශෝධනය කිරීමට නියමිතය. ඒ සමගම, ජාතික ගිණුම් සම්පාදනයෙහිලා වැඩිදියුණු කිරීම් රැසක් ඉදිරිපත් කිරීමට කටයුතු කරගෙන යයි. ඒ අනුව, 2014 පළමු කාර්තුවේ පටන් ජ.සං.දෙ. ද.දේ.නි. ඇස්තමේන්තු ප්‍රකාශයට පත් කිරීමට කටයුතු සූදානම් කර ඇත. එසේම, නිෂ්පාදන ප්‍රවේශයට අදාළ ඇස්තමේන්තු සැකසීමේ දී මූලික මිල අනුව ඇස්තමේන්තු සැකසීමට සහ රටෙහි සියලුම ආර්ථික කටයුතු ආවරණය කිරීමට මෙන්ම නිෂ්පාදන ඉම පුළුල් කිරීම සඳහා නවතම ජාත්‍යන්තර කර්මාන්ත වර්ගීකරණ සම්මතය (ISIC R.4) ක්‍රියාත්මක කරනු

ඇත. තවදුරටත්, සියලුම ජාතික ගිණුම් සංඛ්‍යාලේඛන ආර්ථිකයේ ආයතනික වර්ගීකරණයට අනුව වෙන වෙනම ඇස්තමේන්තු කරනු ලැබේ. එසේම, එක් එක් ආර්ථික කටයුත්තක නිමැවුම වෙළෙඳපොළ අරමුණු කරගත්, එසේ වෙළෙඳපොළ අරමුණු කර නොගත් සහ ස්ව-පරිභෝජන ලෙස සමස්ත නිමැවුම වෙන වෙනම ඇස්තමේන්තු කරනු ලැබේ. මීට අමතරව, තත්කාර්ය සමීක්ෂණ මගින් යෙදවුම් අනුපාත වඩා නිවැරදි කර ගැනීමට බලාපොරොත්තු වන අතර, කුටුම්බ අංශයේ නිෂ්පාදන කටයුතු ශ්‍රම බලකාය සහ නිරත වන රැකියා අංශය අනුව ඇස්තමේන්තුගත කිරීම ආරම්භ කරනු ඇත. එසේම, ආර්ථිකයේ අදාළ අංශයන්හි සම්පත් සැපයීම සහ භාවිතය අතර පවත්නා අන්තර් සබඳතා විදහා දැක්වෙන සැපයුම් හා භාවිත වගුව වසර පහකට වරක්වත් නැවත ඇස්තමේන්තුගත කිරීමට ද කටයුතු සූදානම් කර ඇත. තවද, පළාත් දළ දේශීය නිෂ්පාදිතය සඳහා වාර්ෂික ඇස්තමේන්තු නිකුත් කිරීමට ද මෙම වැඩිදියුණු කිරීම් සමගම කටයුතු කරනු ඇත.

මෙයට අමතරව දැනට පවතින සම්පාදන ක්‍රියාවලිය ජාතික ගිණුම් ක්‍රමවේදයේ සඳහන් ඇස්තමේන්තු කිරීමේ ක්‍රියාවලියට අනුකූලව සහ නිර්දේශිත ගිණුම් අනුක්‍රමය අනුව සිදු වන්නේද යන්න තහවුරු කර ගැනීමට ක්‍රියාමාර්ග රැසක් සකස් කොට ඇත. ඒ අනුව, ජාතික ගිණුම් ක්‍රමවේදයෙන් නිර්දේශිත බැංකු අංශයේ එකතු කළ අගය මූල්‍ය අතරමැදිකරණය (FISIM) අනුව නිමානය කරනු ඇත. තවද, නව නිර්දේශයන්ට අනුව බදු සහ සහනාධාර මෙන්ම වෙළෙඳ සහ ප්‍රවාහන අයකිරීම් පිළිබඳ ගැලපීම් ද සංශෝධනය කරනු ලැබේ.

මෙම වැඩිදියුණු කිරීම් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, සවිමත් ලෙස ආර්ථිකයේ සියලුම අංශයන්හි ආර්ථික කටයුතු ආවරණය කිරීමට ජ.සං.දෙ. විසින් 2013/14 ආර්ථික සංගණනය මේ වනවිට සිදු කරමින් පවතී. ඒ අනුව, ආයතන ලැයිස්තුගත කිරීමේ ක්‍රියාවලියෙන් පසුව ආර්ථික කටයුතුවල සවිස්තරාත්මක දත්ත රැස් කිරීම සිදු කරනු ලැබේ. මෙම දත්ත රැස් කිරීමේ ක්‍රියාවලියේ දී ISIC R.4 වර්ගීකරණය අනුගමනය කිරීම ඇස්තමේන්තු සම්පාදනය සඳහා මහත් රුකුලක් වනු ඇත. මෙයට අමතරව, ඉතා පහසුවෙන් නිවැරදි දත්ත ලබාගත හැකි මූලාශ්‍රයක් ලෙස යොදා ගැනෙන ව්‍යාපාර සංඛ්‍යාන නාමාවලියක් සැකසීමට අවශ්‍ය ආරම්භක පියවර කිහිපයක්ම ක්‍රියාත්මක කිරීම සඳහා ජ.සං.දෙ. මේ වනවිට ද කටයුතු කොට ඇත.

මෙම වැඩිදියුණු කිරීම්වල සාමූහික ප්‍රතිඵලයක් ලෙස, හැකි උපරිම ආර්ථික ක්‍රියාකාරකම් සංඛ්‍යාවක් ආවරණය කිරීම, දැනට පවත්නා ඇස්තමේන්තු කිරීමේ ක්‍රමවේද වැඩිදියුණු කිරීම, අනුපාත භාවිතය අවම කිරීම සහ අදාළ සමීක්ෂණයන්ගේ සහාය ඇතිව පවත්නා අනුපාත යාවත්කාලීන කිරීම ආදිය සිදු කිරීමට බලාපොරොත්තු වෙයි. ඒ අනුව, අනාගතයේ දී ශ්‍රී ලංකා ජාතික ගිණුම් සංඛ්‍යාලේඛන 2008 ජා.ගි.ක්‍ර. අනුකූල කිරීමට අපේක්ෂා කරන අතර, මෙම ක්‍රියාවලිය සඳහා හැකි උපරිම සහයෝගය දැක්වීම අදාළ සියලුම පාර්ශ්වයන්ගේ වගකීමක් වන අතර, එමගින් වඩාත් උසස් මට්ටමක ජාතික ගිණුම් සංඛ්‍යාලේඛන ඉදිරිපත් කිරීමට හැකියාව ලැබෙනු ඇත.

ව්‍යාපෘතීන් මෙම උප අංශය පෙන්නුම් කළ වර්ධන ගාමකත්වය කෙරෙහි තවදුරටත් දායක විය. ඉදිකිරීම් කර්මාන්තයෙහි ප්‍රධානතම අංශයක් වන ගොඩනැගිලි ඉදිකිරීම්, මෙම උප අංශය පෙන්නුම් කළ ධනාත්මක උපනතිය පවත්වා ගැනීම සඳහා දායක වූ අතර, එහිදී මහා පරිමාණ හෝටල් ව්‍යාපෘතීන්, මහල් නිවාස සහ නිවාස ඒකක ඉදිකිරීම් ඉහළ දායකත්වයක් සැපයීය. නිවාස සංවර්ධන ව්‍යාපෘතීන් කෙරෙහි පෞද්ගලික අංශයේ දායකත්වය පිළිබිඹු කරමින් වාණිජ බැංකු මගින් නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ලබා දෙන ණය හා අත්තිකාරම් සියයට 9.1 කින් වර්ධනය වී ඇති අතර, රාජ්‍ය අංශය ද ප්‍රධාන වශයෙන් ග්‍රාමීය නිවාස සංවර්ධනය අරමුණු කර ගනිමින් 'ජන සෙවණ' වැනි නිවාස ව්‍යාපෘතීන් සඳහා දායක විය. තවද, සියයට 11.9 කින් වර්ධනය වූ ඉදිකිරීම් අමුද්‍රව්‍ය ආනයන පරිමා දර්ශකය මගින් 2013 වසර තුළ ඉදිකිරීම් අංශයේ වර්ධනය පිළිබිඹු කරයි. ඉදිකිරීම් කර්මාන්තයේ වර්ධනය කෙරෙහි පෞද්ගලික අංශයේ සක්‍රිය දායකත්වය පිළිබිඹු කරමින් ඉදිකිරීම් කටයුතු සඳහා වාණිජ බැංකු මගින් 2013 වසරේ දී පෞද්ගලික අංශයට ලබාදුන් ණය සහ අත්තිකාරම් සියයට 16.6 කින් වර්ධනය වී ඇත. මෙයට අමතරව ඉදිකිරීම් පුහුණු කිරීමේ සහ සංවර්ධනය කිරීමේ ආයතනය (ICTAD) විසින් සම්පාදනය කරනු ලබන ඉදිකිරීම් වියදම් දර්ශකය සියයට 7.2 කින් වර්ධනය වීම මගින් අමුද්‍රව්‍ය මිල සහ ශ්‍රම පිරිවැය ඉහළ යාමෙන් සිදු වූ සමස්ත ඉදිකිරීම් වියදම ඉහළ යාම පෙන්නුම් කෙරෙයි. ඉදිකිරීම් උප අංශයෙහි දක්නට ලැබුණු ශ්‍රම පිරිවැය ඉහළ යාම මගින් ඉදිකිරීම් කර්මාන්තය ප්‍රසාරණය වීමත් සමග ඉහළ ගිය ශ්‍රම ඉල්ලුම සම්පූර්ණ කිරීමට සැපයුම ප්‍රමාණවත් නොවූ බව පෙනී යයි. එසේම, ඉහළ ගිය ඉල්ලුම විදහා දක්වමින් 2013 වසර තුළ දී අමුද්‍රව්‍ය පිරිවැය ද ඉහළ ගොස් ඇත. ඒ අනුව, යෙදවුම් පිරිවැය ඉහළ යාමේ අභියෝගයට අනාගතයේ දී සාර්ථකව මුහුණ දීම සඳහා අමුද්‍රව්‍ය හා ශ්‍රම ඵලදායිතාවය වැඩිදියුණු කිරීම මෙන්ම ඉදිකිරීම් කර්මාන්තයට අදාළ නවීන තාක්ෂණ විධික්‍රම හඳුන්වා දීම ද වැදගත් වනු ඇත.

### සේවා අංශය

**ද.දේ.නි. ට සියයට 58.1 ක දායකත්වයක් සපයමින් ආර්ථිකයේ විශාලතම අංශය බවට මෙවර ද පත්ව ඇති සේවා අංශය 2012 වසරේ දී වාර්තා කළ සියයට 4.6 ක වර්ධනයට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 6.4 ක ප්‍රශංසනීය වර්ධනයක් අත්කර ගෙන ඇත.** සියළුම ප්‍රධාන උප අංශ සැලකිය යුතු ලෙස ප්‍රසාරණය වීම මෙම අංශයේ ඉහළ වර්ධනය රඳවා ගැනීම සඳහා හේතු විය. මෙහිදී, රට තුළ ගමනාගමන කටයුතු ඉහළ යාමත් සමග ප්‍රවාහන උප අංශයේ වූ ප්‍රසාරණය ආර්ථික වර්ධනය සඳහා ප්‍රධාන දායකත්වයක් දැක්වීය. විශේෂයෙන්ම, වසරේ දෙවන භාගයේ දී විදේශීය වෙළෙඳපොළෙහි දක්නට ලැබුණු වර්ධනීය ප්‍රවණතාව හේතුවෙන් විදේශ වෙළෙඳ කටයුතු යථා තත්ත්වයට පත්වීම ප්‍රධාන කොට ගෙන සහ දේශීය වෙළෙඳාම් කටයුතුවල පුළුල් වීම ද තොග සහ සිල්ලර වෙළෙඳාම් උප අංශය අත්කරගත් ශක්තිමත් වර්ධනය සේවා අංශයෙහි 2013 වසරේ දී දක්නට ලැබුණු මෙම වර්ධනය කෙරෙහි දායක වී ඇත. මේ අතර, හෝටල් සහ ආපනශාලා උප අංශය ද තවදුරටත් හිතකර වර්ධනයක් අත්කර ගැනීමට සමත් වූ අතර, ආර්ථිකය ස්ථාවර කිරීමේ අරමුණෙන් 2012 වසරේ දී හඳුන්වා දුන් දැඩි මූල්‍ය ප්‍රතිපත්තීන්හි පසු බලපෑම මධ්‍යයේ වුවද බැංකු, රක්ෂණ සහ දේපළ වෙළෙඳාම් උප අංශය ද වර්ධනය විය. තවද, තැපැල් සහ විදුලි සංදේශ, රාජ්‍ය හා පෞද්ගලික සේවා උප අංශයන් ද, සේවා අංශය මෙම වසර තුළ දී වාර්තා කළ මෙම සැලකිය යුතු ප්‍රසාරණය කෙරෙහි යහපත් ලෙස දායක විය. මේ අතර, සේවා අංශයේ වර්ධනය කෙරෙහි සෘජුවම බලපානු ලබන නාවික, ගුවන්, වාණිජ, සංචාරක සහ දැනුම යන ක්ෂේත්‍ර ඉලක්ක කරමින්, ශ්‍රී ලංකාව කලාපීය කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම උදෙසා රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග මෙම වර්ධනය කෙරෙහි බෙහෙවින් දායක විය.

### තොග සහ සිල්ලර වෙළෙඳාම

**තොග සහ සිල්ලර වෙළෙඳාම් උප අංශය, 2012 වසරේ දී වාර්තා කළ සියයට 3.7 ක වර්ධනයට සාපේක්ෂව 2013 වසර තුළ දී සියයට 5.5 ක වර්ධනයක් වාර්තා කරන ලදී.** ද.දේ.නි. සඳහා විශාලතම දායකත්වය සපයන මෙම උප අංශයෙහි වර්ධනය, සමස්ත ආර්ථිකයේම වර්ධනය කෙරෙහි ඉහළ දායකත්වයක් දක්වන ලදී. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළෙඳ හවුල්කාර ආර්ථිකයන් යථා තත්ත්වයට පත්වීමත් සමග වසරේ දෙවන භාගයේ දී අපනයන වෙළෙඳාම් උප අංශයේ යහපත් ක්‍රියාකාරිත්වයක් දක්නට ලැබුණු අතර ආනයන වෙළෙඳාම් කටයුතු ද යථා තත්ත්වයට පත්වීමක් වාර්තා කළේය. මෙම උප අංශවල යහපත් වර්ධනය තොග සහ සිල්ලර වෙළෙඳාම් උප අංශය වසරේ පළමු භාගයේ දී වාර්තා කළ එකතු කළ අගයෙහි පසුබෑම අභිබවා යාමට උපකාරී විය. මේ අතර, දේශීය නිෂ්පාදන දිරිගන්වන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම දේශීය වෙළෙඳාම් උප අංශයෙහි ස්ථාවර වර්ධනයක් පවත්වා ගැනීමට බෙහෙවින් උපකාරී විය. තවද, කොළඹ සහ හම්බන්තොට නිදහස් වරායන් ලෙස ද, කටුනායක, කොග්ගල සහ මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාප සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ බන්ධිත ප්‍රදේශයක් ලෙස ද ප්‍රකාශයට පත් කිරීම මගින් ද වසරේ අවසාන කාලයේ දී නැව්ගත කිරීම් හා සම්බන්ධ අයකිරීම් විධිමත් කිරීම ද මෙම උප අංශයේ අනාගත වර්ධනය පිළිබඳ බලාපොරොත්තු ඉහළ නැංවීමට සමත් වී ඇත.

**ආනයන වෙළෙඳාම් උප අංශය 2012 වසරේ දී වාර්තා කළ සියයට 1.0 ක ආන්තික වර්ධනයට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 2.9 ක වර්ධනයක් අත්කර ගෙන ඇත.** වසරේ පළමු භාගයේ දී ආනයන වෙළෙඳාම් කටයුතුවල වාර්තා කළ පසුබැස්ම මගහරවමින් මෙම උප අංශය වසරේ දෙවන භාගය තුළ දී සැලකිය යුතු ලෙස යථා තත්ත්වයට පත් විය. 2012 වසරට සාපේක්ෂව සමස්ත ආනයන පරිමා දර්ශකය ආන්තික වශයෙන් පහත වැටුණ ද ඛනිජ තෙල් හැර අනෙකුත් ආනයන වැඩි වේගයකින් වර්ධනය විය. මේ බව පාරිභෝගික භාණ්ඩ මෙන්ම ආයෝජන භාණ්ඩවල ආනයන ඉහළ යාම මගින් පෙන්නුම් කරයි. මේ අතර, මෙම වසරේ දී තාප විදුලිබල උත්පාදනය මත රඳා පැවැත්ම පහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස ඒ සඳහා යොදා ගන්නා ඉන්ධන ආනයනය පහත වැටුණු අතර, මේ හේතුවෙන් පෙර වසරට සාපේක්ෂව අන්තර් භාණ්ඩ ආනයනයෙහි පහත වැටීමක් දක්නට ලැබුණි.

**අපනයන වෙළෙඳාම් උප අංශය, 2012 වසරේ වාර්තා කළ සියයට 0.8 ක ආන්තික වර්ධනයට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 6.7 ක ප්‍රශංසනීය වර්ධනයක් අත්කර ගෙන ඇත.** වසරේ දෙවන භාගයේ දී අපනයන වෙළෙඳාමෙහි දක්නට ලැබුණු සැලකිය යුතු ප්‍රසාරණය මෙම උප අංශයේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ශ්‍රී ලංකාවේ අපනයන ආදායමෙන් අඩකට වඩා හිමිකම් කියනු ලබන ප්‍රධාන වෙළෙඳ භාණ්ඩ අපනයන ගමනාන්ත වන යුරෝපා කලාපය සහ ඇමෙරිකා එක්සත් ජනපදය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම මෙම වර්ධනය සඳහා දායක විය. පසුගිය වසරේ දී සංකෝචනයක් වාර්තා කළ අපනයන පරිමා දර්ශකය, මෙම වසරේ දෙවන භාගයේ දී වාර්තා කළ වර්ධනය සමග අපනයන පරිමාවන්හි ඉහළ යාමක්

පෙන්නුම් කළේය. වසරේ දෙවන භාගයේ දී අත්කරගත් මෙම වර්ධනය තුළින්, වසරේ ප්‍රථම භාගයෙහි මාස කිහිපයක් තුළ දක්නට ලැබුණු පසුබෑස්ම මගහරවා ගනිමින් අපනයන වෙළඳාම් උප අංශය ප්‍රශංසනීය ක්‍රියාකාරිත්වයක් දක්වා ඇත. මේ අතර, ඉහළම අපනයන ආදායම උපයනු ලබන කාර්මික අපනයන අංශය වසරේ ප්‍රථම භාගයේ දී යම් අඩු වීමක් පෙන්නුම් කළ ද ඇඟලුම් අපනයන ඉහළ යාම හේතුවෙන් දෙවන භාගයේ දී යථා තත්ත්වයට පත්විය.

**දේශීය වෙළෙඳාම් උප අංශය 2012 වසරේ දී වාර්තා කළ සියයට 6.8 ක වර්ධනය හා සැසඳීමේ දී 2013 වසරේ දී සියයට 6.9 ක ප්‍රසාරණයක් අත්කර ගන්නා ලදී.** මෙම වර්ධනය සඳහා විශේෂයෙන්ම, කෘෂිකාර්මික හා කාර්මික කටයුතුවල නියුතු කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා රාජ්‍ය අංශයේ අඛණ්ඩ අනුග්‍රහය, 'දිවි නැගුම' ජාතික වැඩසටහන වැනි ජීවනෝපායයන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතීන් ද බෙහෙවින් දායක විය. එසේම, අපනයන සඳහා ඇඟළුම් සහ පිඟන් මැටි ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන සමාගම් සිය නිෂ්පාදිතයෙන් කොටසක් දේශීය වෙළෙඳපොළට නිකුත් කිරීමේ දී ලබාදුන් බදු සහන ද මෙම උප අංශයේ වර්ධනය සඳහා තවදුරටත් හේතු විය. කෙසේ නමුදු, විශේෂයෙන්ම කෘෂිකාර්මික නිෂ්පාදනයේ ඇතිවූ පසුබෑම හේතුවෙන් සැපයුම් අංශයෙන් ඇති වූ සීමා වීම් වසරේ ප්‍රථම භාගයේ දී මෙම උප අංශය කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදී.

### ප්‍රවාහනය සහ සන්නිවේදනය

**ප්‍රවාහනය සහ සන්නිවේදනය උප අංශය 2012 වසරේ දී වාර්තා කළ සියයට 6.2 ක වර්ධනයට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 9.4 ක සැලකිය යුතු වර්ධනයක් අත් කර ගැනීමට සමත් විය.** එම වර්ධනය සඳහා මූලික වශයෙන් මෙම උප අංශයේ ප්‍රධාන කොටස්කරුවන් වන ප්‍රවාහන හා තැපැල් සහ විදුලි සංදේශ උප අංශයන්ගේ ඉහළ ප්‍රසාරණය දායක විය. ප්‍රවාහන ජාලයේ සිදු වූ ප්‍රසාරණයත් සමගම අභ්‍යන්තර ගමනාගමනය සඳහා ඇති වූ ඉල්ලුම ඉහළ යාම හේතුවෙන් ප්‍රවාහන උප අංශයේ ඉහළ වර්ධනයක් දැකිය හැකි විය. ජනතාවගේ ආදායම් මට්ටම් ඉහළ යාම හේතුවෙන් අගය එකතු කළ සන්නිවේදන සේවා සඳහා වූ ඉල්ලුම ඉහළ යාම සන්නිවේදන උප අංශයේ දක්නට ලැබුණු වර්ධනය සඳහා දායක විය. කෙසේ වුවද, විශේෂයෙන්ම වසරේ ප්‍රථම භාගයේ දී ගෝලීය ආර්ථිකය අඩු වේගයකින් යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් භාණ්ඩ මෙහෙයවීම - වරාය සහ සිවිල් ගුවන් සේවා උප අංශය මන්දගාමී ස්වභාවයක් පෙන්නුම් කරන ලදී.

**ප්‍රවාහනය උප අංශය 2012 වසරේ දී වාර්තා කළ සියයට 6.0 ක වර්ධනය හා සැසඳීමේ දී 2013 වසරේ දී සියයට 9.4 ක ඉහළ වර්ධන ගාමකත්වයක් වාර්තා කරන ලදී.** මාර්ග, දුම්රිය මාර්ග ඉදිකිරීම් වැනි ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළ යටිතල පහසුකම් දියුණු කිරීම සහ පොදු ප්‍රවාහන සේවාවන්ගේ බස් සහ දුම්රිය ඇණි වැඩිදියුණු කිරීම මගී හා භාණ්ඩ ප්‍රවාහන උප අංශයේ සැලකිය යුතු වර්ධනයට හේතු විය. සංචාරක හා විවේක කටයුතු හේතුවෙන් අභ්‍යන්තර ගමනාගමන කටයුතු ඉහළ යාම ද මෙම අංශයේ වර්ධනය සඳහා යහපත් දායකත්වයක් දක්වනු ලැබීය. ඒ අනුව, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, පෞද්ගලික බස් සේවාවන් සහ ශ්‍රී ලංකා දුම්රිය සේවය එක්ව මෙහෙයවන ලද සමස්ත මගී කිලෝමීටර් ප්‍රමාණය ද වසර තුළ දී ප්‍රසාරණය විය. මේ අතරතුර දී, ශ්‍රී ලංකන් සහ මිහින් ලංකා යන ජාතික ගුවන් සේවා විසින් මෙහෙයවන ලද මගී කිලෝමීටර් සංඛ්‍යාව ද 2013 වසරේ දී සියයට 4.7 කින් වර්ධනය වී ඇත. තවද, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සහ අභිනවයෙන් විවෘත කරන ලද මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ එක්ව සිය සේවා සැලකිය යුතු ලෙස ව්‍යාප්ත කළ අතර, ඒ අනුව හසුරුවන ලද මගී ගුවන් යානා සංඛ්‍යාව සහ පහසුකම් සලසන ලද මගී සංඛ්‍යාව ඉහළ ගියේය. මේ අතර, ප්‍රවාහන උප අංශයෙහි එකතු කළ අගය සඳහා දායක වෙමින් අභ්‍යන්තර ගුවන් සේවා මගින් මගී කිලෝමීටර් මිලියන 7.8 ක් මෙහෙයවා ඇත.

**භාණ්ඩ මෙහෙයවීම - වරාය සහ සිවිල් ගුවන් සේවා උප අංශය පසුගිය වසරේ දී ලබාගත් සියයට 5.7 ක වර්ධනයට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 3.1 ක වර්ධනයක් අත්කර ගන්නා ලදී.** විශේෂයෙන්ම, වසරේ දෙවන භාගයේ දී විදේශීය වෙළෙඳ කටයුතු යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් මෙම වර්ධනය පෙන්නුම් කෙරිණි. කෙසේ වුවද, වසරේ පළමු භාගයේ දී ඇති වූ මන්දගාමීත්වය ප්‍රමාණවත් ලෙස අභිබවා යාමට දෙවන භාගයේ දී නොහැකි වූ බැවින් පෙර වසරට සාපේක්ෂව 2013 වසරේ දී අඩු වර්ධනයක් දක්නට ලැබුණි. එසේම, කොළඹ ජාත්‍යන්තර බහාලුම් පර්යන්තය එක් කිරීමෙන් සවිමත් වූ කොළඹ වරාය, වාර්තාගත අඩි විස්සට සමාන බහාලුම් ඒකක (TEUs) මිලියන 4.31 ක ප්‍රමාණයක් හසුරුවමින් සියයට 2.8 ක වර්ධනයක් 2013 වසරේ දී අත්පත් කර ගන්නා ලදී. එසේම, දේශීය වශයෙන් වාර්ෂිකව මෙහෙයවන ලද බහාලුම් ප්‍රමාණය සහ ප්‍රති නැව්ගත කිරීම් (නැවත ඇසිරීම් හැර) පිළිවෙළින් පෙර වසරේ සියයට 2.5 ක සහ සියයට 1.9 ක සංකෝචනයට සාපේක්ෂව මෙම වසරේ දී සියයට 1.1 ක සහ සියයට 4.7 ක වර්ධනයක් වාර්තා කරන ලදී. මේ අතර, නැව් තොටුපොළ

මගින් හසුරුවනු ලැබූ ටොන් නෞභාරය වසරේ දෙවන භාගයේ දී විදේශීය වෙළෙඳ ක්‍රියාකාරකම්වලට සමාන්තරව යහපත් තත්ත්වයට පත් වූ අතර, මේ සඳහා විදේශ වෙළෙඳ කටයුතුවල වර්ධනය සමග ඉහළ ගිය භාණ්ඩ පැටවීම් සහ ගොඩබෑම් කටයුතු දායක විය. තවද, ගුවන් තොටුපොළ මගින් හසුරුවන ලද ගුවන් භාණ්ඩ පරිමාව සියයට 4.0 ක වර්ධනයක් අත්පත් කර ගනිමින් මෙට්‍රික් ටොන් 194,039 ක් දක්වා වර්ධනය වීම ද මෙම උප අංශයේ එකතු කළ අගය වර්ධනය වීමට දායක විය.

**තැපැල් සහ විදුලි සංදේශ උප අංශය 2012 වසරේ දී අත්කරගත් සියයට 7.9 ක වර්ධනය හා සැසඳීමේ දී 2013 වසරේ දී සියයට 11.4 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය.** මෙහිදී සාමාන්‍ය ඇමතුම් සේවාවන්ට වඩා වෙනත් අගය එකතු කළ සේවා භාවිතය කරා ග්‍රාහකයන් නැඹුරු වන ආකාරයක් දක්නට ලැබුණු අතර, ඒ බව වසර තුළ දී ඇමතුම් කාලයේ සිදුවූ සියයට 1.6 ක ආන්තික වර්ධනයට සාපේක්ෂව අන්තර්ජාල සබඳතා ශීඝ්‍ර ලෙස සියයට 47.3 කින් වර්ධනය වීම මගින් පිළිබිඹු කෙරෙයි. මේ අතර, රැහැන් සහිත ස්ථාවර දුරකථන ග්‍රාහකයන්ගේ යම් වැඩි වීමක් තිබුණ ද රැහැන් රහිත ස්ථාවර දුරකථන ග්‍රාහකයන්ගේ ශීඝ්‍ර අඩු වීම හේතුවෙන් සමස්ත ස්ථාවර දුරකථන සම්බන්ධතාවන්ගේ පහත වැටීමක් පෙන්නුම් කෙරුණි. මේ අතරතුර දී, තැපැල් දෙපාර්තමේන්තුව විසින් විදුලි පණිවුඩ සේවාව වෙනුවට ටෙලි-තැපැල් සේවාව සහ නියමු ව්‍යාපෘතියක් ලෙස ලංකා ශීඝ්‍රගාමී තැපැල් පණිවුඩ සේවාව දියත් කරන ලද අතර සාම්ප්‍රදායික ලිපි සහ පාර්සල් බෙදාහැරීමේ සේවාවන් ද අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී. තවද, ශ්‍රී ලංකාව විශේෂයෙන්ම දැනුම සහ වාණිජ කේන්ද්‍රස්ථාන ලෙස උපායමාර්ගික වශයෙන් වැදගත් කලාපීය ආර්ථික මධ්‍යස්ථානයක් බවට පත්කිරීමේ අරමුණ ඉටුකර ගැනීමෙහිලා මෙම අංශයේ වර්ධනය ඉහළ මට්ටමක පැවැතීම ඉතා වැදගත් වේ.

### හෝටල් සහ ආපනශාලා

**හෝටල් සහ ආපනශාලා උප අංශය සිය වර්ධන ගාමකත්වය තවදුරටත් ඉහළ මට්ටමක පවත්වාගෙන යමින්, 2012 වසරේ දී ලබාගත් සියයට 20.2 ක වර්ධනයට සාපේක්ෂව මෙම වසරේ දී සියයට 22.3 ක වර්ධනයක් අත්කර ගැනීමට සමත් විය.** මෙම උප අංශය වසර තුළ දී සංචාරකයන් මිලියන 1.27 කට අධික ප්‍රමාණයක් ආකර්ෂණය කර ගනිමින් සියයට 26.7 ක වර්ධනයක් පෙන්නුම් කළ අතර, ඒ අනුව සංචාරක ඉපැයීම් ද එ.ජ. ඩොලර් බිලියන 1.7 ඉක්මවා ගියේය. ගෝලීය ආර්ථික වාතාවරණය අයහපත් මට්ටමක පැවැතිය දී වුව ද සංචාරක පැමිණීම් සහ ඉපැයීම්වල දක්නට ලැබුණු මෙම වර්ධනය 2012 වසරේ දී අත්කරගත් වර්ධනයට වඩා ඉහළ යාමක් පෙන්නුම් කළ අතර, සංචාරක ඉපැයීම් ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියනය සහ සංචාරක පැමිණීම් ප්‍රමාණය මිලියනය නොකඩවා ඉක්මවා ගිය දෙවන වසර බවට 2013 වසර සනිටුහන් කළ හැක. ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයන් සංඛ්‍යාව, එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය විසින් නිකුත් කරන ලද ආසියා ශාන්තිකර කලාපය සඳහා වූ සියයට 6 ක සහ සමස්ත ලෝකයම සඳහා වූ සියයට 5 ක සංචාරක වර්ධන ඇස්තමේන්තු ද ඉක්මවා යන ලදී. තවද, චීනය සහ නැගෙනහිර යුරෝපා රටවලින් පැමිණි සංචාරකයන්ගේ ප්‍රමාණය ඉහළ යාම තුළින් සාම්ප්‍රදායික නොවන වෙළෙඳපොළවලින් සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ මූලිකත්වය ඇතිව අදාළ ආයතන මගින් ගන්නා ලද සාමූහික ප්‍රයත්නයෙහි ප්‍රතිඵල මනාව පිළිබිඹු කෙරේ. දැනට සංචාරක ක්ෂේත්‍රය සඳහා රට තුළ ඉහළ විභවයක් පැවැතිය ද ඉදිරියට ද මෙම ගම්‍යතාවය අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා කර්මාන්තයේ නැගී එන ඉල්ලුම් ප්‍රවණතාවන්ට අනුව හැඩගැසීම අවශ්‍ය වේ. තවද, රට තුළ ස්වාභාවික හා සංස්කෘතික ආකර්ෂණයක් සහිත ස්ථාන රැසක් පවතින බැවින් ශ්‍රී ලංකාව තවදුරටත් සංචාරකයන් සඳහා විශේෂිත පරිසර හිතකාමී සංචාරක වෙළෙඳපොළක් ලෙස ප්‍රවර්ධනය කළ හැක. එය සංචාරක ව්‍යාපාරය තුළ දේශීය සහභාගිත්වය වැඩි වීමට හේතු වන අතරම සාම්ප්‍රදායික සංචාරක කර්මාන්තයට වඩා දිගු කාලීන වශයෙන් තිරසාර වනු ඇත. එසේම, ඉන්දියාව සහ චීනය යන රටවල මධ්‍යම පාන්තික ජනතාවගේ ඉපැයීම් හැකියාව වැඩි වීම එම රටවලින් සංචාරකයන් ආකර්ශනය කර ගැනීමට ඉඩ ප්‍රස්ථාව සලසා ඇති අතර එම අවස්ථාවෙන් ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට දූරදර්ශී ලෙස ක්‍රියා කළ යුතුව ඇත. තවද, මෙම වසරේ දී පැවැත්වූ පොදු රාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායකයන්ගේ සමුළුව (CHOGM) මගින් සංචාරක ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාව සිය ස්ථානය යළි ස්ථාපිත කර ගැනීම සඳහා දුර්ලභ අවස්ථාවක් ලැබුණි.

### බැංකු, රක්ෂණ සහ දේපළ වෙළෙඳාම්

**බැංකු, රක්ෂණ සහ දේපළ වෙළෙඳාම් උප අංශයෙහි එකතු කළ වටිනාකම, 2012 වසරේ දී අත්කර ගත් සියයට 6.7 ක වර්ධනයට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 5.9 කින් වර්ධනය විය.** ආර්ථිකය ස්ථාවර කිරීම සඳහා 2012 වසරේ දී ක්‍රියාත්මක කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්තිය හේතුවෙන් පෞද්ගලික අංශයෙහි

ණය වර්ධනය මන්දගාමී වීමේ බලපෑම මෙම උප අංශයෙහි ක්‍රියාකාරිත්වය තුළින් පිළිබිඹු විය. කෙසේ වුවද, පසුකාලීනව මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම සඳහා ණය සීමා කිරීම ඇතුළු අනෙකුත් සීමාකාරී ක්‍රියාමාර්ග ඉවත් කිරීම හමුවේ වුවද, වාණිජ බැංකු මගින් පෞද්ගලික අංශයට ලබා දෙන ණය වර්ධනය 2013 වසරේ දෙසැම්බර් මාසයේ පෙන්නුම් කළ වර්ධනය දක්වාම අඛණ්ඩව මන්දගාමී මට්ටමක පැවැතීම මෙම උප අංශයේ ලාභදායීත්වය පහත හෙලීමට හේතු විය. එසේම, ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි රත්‍රන් මිල පහත වැටීමේ ප්‍රතිඵලයක් ලෙස උකස් අත්තිකාරම්හි ශීඝ්‍ර ලෙස පහත වැටීම ද මෙම මන්දගාමීත්වය කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය. තවද, පොලී අනුපාත පරතරය අඩු වීම ද පොලී නොවන පිරිවැය මෙන්ම බොල් ණය සඳහා කරන වෙන්කිරීම් හා ණය කපාහැරීම් ඉහළ යාම ද මූල්‍ය අංශයේ ලාභදායීත්වය පහත වැටීමට මූලික විය. එමෙන්ම, රක්ෂණ ක්ෂේත්‍රයේ, ජීවිත හා සාමාන්‍ය රක්ෂණ යන දෙඅංශයෙහි ම දළ ලියාහල වාරික ආදායම්වල යම් වර්ධනයක් දැකිය හැකි වුවද මෙහෙයුම් පිරිවැය ඉහළ යාම සහ ආයෝජන ආදායමෙහි පහළ යාම හේතුවෙන් ලාභදායීත්වයේ පහත වැටීමක් දක්නට ලැබුණි. කෙසේ වුවද, මූල්‍ය ආයතනවල අරමුදල් පිරිවැය පහත වැටීමට වසර තුළ දී මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම හේතු වූ අතර එහි බලපෑම මූල්‍ය පද්ධතිය හරහා ඉදිරි කාලයේ දී ආර්ථිකයට සම්ප්‍රේෂණය වනු ඇත. එසේම, ශාඛා ජාලය තවදුරටත් ව්‍යාප්ත වීම මගින් මූල්‍ය අංශය රට තුළ වඩාත් හොඳින් පැතිර යාම පෙන්නුම් කෙරෙයි. තවද, මෙම උප අංශය අනෙකුත් ආර්ථික ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සලසන්නකු ලෙස කටයුතු කරන බැවින් කම්පනයන්ට හොඳින් ඔරොත්තු දෙන, ශක්තිමත් සහ වඩා හොඳින් ස්ථාපිත මූල්‍ය අංශයක පැවැත්ම රටෙහි ආර්ථික වර්ධනය සඳහා ඉතා වැදගත් වෙයි. එමනිසා, පසුගිය අයවැයෙන් අනතුරුව මෙම උප අංශය වඩාත් ශක්තිමත් කිරීම සඳහා මූලික ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග රැසක් මේ වනවිටත් ආරම්භ කර ඇත.

### රාජ්‍ය සේවා

**රාජ්‍ය සේවා උප අංශය 2012 වසරේ දී ලබාගත් සියයට 1.4 ක වර්ධනයට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 2.8 ක වර්ධනයක් ලබා ගැනීමට සමත් විය.** 2013 වසර තුළ දී උපාධිධාරී පුහුණුවන්නන් ස්ථිර සේවය සඳහා අන්තර්ග්‍රහණය කිරීම රාජ්‍ය සේවා උප අංශයේ වර්ධනය සඳහා දායක වූ සාධකයක් විය. ඒ අනුව, රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය 2013 වසර තුළ දී සියයට 2.7 කින් ඉහළ ගියේය.

### පෞද්ගලික සේවා

**පෞද්ගලික සේවා උප අංශයේ එකතු කළ අගය 2012 වසරේ දී වාර්තා කළ සියයට 5.5 ක වර්ධනයට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 7.3 කින් වර්ධනය විය.** පෞද්ගලික අධ්‍යාපන සේවා සහ සෞඛ්‍ය සේවා වැනි ආර්ථික ක්‍රියාකාරකම් මෙම උප අංශයේ වර්ධනය සඳහා සැලකිය යුතු ලෙස දායක වී ඇත. එසේම, ජනතාවගේ ආදායම් මට්ටම් ඉහළ යාමත් සමගම ඇති වන ජීවන ක්‍රමයේ වෙනස්කම් හේතුවෙන් පෞද්ගලික සේවා සඳහා ඇති ඉල්ලුමෙහි වර්ධනයක් බලාපොරොත්තු විය හැක.

## 2.3 වියදම

**වියදම් ප්‍රවේශයෙහි ඇස්තමේන්තු අනුව ආයෝජන වියදමෙහි මෙන්ම පරිභෝජන වියදමෙහි ද මූර්ත වශයෙන් සිදු වූ ප්‍රසාරණය 2013 වසර තුළ දී අත්කරගත් ඉහළ වර්ධන ගාමකත්වය සඳහා හේතු විය.** ආර්ථික වර්ධනය තිරසාරව පවත්වා ගෙන යාමේ හැකියාව පිළිබිඹු කරමින් ආයෝජන වියදම 2012 වසරට සාපේක්ෂව මූර්ත වශයෙන් වඩා වැඩි වේගයකින් වර්ධනය විය. මෙහිදී, විශේෂයෙන්ම නේවාසික ගොඩනැගිලි සහ අනෙකුත් ගොඩනැගිලි ආදී ඉදිකිරීම් කටයුතු සඳහා පෞද්ගලික මෙන්ම රාජ්‍ය අංශයේ ද වියදම් ඉහළ යාමක් පෙන්නුම් කෙරිණි. මේ අතර, පරිභෝජන වියදම් ද 2012 වසරට සාපේක්ෂව අඩු වේගයකින් වුව ද තවදුරටත් මූර්ත වශයෙන් වර්ධනය වූ අතර, මේ සඳහා වසර තුළ දී ආදායම් මට්ටම් ඉහළ යාම හේතු වූ අතර, එය දේශීය නිෂ්පාදිතය සහ පාරිභෝගික භාණ්ඩ ආනයනය ඉහළ යාම මගින් පෙන්නුම් කෙරිණි. මේ අතර, වියදම් ඇස්තමේන්තුන්හි වර්ධන වේගය නාමික වශයෙන් අඩුවීම සඳහා මිල මට්ටම් මන්දගාමී වීම ද බලපෑ අතර එය ද.දේ.නි. ගම්‍ය අවධමනකය 2012 වසරේ දී වාර්තා කළ සියයට 8.9 ක වර්ධනය, 2013 වසර වනවිට සියයට 6.7 ක් දක්වා පහත වැටීමෙන් ද පිළිබිඹු කෙරිණි. තවදුරටත්, සමස්ත පරිභෝජනය සහ ආයෝජනය මගින් පෙන්නුම් කරන රටෙහි සමස්ත දේශීය ඉල්ලුම 2013 වසරේ දී නාමික වශයෙන් රුපියල් බිලියන 9,500 ක් දක්වා සියයට 10.3 කින් වර්ධනය විය.

### පරිභෝජනය

**ආර්ථිකයේ විශාලතම වියදම් කාණ්ඩය වන පරිභෝජන වියදම 2012 වසරට සාපේක්ෂව අඩු වර්ධන වේගයකින් වුවද 2013 වසර තුළ දී රුපියල් බිලියන 6,935 ක් දක්වා නාමික වශයෙන් සියයට 10.1 කින් ඉහළ ගියේය.** මෙහිදී, මුළු පරිභෝජන වියදමෙහි පෞද්ගලික අංශයේ වියදම 2013 වසර තුළ දී

2.8 සංඛ්‍යා සටහන

**සමස්ත ඉල්ලුම**

රුපියල් මිලියන

| අයිතමය | පවත්නා වෙළෙඳ මිල අනුව | | | 2002 ස්ථාවර මිල අනුව | | |
|---|---|---|---|---|---|---|
| | 2011 | 2012 (අ) | 2013 (ආ) | 2011 | 2012 (අ) | 2013 (ආ) |
| 1. දේශීය ඉල්ලුම | | | | | | |
| පරිභෝජනය | 5,536,095 | 6,295,894 | 6,934,816 | 2,422,786 | 2,555,330 | 2,638,171 |
| (% වෙනස) | 22.4 | 13.7 | 10.1 | 12.9 | 5.5 | 3.2 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 1,959,483 | 2,318,253 | 2,565,498 | 827,456 | 881,173 | 968,072 |
| (% වෙනස) | 26.8 | 18.3 | 10.7 | 7.7 | 6.5 | 9.9 |
| **මුළු දේශීය ඉල්ලුම** | **7,495,578** | **8,614,147** | **9,500,314** | **3,250,242** | **3,436,503** | **3,606,243** |
| **(% වෙනස)** | **23.5** | **14.9** | **10.3** | **11.6** | **5.7** | **4.9** |
| 2. විදේශීය ඉල්ලුම | | | | | | |
| භාණ්ඩ සහ සේවා අපනයන | 1,508,565 | 1,730,467 | 1,949,267 | 803,507 | 804,793 | 852,276 |
| (% වෙනස) | 20.3 | 14.7 | 12.6 | 11.0 | 0.2 | 5.9 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 2,460,830 | 2,766,060 | 2,775,711 | 1,190,057 | 1,196,008 | 1,192,420 |
| (% වෙනස) | 43.1 | 12.4 | 0.3 | 20.0 | 0.5 | -0.3 |
| **ශුද්ධ බාහිර ඉල්ලුම** | **-952,265** | **-1,035,593** | **-826,444** | **-386,551** | **-391,215** | **-340,144** |
| **3. මුළු ඉල්ලුම** | **6,543,313** | **7,578,554** | **8,673,870** | **2,863,691** | **3,045,288** | **3,266,099** |
| **(% වෙනස)** | **16.8** | **15.8** | **14.5** | **8.2** | **6.3** | **7.3** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

රාජ්‍ය අංශයේ වියදමට සාපේක්ෂව අඩු වේගයකින් වර්ධනය විය. රාජ්‍ය අංශයේ පරිභෝජනය ප්‍රසාරණය වීමට, ප්‍රධාන වශයෙන් එම අංශයේ වැටුප් සහ වේතන වැඩිවීම නිසා සිදු වූ භාණ්ඩ සහ සේවාවන්හි වියදම ඉහළ යාම හේතු විය. වසර ආරම්භයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයනයෙහි අඩු වීමක් වාර්තා කළ ද පසු කාලීනව අනෙකුත් පාරිභෝගික භාණ්ඩ ආනයන ඉහළ යාම සමග වසර තුළ දී සමස්ත පාරිභෝගික භාණ්ඩ ආනයනය යථා තත්ත්වයට පත් විය. ඒ අතර, ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි රත්‍රන් මිල ශීඝ්‍ර ලෙස පහත වැටීම ප්‍රධාන කොට උකස් අත්තිකාරම් අඛණ්ඩව පහත වැටීම බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දෙන ණය සහ අත්තිකාරම් ප්‍රමාණය පහත වැටීමට හේතු වුව ද, කල් පවත්නා පරිභෝජන භාණ්ඩ සඳහා වූ ණය වසර තුළ දී ක්‍රමයෙන් ඉහළ යනු දක්නට ලැබුණි. ජනතාවගේ වැය කළ හැකි ආදායම ඉහළ යාමත් සමග වසර පුරා උද්ධමනය අඩු මට්ටමක පැවැතීම පාරිභෝගිකයන්ගේ ක්‍රය ශක්තිය ඉහළ නැංවීමට දායක විය.

**පෞද්ගලික පරිභෝජන වියදම සඳහා අඛණ්ඩව ප්‍රධාන දායකත්වය දරනු ලබන ආහාර, පාන සහ දුම්කොළ අංශය, 2012 වසරේ වාර්තා කළ සියයට 7.7 ක වර්ධනයට සාපේක්ෂව 2013 වසර තුළ දී සියයට 7.6 ක වර්ධනයක් වාර්තා කළේය.** කෙසේ වුවත්, වැය කළ හැකි ආදායම් මට්ටම් ඉහළ යාමත් සමග පෞද්ගලික පරිභෝජන වියදමෙන් ආහාර හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සඳහා වන වියදම 2012 වසරේ දී වූ සියයට 37.7 ක සිට සියයට 36.9 ක් දක්වා මෙම වසර තුළ දී පහත වැටුණි. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙහි ආහාර හා මධ්‍යසාර නොවන පාන උප දර්ශකය වාර්ෂික සාමාන්‍ය පදනම මත 2012 වසරට සාපේක්ෂව ඉහළ යාමක් දක්නට ලැබුණි. එමෙන්ම, දේශීය මුදල් වටිනාකම අනුව ආහාර හා පාන වර්ග ආනයනය ද 2012 වසර තුළ වාර්තා කළ සියයට 4.2 ක සංකෝචනයට සාපේක්ෂව මෙම වසරේ දී සියයට 6.3 ක වර්ධනයක් අත්කර ගනිමින් යථා තත්ත්වයට පත් විය. මේ අතරතුර දී රෙදිපිළි සහ පාවහන් සඳහා වූ වියදම සියයට 10.0 ක් දක්වා මන්දගාමී වූ අතර, මේ බව මෙම අංශයේ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2012 වසරේ දී වූ සියයට 9.8 ක සිට සියයට 5.4 ක් දක්වා වසර තුළ දී පහත වැටීම සහ පරිභෝජනය සඳහා රෙදිපිළි සහ උපාංග ආනයනයන්හි වර්ධනය, වටිනාකම අනුව මෙන්ම ප්‍රමාණාත්මකව ද පහත වැටීම මගින් පෙන්නුම් කෙරේ. කෙසේ වුවත්, අපනයනය සඳහා නිමි ඇඳුම් නිෂ්පාදනය කරනු ලබන ආයතන දේශීය වෙළෙඳපොළට සිය නිෂ්පාදිතයෙන් කොටසක් නිකුත් කිරීමේ දී ලබාදුන් බදු සහන රෙදිපිළි ද්‍රව්‍ය සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදම කෙරෙහි හිතකර ලෙස බලපාන ලදී.

**2.9 සංඛ්‍යා සටහන** **පවත්නා වෙළෙඳ මිල අනුව පෞද්ගලික පරිභෝජන වියදමේ සංයුතිය**

| අයිතමය | මුළු පෞද්ගලික පරිභෝජන වියදමට දායකත්වය (%) | | | වෙනස්වීමේ අනුපාතය (%) | |
|---|---|---|---|---|---|
| | 2011 | 2012 (අ) | 2013 (ආ) | 12/11 | 13/12 |
| 1. ආහාර, පාන සහ දුම්කොළ | 40.4 | 37.7 | 36.9 | 7.7 | 7.6 |
| 2. රෙදිපිළි සහ පාවහන් | 5.5 | 5.4 | 5.4 | 13.3 | 10.0 |
| 3. නිවාස කටයුතු, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන | 12.5 | 12.4 | 13.2 | 14.7 | 17.4 |
| 4. ගෘහභාණ්ඩ, ගෘහස්ථ උපකරණ සහ නෛත්‍යක නිවාස නඩත්තුව | 4.3 | 3.9 | 3.8 | 5.4 | 6.4 |
| 5. සෞඛ්‍යය | 1.8 | 1.6 | 1.6 | 3.7 | 11.0 |
| 6. ප්‍රවාහනය | 21.1 | 23.5 | 23.3 | 28.8 | 9.0 |
| 7. විනෝද සේවා සහ සංස්කෘතික කටයුතු | 2.1 | 1.9 | 1.9 | 6.6 | 9.1 |
| 8. අධ්‍යාපනය | 0.3 | 0.4 | 0.4 | 26.1 | 26.7 |
| 9. හෝටල් සහ ආපනශාලා | 1.3 | 1.7 | 2.0 | 50.5 | 29.5 |
| 10. විවිධ භාණ්ඩ සහ සේවා | 4.1 | 3.9 | 3.8 | 10.2 | 7.8 |
| 11. ශ්‍රී ලාංකිකයින් එතෙරදී කරන වියදම් | 9.3 | 11.1 | 11.8 | 37.2 | 17.0 |
| 12. අඩු කළා : විදේශිකයින් මෙතෙරදී කරන වියදම් | 2.7 | 3.5 | 4.2 | 48.9 | 32.1 |
| **මුළු පෞද්ගලික පරිභෝජන වියදම** | **100.0** | **100.0** | **100.0** | **15.5** | **9.9** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**2013 වසර තුළ දී නිවාස කටයුතු, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන සඳහා වූ වියදම සියයට 17.4 කින් ප්‍රසාරණය විය.** ඒ අනුව, 2013 වසරේ දී පෞද්ගලික පරිභෝජන වියදම සඳහා සියයට 13.2 ක දායකත්වයක් මෙම අංශයෙන් වාර්තා විය. මෙහිදී, විදුලිය සහ ජල සම්පාදනය සඳහා වන පාරිභෝගික ගිණුම් වර්ධනය වීමෙන් එම ජාලයන්ගේ පුළුල් වීම පිළිබිඹු වේ. තවද, ඩීසල්, පෙට්‍රල්, ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් සහ විදුලිය වැනි සේවාවන්හි පාලිත මිල ගණන් සංශෝධනය කිරීම හේතුවෙන් මෙම අංශයේ පෞද්ගලික පරිභෝජන වියදම ඉහළ ගිය අතර, එය එම අංශයේ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය පසුගිය වසරේ වාර්තා කළ සියයට 9.6 ක සිට සියයට 10.7 ක් දක්වා මෙම වසරේ දී ඉහළ යාමට හේතු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ගෘහස්ථ අංශය සඳහා බෙදාහරින ලද විදුලි ඒකක ප්‍රමාණය ආන්තික ලෙස පහත වැටීම මධ්‍යයේ වුව ද විදුලිය සඳහා පෞද්ගලික පරිභෝජන වියදම ඉහළ යාමක් දක්නට ලැබුණි.

**පෞද්ගලික අංශයේ වියදම් කාණ්ඩ අතරින් දෙවැනි විශාලතම කාණ්ඩය වන ප්‍රවාහන වියදම් 2013 වසරේ දී සියයට 9.0 කින් මන්දගාමී ලෙස වර්ධනය විය.** 2012 වසරේ පෙබරවාරි මස මැද භාගයේ දී සියයට 20.0 කින් බස් ගාස්තු ඉහළ නංවන ලද නමුදු මෙම වසරේ නොවැම්බර් මස මුල් භාගයේ දී බස් ගාස්තු සියයට 7.0 ක් වැනි සාපේක්ෂව අඩු අගයකින් ඉහළ ගියේය. එසේ මිල ගණන් සාපේක්ෂව අඩු අගයකින් ඉහළ යාම පිළිබිඹු කරමින් ප්‍රවාහන වියදම් මන්දගාමී ලෙස ඉහළ ගියේය. තවද, 2012 වසරේ දී ප්‍රවාහන අංශයෙහි පැවැති වාර්ෂික සාමාන්‍ය උද්ධමනය වූ සියයට 21.6 හා සැසඳීමේ දී 2013 වසරේ දී එම අගය සියයට 4.6 ක් දක්වා ශීඝ්‍ර ලෙස පහත වැටීම මගින් ද මෙම මන්දගාමීත්වය පිළිබිඹු කෙරේ.

**සෞඛ්‍ය හා අධ්‍යාපනය සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදම් 2013 වසරේ දී පිළිවෙළින් සියයට 11.0 කින් හා සියයට 26.7 කින් වර්ධනය විය.** පාරිභෝගිකයින්ගේ ක්‍රය ශක්තිය ඉහළ යාම පෞද්ගලික අංශයේ සෞඛ්‍ය හා අධ්‍යාපනික සේවාවන් සඳහා ඇති ඉල්ලුම වර්ධනය වීමට ඉවහල් විය. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් රාජ්‍ය අංශය සෞඛ්‍ය හා අධ්‍යාපනික සේවාවන් සපයන බැවින් මෙම කාණ්ඩ ද්විත්වයේම පෞද්ගලික අංශයේ දායකත්වය තවමත් අඩු මට්ටමක පවතී.

**පාරිභෝගිකයින්ගේ වැය කළ හැකි ආදායම් මට්ටම් ඉහළ යාමත් සමගම විනෝද සේවා සහ සංස්කෘතික කටයුතු මෙන්ම හෝටල් සහ ආපනශාලාවලින් සේවා භුක්ති විඳීමට දරන ලද පෞද්ගලික වියදමේ වර්ධනයක් පෙන්නුම් කරයි.** මෙහිදී, රට තුළ අඛණ්ඩව සාමකාමී වාතාවරණයක් පැවතීම 2013 වසර තුළ දී ද විනෝද සේවා, සංස්කෘතික සහ ක්‍රීඩා ක්‍රියාකාරකම් සඳහා වන වියදම් වර්ධනය වීමට හේතු වී ඇත. තවද, ජීවන රටාවන්හි ඇති වූ වෙනස්කම් සමග ආහාරපාන සැපයීම වැනි සේවා වඩාත් විධිමත් වීම හේතුවෙන් එම ආයතනවලින් සේවා ලබා ගැනීම සඳහා වැඩි වශයෙන් යොමු වීම සහ රට තුළ ගමනාගමන කටයුතු ඉහළ

**විශේෂ සටහන 3**

## ගෝලීය දර්ශක කෙරෙහි විමසුමක්

ගෝලීය දර්ශක මගින් ලෝකයේ රටවල් ජාත්‍යන්තර තරගකාරිත්වය, ව්‍යාපාර පවත්වා ගෙන යෑමේ පහසුව, දූෂණය, ආර්ථික ස්වාධීනත්වය, නීතියේ ආධිපත්‍යය, රජයේ ක්‍රියාකාරිත්වයෙහි සාධනීය බව, දේශපාලන ස්ථාවරත්වය, අදහස් ප්‍රකාශනය සහ වගකීම් සහගත බව, ව්‍යවස්ථාමය ගුණාත්මකභාවය වැනි විවිධ ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ශ්‍රේණිගත කිරීම් සිදු කරනු ලබයි. බොහෝ පාර්ශ්වයන් විසින් ආර්ථිකය හා සම්බන්ධ තීරණ ගැනීමේ දී මෙම දර්ශක මගින් සපයන තොරතුරු සැලකිල්ලට ගන්නා බැවින්, රටක ආර්ථික අභිවෘද්ධිය ළඟා කර ගැනීමේ දී මෙම ශ්‍රේණිගත කිරීම් මගින් විශාල බලපෑමක් සිදු කෙරෙන බව පෙනී යයි. විශේෂයෙන්ම, ආයෝජකයින් විසින් වෙනත් රටක ව්‍යාපාර ගනුදෙනු ආරම්භ කිරීමට ප්‍රථම මෙම ශ්‍රේණිගත කිරීම් සැලකිල්ලට ගනු ලැබීම ද දැකිය හැක. තවද, ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමේ ආයතන, ජාත්‍යන්තර ආධාර සපයන ආයතන සහ ඒ ඒ රටවල රජයන් විසින් ද රටක අභ්‍යන්තර තත්ත්වය පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීමට මෙන්ම රටවල් සංසන්දනය කිරීමටත් මෙම දර්ශක යොදා ගනු ලබයි.

### ගෝලීය දර්ශක සම්පාදනය

සාමාන්‍යයෙන්, මෙම දර්ශක සම්පාදනය කිරීමේ කටයුතු රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය අංශයේ ආයතන මගින් සිදු කෙරේ. මෙම දර්ශක සම්පාදක ආයතන විසින් ඒ සඳහා අවශ්‍ය තොරතුරු, දත්ත මූලාශ්‍ර කිහිපයක සංකලනයක් තුළින් උකහා ගනු ලබයි. එම දත්ත මූලාශ්‍රයන් අතර එම ආයතන විසින්ම සිදු කරන සමීක්ෂණ හෝ වෙනත් ආයතන හෝ පුද්ගලයන් මගින් පවත්වන්නා වූ සමීක්ෂණ, ව්‍යාපාර අවදානම් ශ්‍රේණිගත කිරීමේ ආයතන මගින් කරනු ලබන්නා වූ රටවල් පිළිබඳ ඇගයීම්, වාණිජ ව්‍යාපාරික තොරතුරු සපයන්නන්, අනෙකුත් රාජ්‍ය නොවන සංවිධාන, චින්තන සංචිතයන් (Think Tanks) හා බහුපාර්ශ්වීය ආධාර සපයන ආයතන, අදාළ ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥයන්ගේ අදහස් සහ අනෙකුත් දර්ශකයන් මගින් ව්‍යුත්පන්න වන ශ්‍රේණිගත කිරීම් මගින් උකහා ගනු ලබන තොරතුරු මෙන්ම ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ආයතනයන්හි දත්ත සංචිතවලින් ලබා ගන්නා ලද ඒ ඒ රටවල්වල ද්විතීයික සාර්ව ආර්ථික දත්තයන් පිළිබඳ තොරතුරු ද වේ. මෙම දර්ශකයන් අතර ද අන්තර් සම්බන්ධතා පවතින අතර ඇතැම් දර්ශකයන්ගෙන් නිරුක්ත කර ගන්නා අගයන් වෙනත් දර්ශක සම්පාදනයේ දී යොදා ගන්නා අවස්ථා ද දක්නට ලැබෙයි. මෙලෙස උකහාගත් තොරතුරු එකිනෙක සම්බන්ධ කොට උප දර්ශක කිහිපයකින් යුත් එක් දර්ශකයක් බවට පත් කෙරෙන අතර ඇතැම් අවස්ථාවන්හි දී ඒ ඒ දර්ශකයට යෝග්‍ය වූ බර තැබීම් මෙන්ම සුවිශේෂී ක්‍රමවේදයන් ද භාවිතා කරනු ලබයි.

### ගෝලීය දර්ශක සම්පාදනය සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටළු

මෙම ඇතැම් දර්ශක සම්පාදනය සංජානනයන් (Perceptions) මත පදනම් වුවද, මෙසේ සංජානන භාවිතයෙහි වලංගුභාවය බොහෝ විට විවාදයට තුඩු දෙන කරුණකි. සංජානන ස්වභාවයෙන් ම පුද්ගලබද්ධ සංකල්පයක් වන අතර, එමගින් පුද්ගලිකත්වය සහ සංස්කෘතිකමය නැඹුරුව ද පිළිබිඹු කරයි. උදාහරණයක් ලෙස 'ගෝලීය තරගකාරිත්ව දර්ශකයෙහි' (Global Competitiveness Index) සම්පාදනය ප්‍රධාන වශයෙන් පදනම් වී ඇත්තේ ව්‍යාපාරික අංශයේ විධායක නිලධාරීන් නියැදියකගේ සංජානනයන් මත පදනම් වූ 'විධායක නිලධාරීන්ගේ මතය පිළිබඳ සමීක්ෂණය' මතය. 2012-2013 ගෝලීය තරගකාරිත්ව වාර්තාව පවසා ඇති ආකාරයට 2012 වසරේ දී ශ්‍රී ලංකාව සඳහා රැස් කළ සමීක්ෂණ දත්තයන් සහ 2011 වසරේ ප්‍රතිඵලයන් අතර සැලකිය යුතු අපගමනයක් දැකිය හැකිය. අනතුරුව, සිදු කරන ලද විශ්ලේෂණයේ දී අනාවරණය වී ඇත්තේ අදාළ දර්ශකයෙහි මෙම අපගමනය සාර්ව ආර්ථික දත්තයන් ද ඇතුළත් අනෙකුත් තොරතුරු සමග ද එකඟ නොවූ බවයි. තවද, රට තුළ මෑත කාලීනව සිදුවූ වර්ධනයන් මගින් ද මෙම සමීක්ෂණ ප්‍රතිඵලවල දැකිය හැකි වූ පුළුල් අපගමනය පැහැදිලි කිරීම සඳහා දායක වීමක් සිදු නොකෙරින. මේ හේතුවෙන්, 2012-2013 ගෝලීය තරගකාරිත්ව දර්ශකය ගණනය කිරීමේ දී මෙම සමීක්ෂණයෙන් ලද තොරතුරු භාවිතා කිරීමෙන් වැලකී සිටින ලද අතර, එය සංජානන සමීක්ෂණයන්හි වලංගුභාවය හා විශ්වාසනීයත්වය පිළිබඳ ගැටලු මතු කරයි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් (Transparency International) ආයතනය විසින් සම්පාදනය කරනු ලබන දූෂණ පිළිබඳ සංජානන දර්ශකය (Corruption Perceptions Index) මුළුමනින්ම සංජානනයන් මත පදනම් ව ඇත. සංජානනයන් භාවිතය පිළිබඳව පක්ෂපාතී විවාදයන් ඉස්මතු කරන තර්කය වනුයේ නීත්‍යානුකූලව තහනම් කොට ඇති දූෂණය වැනි සංකල්ප බොහෝ දුරට සැඟවුණු ක්‍රියාකාරකමක් බවයි. එහෙයින්, සංජානනයන්ගෙන් හැර වෙනත් විධික්‍රම මගින් එය නිමානය කිරීම දුෂ්කර කටයුත්තක් බවට කරුණු ගෙනහැර දක්වනු ලබයි. එසේ වුවත්, දූෂණ පිළිබඳ සංජානන දර්ශකය සඳහා යොදා ගන්නා දත්ත මූලාශ්‍රයක් වන බර්ටල්ස්මාන් පදනමේ

පරිණාමන දර්ශකය (Bertlesmann Foundation Transformation Index) එක් විශේෂඥයකුගේ ඇගයුමක් තවත් විශේෂඥයකුගේ ස්වාධීන පරීක්ෂාවට ලක් කර පිළියෙළ කරනු ලබන දර්ශකයක් බව සැලකිල්ලට ගත යුතුය. මෙසේ සමස්ත රටක් නිරූපණය කිරීම සඳහා තනි පුද්ගලයකුගේ විනිශ්චයක් යොදා ගැනීම මතභේද සහගතය. එසේම, ආර්ථික ස්වාධීනත්ව දර්ශකයෙහි ඇතැම් විචල්‍යයන්හි අගයන් තීරණය කිරීමේ දී, විවිධ සංවිධාන, ප්‍රවෘත්ති හා සඟරා ලිපි මගින් ලබා ගන්නා ද්විතීයික දත්ත මූලාශ්‍ර මත පදනම් වූ ගුණාත්මක ඇගැයුමක් සමගම පවතින සාර්ව ආර්ථික දත්තයන් මත පදනම් වූ ප්‍රමාණාත්මක ඇගයීම්වල ද සංකලනයක් සැලකිල්ලට ගනු ලබයි. මෙවැනි දර්ශක සඳහා අදාළ දත්ත ලබා ගැනීමේ දී දේශීය නියෝජිතායතන සම්බන්ධ කරගනු වෙනුවට ද්විතීයික දත්ත උකහා ගැනීමට බාහිර මූලාශ්‍රයන් මත වැඩි වශයෙන් රඳා පැවතීම හේතුවෙන් මෙම දර්ශක පිළියෙළ කිරීමට භාවිතා කරනු ලබන දත්තවල විෂමතාවයන් තිබිය හැකි අතරම අදාළ දර්ශකය සම්පාදනය කිරීමේ දී සලකන ලද කාලපරිච්ඡේදය තුළ පැවති ආසන්නතම දත්ත යොදා නොගැනීම ද සිදු විය හැකිය.

**ඉදිරි ක්‍රියාමාර්ග**

විවිධ මතවාද ඉස්මතු වුවද, මෙම දර්ශක බොහොමයක්ම ගෝලීය සන්දර්භය තුළ බොහෝ දුරට තහවුරු ව ඇති හෙයින් මෙම දර්ශක සම්බන්ධයෙන් තම රටේ ස්ථානය වර්ධනය කර ගැනීමෙහි ලා අදාළ රටවල් විසින් සුවිශේෂී අවධානයක් යොමු කළ යුතුව ඇත. මෙම දර්ශකයන්හි හරය හඳුනා ගැනීම සඳහා, එනම් දත්ත මූලාශ්‍රයන් හෝ එම දත්ත සපයන්නන් හඳුනා ගැනීම, පළමු පියවර ලෙස සැලකිය හැකි අතර, ඉන් අනතුරුව වැඩිදියුණු කළ හැකි ක්ෂේත්‍රයන් හඳුනා ගැනීමට මෙම දර්ශක සම්පාදකයන් සමග අඛණ්ඩ සංවාදයෙහි නිරත වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ද ගැටළු සහගත ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමට ද ගෝලීය සම්මතයන්ගෙන් දැකිය හැකි වූ අපගමනයන් සඳහා පැහැදිලි කිරීම් සිදු කිරීමට ද ඉඩප්‍රස්ථා ලබාගත යුතුය. මෙවැනි ක්‍රියාමාර්ගයක් නිසැකවම ඒ ඒ දර්ශකයන්හි ශ්‍රී ලංකාව ලබා ඇති අගයන් වර්ධනය කර ගැනීමට ඉවහල් වනු ඇත. ඒ අතරතුරදී, මෙම දර්ශක සම්පාදනයෙහි දී යොදාගත් කරුණු පිළිබඳව දෝෂ හඳුනා ගත්තේ වී නම් ඒවා ද අදාළ ආයතනයන් සමග සාකච්ඡා කිරීමට හැකියාව ඇති අතර අවැසි අවස්ථාවන්හි දී යාවත්කාලීන තොරතුරු සැපයීම ද සිදු කළ හැක. එසේම, අසම්පූර්ණ දත්ත මූලාශ්‍රයන් වෙනුවට විශ්වසනීය අතිරේක දත්ත මූලාශ්‍රයන් යෝජනා කිරීම මගින් සම්පාදකයන්හට ද එම දත්තයන් සම්පාදන ක්‍රියාවලියට අන්තර්ගත කළ හැකි වනු ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව දැනටමත් මෙම ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත. උදාහරණයක් ලෙස, ව්‍යාපාරික අංශයේ විධායක නිලධාරීන්ගේ සංජානනයන් පිළිබඳව වැටහීමක් ලබා ගැනීම සඳහා ව්‍යාපාරික ප්‍රජාව අතර ස්වාධීන සමීක්ෂණයක් පැවැත්වීමේ වැදගත්කම ශ්‍රී ලංකා මහ බැංකුව හඳුනා ගෙන ඇත. මෙම සමීක්ෂණය, ගෝලීය තරගකාරිත්ව දර්ශකය සම්පාදනයේ දී ප්‍රාථමික දත්ත මූලාශ්‍රය ලෙස යොදා ගන්නා සමීක්ෂණයට සමාන වන අතර, මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල අනෙකුත් දර්ශක කිහිපයක් ද තම දර්ශක සම්පාදනය සඳහා අදාළ තොරතුරු උකහා ගැනීමට මූලාශ්‍රයක් ලෙස භාවිතා කරයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙම වෑයමෙහි මූලික අරමුණ වන්නේ ගෝලීය තරගකාරිත්ව දර්ශකයේ ශ්‍රී ලංකාවේ අගය වර්ධනය කිරීම සඳහා, රටේ සමස්ත තරගකාරිත්වය ඉහළ නැංවීමට වැඩිදියුණු කළ යුතු හෝ ප්‍රතිපත්ති සංශෝධනයන් අවැසි ක්ෂේත්‍රයන් හඳුනා ගැනීමයි. තවද, අනෙකුත් දර්ශක කිහිපයක්ම සැකසීමට දත්ත මූලාශ්‍රයක් ලෙස යොදා ගන්නා ලෝක බැංකුව විසින් සම්පාදනය කරනු ලබන ව්‍යාපාර පවත්වා ගෙන යෑම ශ්‍රේණිගත කිරීමෙහි ශ්‍රී ලංකාවේ තත්ත්වය නිරීක්ෂණය සඳහා මේ වනවිට ශ්‍රී ලංකා මහ බැංකුව ද සම්බන්ධ වී සිටී. මෙහිදී ශ්‍රී ලංකා මහ බැංකුව, දර්ශක අගයන් සම්පාදනයේ දී යොදා ගන්නා විචල්‍යයන් සඳහා දත්ත සපයන විවිධ පාර්ශ්වයන් සහ ලෝක බැංකුව අතර පහසුකම් සැලසීමේ පාර්ශ්වය ලෙස ක්‍රියා කරයි. ඒ අනුව, කාලීන හා නිරවද්‍ය තොරතුරු සැපයීම ද වඩාත් ඉහළ අගයක් ලබා ගැනීම සඳහා වැඩිදියුණු කළ හැකි ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම මෙන්ම විශේෂයෙන්ම අවැසි ක්‍රියාමාර්ග කඩිනම් කිරීම සඳහා අදාළ ආයතනයන් ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් දිරිගැන්වීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව පහසුකම් සැලසීමේ භූමිකාව ලෙස කටයුතු කිරීම මගින් සම්පාදක ආයතනය සහ අදාළ අනෙකුත් පාර්ශ්වයන් හට හමුවී සාකච්ඡා කිරීම සඳහා වේදිකාවක් සැපයීම, සිදු කරයි.

යාමත් සමගම නවාතැන් සැපයීමේ සේවා සඳහා ඇති වූ ඉල්ලුම ද මෙම ප්‍රසාරණය කෙරෙහි දායක වී ඇත. ඒ අනුව, 2013 වසර තුළ දී පෞද්ගලික පරිභෝජන වියදම කෙරෙහි මෙම අංශයන්ගේ දායකත්වය පිළිවෙළින් සියයට 1.9 ක් සහ සියයට 2.0 ක් විය.

**රාජ්‍ය අංශයේ වියදම් ද 2012 වසරේ වාර්තා කළ සියයට 5.6 ක වර්ධනය හා සැසඳීමේ දී සියයට 11.3 කින් ප්‍රසාරණය විය.** විශේෂයෙන්ම, වැටුප් හා වේතන සඳහා වූ වියදමෙහි ඉහළ යාම මෙම වර්ධනයට දායක විය. මෙහිදී මසකට රුපියල් 750 ක අවමයකට හා රුපියල් 2,500 ක උපරිමයකට යටත්ව මූලික වැටුපෙන් සියයට 5 ක විශේෂ දීමනාවක් මෙන්ම රුපියල් 750 ක ජීවන වියදම් දීමනාවක් ද රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා ලබා දුන් අතර, උපාධිධාරී පුහුණුවන්නන් ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීම ද වසර තුළ රාජ්‍ය අංශයේ පරිභෝජන වියදම ඉහළ යාමට හේතු විය.


මේ අතර, වෙනත් භාණ්ඩ හා සේවා සඳහා වූ රාජ්‍ය අංශයේ වර්තන වියදම් 2013 වසර තුළ දී පහත වැටුණි. තවද, ඉන්ධන, විදුලිය, ජලය හා ප්‍රවාහන වියදම් සඳහා වූ රාජ්‍ය අංශයේ වැය කිරීම් සහ අතිකාල ගෙවීම් වඩා විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කිරීම තුළින් අයවැය ප්‍රතිපාදන සීමාවන් තුළ අදාළ වර්තන වියදම් පවත්වා ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලදී.

### ආයෝජන

**ආර්ථික වර්ධනය අඛණ්ඩව පවත්වා ගෙන යාම කෙරෙහි බලපාන ප්‍රධාන උත්තේජකයක් වන ආයෝජන, 2012 වසරේ දී වාර්තා කළ සියයට 18.3 ක වර්ධනයට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 10.7 කින් වර්ධනය වී ඇත.** මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් ආයෝජන සඳහා ඉහළ දායකත්වයක් දක්වනු ලබන ඉදිකිරීම් කටයුතුවල ප්‍රසාරණය හේතු විය. තවද, නේවාසික කටයුතු සඳහා මෙන්ම යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන් ද ඇතුළත් අනෙකුත් ඉදිකිරීම් කටයුතු යන දෙඅංශයෙහිම ආයෝජන මෙම වර්ධනය සඳහා දායක විය. ඒ අනුව, 2013 වසරේ ආයෝජන සඳහා වූ වියදම රුපියල් බිලියන 2,565 ක් ලෙසට ඇස්තමේන්තු කොට ඇති අතර, එය ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස 2012 වසරේ දී පැවැති සියයට 30.6 ක අගයට සාපේක්ෂව 2013 දී සියයට 29.6 ක අගයක් වාර්තා කර ඇත. මේ අතර, ආයෝජන වියදම 2013 වසර තුළ දී මූර්ත වශයෙන් සියයට 9.9 ක වර්ධනයක් පෙන්නුම් කළේය. දැනට පවත්වා ගෙන යනු ලබන ලිහිල් මුදල් ප්‍රතිපත්තියේ පූර්ණ බලපෑම ආර්ථිකය තුළට සම්ප්‍රේෂණය වෙමින් පවතින අතර පොලී අනුපාත සාපේක්ෂව අඩු මට්ටමක පැවැතීමට ලිහිල් මුදල් ප්‍රතිපත්තිය හේතු වී ඇති බැවින් පෞද්ගලික අංශයේ ණය තවදුරටත් වර්ධනය වීමත් සමග රටෙහි ආයෝජන ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සම්පත් ඉහළ යාමක් දක්නට ලැබෙන අතර, මෙම තත්ත්වය ඉදිරියේ දී තවදුරටත් වර්ධනය වනු ඇත.

**සමස්ත ආයෝජන සඳහා සියයට 76.8 ක දායකත්වයක් සපයනු ලබන පෞද්ගලික අංශයේ ආයෝජන 2013 වසරේ දී සියයට 9.7 කින් වර්ධනය විය.** විදේශ ආයෝජන ද ඇතුළත් පෞද්ගලික අංශයේ ආයෝජනයන්හි වර්ධනය අඛණ්ඩව පවත්වා ගැනීම තුළින් ආයෝජක විශ්වාසය පිළිබිඹු විය. ආයෝජන ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් 2013 වසරේ දී පවත්වා ගෙන යනු ලැබූ ලිහිල් මුදල් ප්‍රතිපත්තිය පෞද්ගලික අංශයේ ආයෝජන ඉහළ යාමට තවදුරටත් දායක විය. එමෙන්ම, නිවාස, මහල් නිවාස ව්‍යාපෘති මෙන්ම මහා පරිමාණ හෝටල් සංවර්ධන ව්‍යාපෘතීන් වැනි ක්ෂේත්‍ර සඳහා පෞද්ගලික අංශයේ ඉහළ මට්ටමක දායකත්වයක් දක්නට ලැබුණි. මේ බව වසර තුළ දී

**2.6 රූප සටහන** ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්තවල සෘජු විදේශ ආයෝජන (එ.ජ.ඩොලර් මිලියන)




ආර්ථිකය තුළට ගලා ගිය ආයෝජන හා සම්බන්ධ අමුද්‍රව්‍ය වන ආනයනය කරන ලද යන්ත්‍රසූත්‍ර සහ උපකරණ මෙන්ම ගොඩනැගිලි ද්‍රව්‍ය පරිමාවන්ගෙන් ද මනාව පිළිබිඹු වෙයි.

**යටිතල පහසුකම්, කර්මාන්ත සහ සේවා යන අංශයන් වෙත ලැබුණු විදේශ ලැබීම් හේතුවෙන් 2013 වසරේ දී, ණය ද ඇතුළත්ව ලද සෘජු විදේශීය ආයෝජන ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 1,391 ක් දක්වා වැඩි විය.** යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 787 ක් වූ අතර එය එක් අංශයක් සඳහා ලද ඉහළ ම ආයෝජන ප්‍රමාණයයි. මෙහි දී නිවාස දේපොළ සංවර්ධනය සහ කඩසාප්පු කාර්යාල උප අංශය සඳහා වූ සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය සැලකිය යුතු ලෙසින් ඉහළ ගොස් ඇත. අනෙකුත් විශාල සෘජු ආයෝජන ප්‍රමාණයන් ලද උප අංශයන් වූයේ, දුරකථන හා විදුලි සංදේශ ජාල සහ වරාය බහාලුම් පර්යන්ත උප අංශයන්ය. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත, රසායන ද්‍රව්‍ය, ගල් අඟුරු, ඛනිජ තෙල්, ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත සහ රබර් නිෂ්පාදිත උප අංශයන් සඳහා ලද සෘජු විදේශ ආයෝජන ඉහළ වර්ධනයන් පෙන්නුම් කළ අතර, නිෂ්පාදන කර්මාන්ත අංශය වෙත සෘජු විදේශ ආයෝජනවලින් සියයට 25 ට වඩා වැඩි ප්‍රමාණයක් ලැබී ඇත. ඒ අනුව, 2013 වසරේ දී නිෂ්පාදන කර්මාන්ත අංශය වෙත සෘජු විදේශ ආයෝජන ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 359.8 ක් දක්වා සියයට 16.9 කින් වර්ධනය විය. 2013 වසරේ දී සේවා අංශය වෙත වූ සෘජු විදේශ ආයෝජන ලැබීම් ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 236 ක් විය. ආයෝජන සඳහා දායක වූ රටවල් අනුව වර්ග කිරීමේ දී චීනය (එ.ජ. ඩොලර් මිලියන 240), මලයාසියාව (එ.ජ. ඩොලර් මිලියන 176), හොංකොං (එ.ජ. ඩොලර් මිලියන 139), නෙදර්ලන්තය (එ.ජ. ඩොලර් මිලියන 118), සිංගප්පූරුව (එ.ජ. ඩොලර් මිලියන 112) සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය (එ.ජ. ඩොලර්

**2.10 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ ව්‍යවසායන්හි ආයෝජන සහ සේවා නියුක්තිය**

| | ව්‍යාපෘති සංඛ්‍යාව | | ඇස්තමේන්තුගත ආයෝජන (රු. මිලියන) | | | | | | සේවා නියුක්තිය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2012 (අ) | 2013 (ආ) | 2012 (අ) | | | 2013 (ආ) | | | 2012 (අ) | 2013 (ආ) |
| | | | විදේශීය | දේශීය | එකතුව | විදේශීය | දේශීය | එකතුව | | |
| **ආයෝජන මණ්ඩලය (1978 අංක 4 දරන පනත යටතේ)** | | | | | | | | | | |
| අනුමත කළ ව්‍යාපෘති | 269 | 205 | 471,149 | 235,799 | 706,948 | 288,436 | 213,076 | 501,512 | 58,458 | 32,405 |
| 17 වන වගන්තිය යටතේ (ඇ) | 237 | 169 | 467,505 | 235,450 | 702,955 | 284,286 | 212,846 | 497,132 | 56,288 | 30,424 |
| 16 වන වගන්තිය යටතේ | 32 | 36 | 3,644 | 348 | 3,992 | 4,150 | 230 | 4,380 | 2,170 | 1,981 |
| 17 වන වගන්තිය යටතේ ගිවිසගත් ව්‍යාපෘති (ඇ) | 162 | 138 | 273,008 | 132,386 | 405,394 | 318,527 | 211,440 | 529,967 | 37,927 | 35,724 |
| 17 වන වගන්තිය යටතේ දැනට කර ඇති ආයෝජන (ඈ) (ඉ) | 2,045 | 1,997 | 828,313 | 452,524 | 1,280,837 | 958,958 | 553,063 | 1,512,021 | ලැ.නො. | ලැ.නො. |
| වාණිජ කටයුතු වල නිරතවූ (ඈ) | 2,704 | 2,656 | 323,958 | 4,024,830 | 4,348,788 | 338,059 | 4,040,816 | 4,378,876 | 414,436 | 397,295 |
| 17 වන වගන්තිය යටතේ (ඇ) | 1,998 | 1,944 | 302,517 | 4,014,708 | 4,317,224 | 316,381 | 4,030,601 | 4,346,981 | 381,081 | 363,789 |
| 16 වන වගන්තිය යටතේ | 706 | 712 | 21,441 | 10,122 | 31,564 | 21,678 | 10,216 | 31,894 | 33,355 | 33,506 |
| **කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය** ලියාපදිංචි වූ ව්‍යාපෘති (ඈ) | 2,048 | 2,100 | - | - | 153,303 | - | - | 202,219 | 303,762 | 305,161 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පුළුල් කළ ව්‍යාපෘතීන් ද ඇතුළත්ව
(ඈ) වර්ෂය අවසානයේ සමුච්චිත අගය
(ඉ) සමුච්චිත සැබෑ ආයෝජන අගයන් දක්වා ඇත

මූලයන්: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

සටහන: ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අනුමත කළ හා ගිවිසගත් ව්‍යාපෘතීන්, ආයෝජන උපරිමයන් හෝ වෙනත් නම් කරන ලද විශේෂිත අවශ්‍යතාවන්ට යටත්ව තීරුබදු සහ විනිමය පාලන විධිවිධාන වලින් නිදහස් වේ.

මිලියන 111) යන රටවල් 2013 වසරේ දී ඉහළ ම සෘජු විදේශ ආයෝජන ප්‍රමාණයක් සඳහා දායක වූ රටවල් විය.

**ආයෝජන මණ්ඩල පනතේ 17 සහ 16 වන වගන්ති යටතේ අනුමත කළ ව්‍යාපෘති සඳහා ලද සමස්ත ඇස්තමේන්තුගත දේශීය සහ විදේශීය ආයෝජන ප්‍රමාණය රුපියල් බිලියන 502 කි.** රුපියල් බිලියන 385 ක් වූ සේවා අංශයේ දායකත්වය සමස්ත ඇස්තමේන්තුගත ආයෝජනයන්ගෙන් සියයට 75 ට වඩා වැඩි ප්‍රමාණයක් විය. නිෂ්පාදන කර්මාන්ත අංශයේ ඉහළ ම දායකත්වයක් සැපයූ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත උප අංශයේ ආයෝජන ප්‍රමාණය රුපියල් බිලියන 27 කි. ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ගිවිසගත් ව්‍යාපෘති, 2013 වසරේ දී රුපියල් බිලියන 530 ක ඇස්තමේන්තුගත ආයෝජන අගයක් වාර්තා කළේය. 2013 වසර අවසාන වනවිට ආයෝජන මණ්ඩල පනතේ 17 සහ 16 වන වගන්ති යටතේ වාණිජ කටයුතුවල නිරත වූ ව්‍යාපෘතිවල ඇස්තමේන්තුගත සමුච්චිත ආයෝජන වටිනාකම රුපියල් බිලියන 4,379 ක් විය. 2013 වසරේ දී ව්‍යාපෘතීන් විසින් දැනට කර ඇති ආයෝජනයන් ප්‍රමාණය රුපියල් බිලියන 1,512 ක් විය. මේ අතර, 2013 වසරේ දී කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී ඇති සමාගම් සංඛ්‍යාව 52 ක් වන අතර, එම සමාගම්වල ඇස්තමේන්තුගත ආයෝජන ප්‍රමාණය රුපියල් බිලියන 49 කි.

**රාජ්‍ය අංශයෙහි ආයෝජන යහපත් මට්ටමක පවත්වා ගැනීම සඳහා රජයේ ඇති කැපවීම පිළිබිඹු කරමින්, රාජ්‍ය ආයෝජන 2013 වසරේ දී සියයට 13.9 කින් වර්ධනය වූ අතර, එම දායකත්වය සමස්ත ආයෝජන ප්‍රමාණයෙන් සියයට 23.2 ක් විය.** මෙම රාජ්‍ය අංශයේ ආයෝජන වැඩසටහන රටේ අනාගත ආර්ථික වර්ධනය සඳහා පදනම සපයන පංච කේන්ද්‍ර සංකල්පයන් සමග අනුගත වෙමින් ක්‍රියාත්මක වනු දක්නට ලැබුණි. තවද, රාජ්‍ය අංශයේ ආයෝජන රටෙහි ආර්ථික මෙන්ම සමාජයීය සංවර්ධන අංශ කෙරෙහි ද යොමු විය. මෙම ආර්ථික සේවා සඳහා වූ රාජ්‍ය අංශයේ ආයෝජන ප්‍රධාන වශයෙන් ජාතික මට්ටමේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා යොමු විය. මෙහිදී, මහාමාර්ග, දුම්රිය මාර්ග, වරායයන්, බලශක්ති, ජල සම්පාදනය සහ වාරිමාර්ග යන ක්ෂේත්‍රයන් කෙරෙහි රාජ්‍ය ආයෝජනවලින් සැලකිය යුතු ප්‍රමාණයක් වෙන් කෙරිණි. තවද, 'ගම නැගුම' සහ 'මග නැගුම' වැනි ව්‍යාපෘතීන්


යටතේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක වන ලදී. මේ අතර, 2013 වසර තුළ දී සමාජයීය යටිතල පහසුකම් සඳහා වූ පිරිවැය, මූලික වශයෙන් අධ්‍යාපන සහ සෞඛ්‍යය යන අංශයන්හි ප්‍රාග්ධන පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා යොමු කරන ලදී.

### පවත්නා සම්පත් සහ උපයෝජනය


**ආර්ථිකය තුළින් උත්පාදනය වූ ඉහළ ඉල්ලුම පිළිබිඹු කරමින් 2013 වසර තුළ දී ආර්ථිකය සතු සමස්ත සම්පත් ප්‍රමාණය නාමික වශයෙන් 2012 වසරේ දී වාර්තා කළ සියයට 14.9 ට සාපේක්ෂව, 2013 දී සියයට 10.7 කින් රුපියල් බිලියන 11,450 ක් දක්වා අඛණ්ඩව ප්‍රසාරණය විය.** ද.දේ.නි. මගින් ද පිළිබිඹු වූ පරිදි දේශීය සම්පත් ඉහළ යාම මෙම ප්‍රසාරණය කෙරෙහි ප්‍රධාන ලෙස දායක වූ අතර විදේශීය සම්පත් ද ආන්තික වශයෙන් වර්ධනය විය. කෙසේ වුවද, 2013 වසරේ දී දේශීය සහ විදේශීය සම්පත් දෙඅංශයම නාමික වශයෙන් සාපේක්ෂව අඩු වේගයකින් වර්ධනය වූ අතර ආනයනවල සැලකිය යුතු පසුබෑමක් දැකිය හැකි විය. මෙමගින්, දේශීය සම්පත්වල දායකත්වය ඉහළ යාම ආර්ථිකය තුළ පවත්නා ඉල්ලුම අඛණ්ඩව පවත්වා ගැනීමට උපකාරී වූ බව පෙනී යයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස සම්පත් උපයෝජනයෙහි සියයට 75.8 ක් සඳහා දේශීය සම්පත් දායක වූ අතර ආනයනික භාණ්ඩ හා සේවා සෙසු දායකත්වය සපයන ලදී. තවද, ආර්ථිකය තුළ සමස්ත මිල මට්ටම් අඩු මට්ටමක පැවැතීම පිළිබිඹු කරමින් සම්පත් උපයෝජනය 2012 වසරේ දී වාර්තා කළ සියයට 4.6 ක මූර්ත වර්ධනයට සාපේක්ෂව 2013 වසරේ දී මූර්ත වශයෙන් සියයට 5.1 ක වර්ධනයක් පෙන්නුම් කළේය.

**2.7 රූප සටහන — 2013 වර්ෂයේ ආර්ථිකය (පවත්නා මිල යටතේ)**

භාණ්ඩ හා සේවා සැපයුම (රුපියල් බිලියන 11,450)




භාණ්ඩ හා සේවා සඳහා ඉල්ලුම (රුපියල් බිලියන 11,450)




**දේශීය සහ විදේශීය සම්පත් දෙඅංශයෙහිම සම්පත් ප්‍රවාහය, ආර්ථිකයේ පරිභෝජන, ආයෝජන සහ අපනයන අරමුණු සඳහා උපයෝජනය කර ගනු ලැබේ.** 2013 වසර තුළ දී උපයෝජනයෙහි ඉහළම වර්ධනය, භාණ්ඩ හා සේවා අපනයන අංශය විසින් වාර්තා කර ඇත. මේ හේතුවෙන් විශේෂයෙන්ම වසරේ දෙවන භාගය තුළ ඉහළ විදේශ ඉල්ලුමක් සනිටුහන් කරමින් සමස්ත සම්පත් උපයෝජනයෙහි අපනයන දායකත්වය සියයට 17.0 ක් දක්වා ප්‍රසාරණය විය. මේ අතරතුර දී, සම්පත් උපයෝජනය සඳහා ආයෝජනයෙහි දායකත්වය නොවෙනස්ව පැවැති අතර, විදේශ ඉල්ලුමෙහි ඉහළ වර්ධනය සහ ප්‍රාග්ධන සම්පාදන කටයුතු සඳහා සම්පත් උපයෝජනය ඉහළ යාම පිළිබිඹු කරමින් වසර තුළ දී පරිභෝජනයෙහි දායකත්වය ආන්තික ලෙස පහත වැටුණි.

**2.11 සංඛ්‍යා සටහන — සම්පත් සංයුතිය සහ උපයෝජනය (පවත්නා වෙළෙඳ මිල අනුව)**

| අයිතමය | ප්‍රතිශතාත්මක දායකත්වය | | ප්‍රතිශතාත්මක වර්ධනය | |
|---|---|---|---|---|
| | 2012 (අ) | 2013 (ආ) | 2012 (අ) | 2013 (ආ) |
| 1. සම්පත් | | | | |
| වෙළෙඳ මිල අනුව ද.දේ.නි. | 73.3 | 75.8 | 15.8 | 14.5 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 26.7 | 24.2 | 12.4 | 0.3 |
| **එකතුව** | **100.0** | **100.0** | **14.9** | **10.7** |
| 2. උපයෝජනය | | | | |
| පරිභෝජනය | 60.9 | 60.6 | 13.7 | 10.1 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 21.2 | 22.2 | 23.5 | 15.8 |
| පෞද්ගලික | 16.4 | 17.0 | 20.9 | 14.9 |
| රජය | 4.8 | 5.2 | 33.6 | 19.2 |
| තොග වෙනස්වීම් | 1.2 | 0.3 | -31.3 | -77.5 |
| භාණ්ඩ සහ සේවා අපනයන | 16.7 | 17.0 | 14.7 | 12.6 |
| **එකතුව** | **100.0** | **100.0** | **14.9** | **10.7** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2

ජාතික නිෂ්පාදිතය සහ වියදම

**2.12 සංඛ්‍යා සටහන** **පරිභෝජනය, ආයෝජන සහ ඉතිරිකිරීම් (පවත්නා වෙළෙඳ මිල අනුව)**

| අයිතමය | රුපියල් මිලියන | | ප්‍රතිශතක වෙනස | | ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|---|---|
| | 2012 (අ) | 2013 (ආ) | 2012 (අ) | 2013 (ආ) | 2012 (අ) | 2013 (ආ) |
| 1. වෙළෙඳ මිල අනුව ද.දේ.නි. | 7,578,554 | 8,673,870 | 15.8 | 14.5 | 100.0 | 100.0 |
| 2. පරිභෝජන වියදම | 6,295,894 | 6,934,816 | 13.7 | 10.1 | 83.1 | 80.0 |
| පෞද්ගලික | 5,274,451 | 5,797,525 | 15.5 | 9.9 | 69.6 | 66.8 |
| රජය | 1,021,443 | 1,137,291 | 5.6 | 11.3 | 13.5 | 13.1 |
| 3. ආයෝජන | 2,318,253 | 2,565,498 | 18.3 | 10.7 | 30.6 | 29.6 |
| පෞද්ගලික | 1,794,619 | 1,969,068 | 15.8 | 9.7 | 23.7 | 22.7 |
| රජය | 523,634 | 596,430 | 27.9 | 13.9 | 6.9 | 6.9 |
| 4. දේශීය ඉතුරුම් | 1,282,660 | 1,739,054 | 27.3 | 35.6 | 16.9 | 20.0 |
| පෞද්ගලික | 1,362,223 | 1,806,787 | 28.0 | 32.6 | 18.0 | 20.8 |
| රජය | -79,563 | -67,733 | -39.5 | 14.9 | -1.0 | -0.8 |
| 5. දේශීය ඉතුරුම්-ආයෝජන පරතරය | -1,035,593 | -826,444 | -8.8 | 20.2 | -13.7 | -9.5 |
| 6. විදේශීය ශුද්ධ සාධක ආදායම | -154,925 | -234,910 | -115.1 | -51.6 | -2.0 | -2.7 |
| 7. විදේශීය ශුද්ධ පෞද්ගලික වර්තන සංක්‍රාම | 688,613 | 728,679 | 34.2 | 5.8 | 9.1 | 8.4 |
| 8. ජාතික ඉතුරුම් | 1,816,348 | 2,232,823 | 25.4 | 22.9 | 24.0 | 25.7 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**සමස්ත සම්පත් සම්පාදනයෙහි දේශීය සම්පත් වලින් සිදු වූ දායකත්වය 2013 වසරේ දී ඉහළ ගියේය.** මෙම වර්ධනය කෙරෙහි ආර්ථිකයේ සියලුම ප්‍රධාන නිෂ්පාදන අංශ දායක විය. මේ අතර, 2013 වසර තුළ දී ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් සහ ප්‍රවාහන උප අංශවල ප්‍රසාරණය හේතු කොට ගෙන කර්මාන්ත සහ සේවා අංශ ද්විත්වයේම දායකත්වය එක් ප්‍රතිශතාංකයකින් පමණ ඉහළ ගියේය. දේශීය වශයෙන් සම්පත් සම්පාදන දායකත්වය ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස භාණ්ඩ හා සේවා ආනයන තුළින් පිළිබිඹු වන විදේශීය සම්පත් සම්පාදනය වසර තුළ දී ප්‍රතිශතාංක දෙකකින් පමණ පහත වැටුණි. තවද, විදේශීය සම්පත් දායකත්වයෙහි වූ පහත වැටීම විශේෂයෙන්ම භාණ්ඩ අංශයෙන් දක්නට ලැබුණු අතර එතුළින් සම්පත් සම්පාදනය කෙරෙහි දේශීය ආර්ථිකයේ ඇති නැඹුරුව ඉහළ යාම පිළිබිඹු කෙරේ.

## ඉතුරුම්

**2013 වසර තුළ දී දේශීය ඉතුරුම් සියයට 35.6 ක ප්‍රසාරණයක් වාර්තා කරමින් ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස සියයට 20.0 ක් දක්වා අඛණ්ඩව වර්ධනය විය.** මෙමගින්, 2012 වසරේ දී දක්නට ලැබුණු හිතකර වර්ධනය තවදුරටත් තහවුරු විය. දේශීය ඉතුරුම්හි දක්නට ලැබුණු මෙම වර්ධනය කෙරෙහි රාජ්‍ය අංශය මෙන්ම පෞද්ගලික අංශය ද දායක විය. 2013 වසර තුළ දී පෞද්ගලික ඉතුරුම්හි දක්නට ලැබුණු සාධනීය වර්ධනය සමගම රාජ්‍ය නිර්-ඉතුරුම්වල සිදු වූ පහත වැටීම, ආර්ථිකය තුළ ඉහළ දේශීය ඉතුරුම් මට්ටමක් පවත්වා ගැනීමට උපකාරී විය. මෙම දේශීය ඉතුරුම්හි වූ වර්ධනය 2013 වසර තුළ දී අපනයන හා සැසඳීමේ දී ආනයනයවල පැවැති මන්දගාමී වර්ධනය හේතුවෙන් වෙළෙඳ ගිණුමේ හිඟය අඩු වීම මගින් ද පිළිබිඹු විය.

**දේශීය ඉතුරුම්හි දක්නට ලැබුණු වර්ධන දායකත්වය සමග ජාතික ඉතුරුම් ද වර්ධනය විය.** ජාතික ඉතුරුම් සියයට 22.9 ක වර්ධනයක් වාර්තා කරමින් ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස සියයට 25.7 ක් දක්වා වර්ධනය විය. ජාතික ඉතුරුම්හි වූ මෙම ප්‍රසාරණයට, 2012 වසරේ දී මෙන්ම 2013 වසරේ දී සියයට 5.8 කින් වර්ධනය වූ පෞද්ගලික සංක්‍රාමයන්හි අඛණ්ඩ වර්ධනය හේතු විය. තවද, පුහුණු ශ්‍රමික සංක්‍රමණ ඉහළ යාම හේතුවෙන් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් ගලා ඒම ද වර්ධනය විය. මේ අතරතුර, ඉහළ පොලී ගෙවීම් හේතුවෙන් වි.ශු.සා.ආ. අඛණ්ඩව පහත වැටීමකට ලක් වීම ජාතික ඉතුරුම් වර්ධනය මන්දගාමී වීමට හේතු විය. තවද, 2012 වසරේ දී ද.දේ.නි. යෙන් සියයට 6.6 ක් වූ සම්පත් පරතරය 2013 වසරේ දී සියයට 3.8 ක් දක්වා අඛණ්ඩව අඩු විය. මෙසේ සම්පත් පරතරය අඩු වීම මගින් ශ්‍රී ලංකාව සිය විදේශ වර්තන ගිණුම සම්බන්ධයෙන් අත්කර ගත් අඛණ්ඩ වර්ධනය පෙන්නුම් කරයි.